සිසිල

සිනුවර සිංහල සාර සංග්‍රහය

බලන්නට නොව කියවන්නට ය!

Sisila Sinhala eMagazine

සිව්වෙනි වෙළුම – තුන්වෙනි කලාපය – නොවැම්බර් 2024 :: Volume 4 – Issue 3 – November 2024

මේ ඕස්ට්‍රේලියාවේ වසන්ත සමයයි.
නේක නේක මල් පිපී පරිසරය විවිධ වර්ණයෙන් අලංකාර වෙන සමයයි.
මේ පින්තූරයෙන් දැක්වෙන්නේ ඕස්ට්‍රේලියාවේ, නිව් සවුත් වේල්ස් ප්‍රාන්තයේ සිඩ්නි නගරයේ එක් වීදියක දම් පැහැති ජැකරැන්ඩා මල් පිපී ඇති ආකාරයයි. එක් කුඩා වීදියක එක රොත්තට මේ මල් පිපී ඇති ආකාර නරඹා, ඡායාරූපගත කරමින් සතුටෙන් කල් ගතකරන්නට මෙහි පැමිණෙන්නෝ බොහෝ ය.
ජැකරැන්ඩා යනු දකුණු ඇමරිකාවට ආවේනික ශාඛයක් වන නමුත් මේ වන ලෝකයේ බොහෝ ප්‍රදේශවලට පැතිර ගොස් ඇත.

ඡායාරූපය: රසික සූරියආරච්චි

නිව් සවුත් වේල්ස් හි සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදයේ ප්‍රකාශනයකි

Sisila electronic magazine is published and distributed by the Writers Guild of Sinhalese Cultural Forum of NSW, Australia.

sisila.sangarawa@gmail.com sisilamagazine.blogspot.com ISSN: 2653-2182

සිසිල - සිනුවර සිංහල සාර සංග්‍රහය

සිව්වෙනි වෙළුම – තුන්වෙනි කලාපය – නොවැම්බර් 2024 :: Volume 4 – Issue 3 – November 2024

සිසිල පෙළ ගැස්ම

ඉලෝන් මස්ක් සහ සිලෝන් මස්ක් ලා - නිහාල් රූපසිංහ

වීණාවී (කෙටිකතාව) - ඉන්දිකා තිලකුමාර

පුන් සඳ රැට ඇවිදින් - කරුණාසේන කහටපිටිය

බිරිඳ (පරිවර්තිත කෙටිකතාව) - පාලිත ගනේවත්ත

කොට ගවුම් සහ දිග ගවුම් - ප්‍රියන්ත ෆොන්සේකා

ඔටුණු කුමට ද? (කවි) - මහේෂා වජිරකාන්ති විජේසේකර

සෙනෙහස (නවකතාව) - දීපිකා ශ්‍රියානි සුන්ද්‍රා වඩුගේ

සැනසුම (කවි) - ඉන්දිකා තිලකුමාර

“ආරේ ගුණ නෑරේ” : ප්‍රවේණි විද්‍යාත්මක පැහැදිලි කිරීමක් - දයාරත්න වීරසේකර

කලියුගයේ වස් කාලය (කවි) - ආනන්ද ගුණතිලක

ගෙදර හැදුණු කොටියා (පරිවර්තිත කෙටිකතාව) - හෙල්මලී ගුණතිලක

දුෂ්මන්ත, කියන්න! (කවි) - රූපිකා ද සිල්වා

මගේ සීදේවි (කවි) - නලිනි ද සිල්වා

සිසිල හරස්පද ප්‍රහේලිකාව - මලී දිසානායක

අපට ලැබුණු පොත්

ඔක්තෝබර් 2024 සිසිල ප්‍රහේලිකා විසඳුම

පිනි කිනිත්තක් හැඩවෙලා (කවි) - අනුරුද්ධ වැලිගමගේ

“ලෝකෙන් උතුම් රට ලංකාවයි” හෙවත් “අපි තමයි හොඳට ම කළේ” - රසික සූරියආරච්චි

සංජීවයට දෙගමනක් (කෙටිකතාව) - සරත් සමරසේකර

අවසාන සුසුමේ :: ලෞකික version (කවි) - අසංක ලක්නාත

තුටු සඳ විල (කවි) - ඩී. අමරසිරි ගුණවර්ධන

චක්‍රය (කෙටිකතාව) - අනුෂ්ක තිලකරත්න

මාත් එක්ක මා විතරක්ම... (කවි) - තිමාලි ද සිල්වා

තාත්තේ! (කවි) - ජයන්ත මිහිඳුකුලසූරිය

මිහිරියේ දනිම් නුඹ එන බව (කවි) - චන්ද්‍රවංශ ඥානසේකර සහ නිර්නාමික

බුදු බණකින් තමයි ලොව මුල් පොත සැදුනේ (කවි) - නිමල් සේදර

මහජන නියෝජිත ගුණවත් (කවි) - කළණ දිසානායක

දැන්වත් නිවන්න (කවි) - රුවන්මලී දීපිකා කොඩිකාර

හිරු සැඳෑ සක්මන (කවි) - අමිතා පද්මකුමාරි

සිත සහ ගත (කවි) - රංජිත් කිරිඇල්ල

කිඹුලාවල: දියවන්නාව ජේන මායිමේ - අසංක ලක්නාථ

ගෑණුන්ගේ තන සහ සාහිත්‍යය - විදූෂක

සිසිල සකසුගෙන්

මේ “සිසිල” සඟරාව පියවර නගන්නේ අපේ සිව්වෙනි වසරේ තුන්වෙනි මාසයට ය. හුදෙක් සිංහල සාහිත්‍යයේ උන්නතිය සළකා ලේඛකයින්ට තම නිර්මාණ සහ ලේඛන එළිදක්වන්නට මාධ්‍යයක් ලබාදීම මෙන්ම පාඨකයින්ට හරවත් යමක් කියවීමේ අත්දැකීම ලබාදීමත් පිණිස කිසිදු මූල්‍යමය අරමුණකින් තොරව පවත්වාගෙන යන “සිසිල” සඟරාවට අප තබන හැම පියවරක් ම දිනුමකි.

“සිසිල” සඟරාව කියවන්න. ඔබේ සහෘදයින් අතර බෙදා හරින්න. සඟරාවේ පිටපත් කෙළින්ම ලබා ගැනීමට අවශ්‍ය අයට sisila.sangarawa@gmail.com ලිපිනයට විද්‍යුත් පණිවිඩයක් එවන්නැයි දැනුම් දෙන්න.

සඟරාව ගැන පොදුවේ ඔබේ අදහස් ද, සඟරාවේ අන්තර්ගතව ඇති ලිපි සහ නිර්මාණ පිළිබඳ ඔබේ සුවිශේෂී අදහස් ද, ඔබේ ලිපි, කෙටිකතා සහ කාව්‍ය නිර්මාණ ද එම ලිපිනයට ම අප වෙත එවිය හැක.

ඒ ඒ ලේඛකයින්ගේ ලිපි සහ නිර්මාණ පිළිබඳව පාඨක ඔබේ අදහස් ඔවුන්ට කෙළින් ම ඊ-මේල් මගින් දැනුම් දීමට ද හැක.

වෙබ් අඩවිය:
[sisilamagazine.blogspot.com]

ෆේස්බුක් පිටුව:
[www.facebook.com/SisilaMagazine]

ෆේස්බුක් කණ්ඩායම:
[www.facebook.com/groups/sisila]

ස්තුතියි.

- රසික සූරියආරච්චි,
සංස්කාරක, සිසිල මාසික සඟරාව

ඉලෝන් මස්ක් සහ සිලෝන් මස්ක් ලා

ඉලෝන් මස්ක් සපෝර්ට් කරන්නේත්
ජාතිවාදී ට්‍රම්ප්ට රිපබ්ලිකන් පක්ෂේ,
අලියා තමයි සලකුණ.
මතකද ජේ ආර් එකල රේගන්ට අලි පැටියෙක් දුන්නා?
ග්ලෝබල් සවුත් අලියෙක් ග්ලෝබල් නෝර්ත් අලි පාටියට.

කමලා ඩිමොක්‍රැටික් පක්ෂේ, ඊශ්‍රායල් යුද්දෙට සපෝට්,
හැබැයි කරදරයට පත් වෙච්ච අයට උදව්කරනවා.
රිපබ්ලිකන් එවුන් උදව් කරන්න බෑ කියනවා.
දෙගොල්ලම යුද්ධෙට, පලස්තීනුවන් මරන්න පස්සයි.
කවුද ඉතිං වඩා හොඳ?
අපිව කන්ෆියුස් වෙනවා.
උන් ඔක්කොම එකයි මල්ලි?

අපේ කොල්ලෝ #gotagohome කියලා
ගෝටාගෙ ගේ ළඟ ගිහිං කෑ ගහනකොට
කවුද එකෙක් ආමි සෙබලුන් ආ බස් එකකට ගිනි තිබ්බා.
හොඳ වෙලාවට අපේ සිලෝන් මස්ක් කොල්ලෙක්
වීඩියෝ එකක් ගත්තා.
සැලසුම්කරලා ඒ අපරාධය විරෝධතාකරුවන්ගෙ ඇඟට
දාන්නමයි පාහර වැඩේ කලේ.
අර තරුණයා වීඩියෝ එක නොගන්න
අරගලකරුවන්ට දෙනවා ලොවෙත් නැතිවෙන්න.
අරගලයක් එන්නෙ නෑ මේ සම්මජ්ජාතියේ!

අන්න ඒකයි මං අපේ තරුණ පරපුරට සිලෝන් මස්ක්ලා
කියලා කියන්නේ.
ලොකු ලොකු දේවල් නැතත් එක්ස්පයර්ඩ් සැට් එක
යවන්න, විශ්‍රාම යවන්න දායකත්වයක් දුන්නා, ඒක මරු.

පෝට්ටුවන්ස්, තමන් වටා තමන්ගේ ආරක්ෂාවට
ඉදිකර ගත් මහා උස පවුර කොච්චර උසද කියනවා නම්
එයින් එළියේ තමන්ට විරුද්ධව පෙළ ගැසෙන
සාමාන්‍ය ජනතාව සහ ඔවුන්ගේ දුක් ගැනවිලි,
විරෝධය දැක්කේ නෑ. දකින්න උවමනාවක් තිබුනේ නෑ.
තාප්පය උඩ හිටපු මුර බල්ලන්
තමන්ගේ කාර්යභාරය අමතක වී
බලයෙන් මත් වෙලා පිස්සු කෙලිනවා දැක්කෙත් නැහැ!
තාප්යේ චූටි චූටි හිල් තුළින් එළියේ සිටින දුකට පත් ජනතාව
තමන් විඳින සැප දකින බව, තමන්ව පිළිකුල් කරන බව
ඔවුන් දුටුවේ නෑ!
මේ මහා ප්‍රාකාරය ඇතුළත සිදුවෙන දේවල්
පිටත ඉන්නා ජනතාව දන්නා බව ඔවුන්ට තේරුණේ නෑ.
ඒවාට අවධානයක්, වැදගත්කමක් දෙන්න
ඔවුනට ඕනෑකමක්, වේලාවක් තිබුණේ නැහැ
ඒ තරම්ම ඔවුන් ජරාවේ ගිලිලා මත් වෙලා හිටියේ.

ජූලි 9, 2022 උන්ව හෙලෙව්වා!
සැප්තැම්බර් 21, 2024 උන්ව එලෙව්වා!!
නොවැම්බර් 14 විශ්‍රාම යැව්වා!!!

අයි එම් එෆ් එක, රටේ සංවර්ධනයටත් තිරිංග දාලා තමයි
ණය දෙන්නේ
වඩා වේගයෙන් සංවර්ධනය උනොත් ගහනව දඬ.
හොඳ බබාලා වගේ අයි එම් එෆ් කියන පාරෙම
දඬ නොගෙවා, ආර්ථිකය ඩොලර් බිලියන 80 හරියෙ
තියාගෙන යනවද?
ග්ලෝබල් සවුත් එකෙන්, ග්ලෝබල් නෝර්ත් එකට අවශ්‍ය
කලින් යැවූ පරිදිම අමුද්‍රව්‍ය, මිනිසුන් යවනවද?
අලුත් පාර්ලිමේන්තුවක් එක්ක වේගවත් වර්ධනයකට
අරගෙන යනවද?
ආරුගම්බේ, ලිප්ටන් වටරවුම්, කකුල් මාට්ටු,
හාල්, පොල්, බිත්තර, වර්ජන, ගර්ජන
එක පිට එක සුනාමියක් වගේ එන්න නියමිතයි.

පශ්චාත් මැතිවරණ තත්ත්වය
දියුණු ධනපති රටක් වගේ, කිසිම සද්දයක් නෑ.
ජනාධිපති ක්‍රම අහෝසිය?
නෑ නෑ ඔන්න මං ඒ ගැන කිව්වේ නෑ
පාර රාජ්‍යය තවම වැඩ!
දෙවන පාස්කුවත් පොඩි රිහර්සල් පාරක් දාලා බැලුවා.
සංචාරක කර්මාන්තෙට බැස්ටිය දෙන්න.
ඉදිරිය පරිස්සමින්.
උන් ඔක්කොම යාලුවො මල්ලි...?

- නිහාල් රූපසිංහ

[nihal.rupasinghe07@gmail.com]

සිසිල කෙටිකතාව

වීණාවී

ඉන්දිකා තිලකුමාර

“ගීතදේව සර් නැති වෙලා මාස තුනක් වගේ ඇති පුතේ,” අම්මා කිව්වා. “අනේ ඒ දවස් වල අපිට කොයිතරම් නම් උදව් පදව් කළා ද? මේ ළඟදී මාස්ටර්ගේ නීතිඥයා කියලා කෙනෙක් ඇවිත් දුවට දෙන්න කියලා පාර්සලයකුත් දීලා ගියා. දුව ලංකාවට ආව දවසක ඇවිත් ඒ මහත්තයාව හම්බු වෙන්න කියලා කාඩ් එකකුත් දීලයි ගියේ.”

අම්මා හිමිහිට අල්මාරිය ඇරලා ලස්සනට එතුව පෙට්ටියක් අතට ගත්තා.

සුභානි හිටියෙ ඇඳ උඩ වාඩිවෙලා. ඇගේ සුරතට හසු වුන ඇඳ ඇතිරිල්ල තව ටිකක් ගුලිවුණේ ඇගේ හිත ඇතුළේ උඩ පිනුම් ගහන හිතුවිලි කන්දරාවට බයේ වගේ.

“ආ මෙන්න ඇරලා බලන්නකෝ එහෙනම්,” පෙට්ටිය අතට අරන් අම්මා හෙමිහිට ඇඳ උඩින් වාඩිවුණා.

ඒක ඇතුළේ තියෙන්නේ මොනවාද කියලා සුභානිට හිතා ගන්න පුළුවන්වුණා. දවටනය දිග හරින ඇගේ ඇඟිලි වෙව්ලන්න පටන් ගත්තා. සුභානි දිග හුස්මක් අරගෙන පෙට්ටියේ පියන ඇරියා.

රතුපාට වෙල්වට් රෙදි කෑල්ලක් උඩ ඒ වීණාව තැන්පත්කරලා තිබුණා.

කැඩුනු වෙණ තත දකින්නට ඇයට වීණාව අතට ගන්න අවශ්‍ය වුණේ නැහැ. සියුම්ව හෘදයක හැඩය සිත්තම් කළ හිස කොටසේ මල්කම්, ලියකම් අතර සැඟවුණු කාන්තා වුවනත ඇය දුටුවා. සුභානි තමන්ගේ දිග ඇඟිලි තුඩුවලින් එහි දෙනෙත් පිළිඹිබු කළ නිල් මානෙල් පෙති පිරිමැද්දා. වීණාවේ රළු හිස කොටස වෙනුවට ඇයට දැනුණේ මල් පෙත්තක සිනිඳු මෙළෙක.

“පුරුද්දා සත්සර මවන්න මා වීණාවි!” පුංචි සුදු කොළ කැබැල්ලක කළු පාට අකුරෙන් එහෙම ලියලා තිබුණා. සුභානිගේ ඇඟිලි වෙව්ලුවා. තොල් පට ගැහෙන්න ගත්තා. ඇය අම්මා බදාගෙන මහ හඬින් හඬන්නට ගත්තා.

“දුකයි තමයි පුතේ! තාත්තෙක් වගේ ඔයාව මෙතැනට උස්සලා තිබ්බ මනුස්සයා”අම්මා හිමිහිට සුභානිගේ හිස පිරිමැද්දා.

“මට අඩු ගාණේ ඒ කථාව අහගෙන ඉන්න තිබුණා. වීසිකරලා, පැනලා දුවන්නේ නැතිව මේ වීණාව අතට ගන්න තිබුණා. අනේ මම හරිම නපුරුයි! හරිම නපුරුයි! අම්මා!” සුභානි අම්මා බදාගෙන කෑ ගහමින් හැඬුවා.

“මොනවද දරුවෝ මේ කියවන්නේ?” අම්මා ඇහුවේ පුදුමයෙන්.

සුභානිගේ හිත අතීතයට ගියා.

* * *

“දෙනෙත සුපිරි තරු” පුහුණුකරුවන් විදිහට හිටියේ ගීතදේව සර්, හාසුරු සර් සමඟ අරුන්දතී මැඩම්. ශාස්ත්‍රීය සංගීතයට තිබුණු නිපුනතාවය වගේම, ක්ෂේත්‍රයේ පළපුරුදු වැඩිහිටියෙකු වු නිසා ම සිය ආචාර්යවරයා ලෙස ගීතදේව තෝරා ගැනීම ගැන සුභානි දෙවරක් හිතුවෙ නැහැ. සුභානිගේ සැමියා වූ මාධවත්, ඇගේ දෙමාපියනුත් ඇගේ මේ තීරණය එක හෙළාම අනුමත කළා.

සුභානිගෙ පියා හා සම වයසේ සිටි ගීතදේව ඒ වන විට ක්ෂේත්‍රයේ ගෞරවනීය වැඩිහිටියෙකු ලෙස නමක් හදාගෙන තිබුණා.

“ඔය නම වේදිකාවට ගැලපෙන්නෙ නෑ ළමයෝ. අපි ඔයාගේ නම අද කාලෙට මේ රැල්ලට ගැලපෙන විදිහට ටිකක් වෙනස්කරමු” ගීතදේව මාස්ටර් සුභානි දිහා බලලා එහෙම කිව්වා.

“සුභානි... බලමු ඒ අකුරෙන්ම මොකක් හරි. දෙවැනි නම විහංසා... විහංසා... සුභානි විහංසා. හරි මෙහෙම කරමු. සත්සරා... සත්සරා වීණාවී.”

“ඒක නිකන් බැලු බැල්මට ම සංගීතයට යා දෙන නමක්. අනික රටේ ලෝකේ අය දැනගන්න ඕනෑ නෑ ඔයා කසාද

බැඳලා දරුවෙක් ඉන්න අම්මා කෙනෙක් කියලා. මාධවටත් තේරෙනව නේ මං කියන දේ. අන්තිම හරියට යනකොට අපට මිනිස්සුන්ගේ කැමත්ත ගොඩාක් උවමනා වෙනවා," ගීතදේව මාස්ටර් ඒ ටික කිව්වෙ විශේෂයෙන්ම මාධවට.

"මම කෙනෙක් අඳුන්නලා දෙන්නම් සත්සරාට වේදිකාවට ගැලපෙන ඇඳුම් ආයිත්තම් ටික පිළියෙල කරවාගන්න," ගීතදේව මාස්ටර් එහෙම කියලා නිල නොවන විදිහට සුභානිගේ අලුත් නම බෞතීස්ම කළා.

"ගොඩාක් ස්තුතියි මාස්ටර්," සුභානිටත්, මාධවටත් එකවරම කියවුණා.

"තව එකක්. බදුල්ලේ ඉඳන් කොළඹ මේ වැඩවලට යන එන එක අමාරුයි නේ. කොළඹ කොහේ හරි තැනක නවතින්න ලෑස්තිකර ගමු."

"හිතට අල්ලන තැනක් හම්බු වෙනකම් ඕගොල්ලන්ට මේ ගෙදර ඇනෙක්සියේ වුනත් ඉන්න පුළුවන්."

"මේ විශාල ගෙදර මටත් තනිවම පාළුවේ ඉඳලා ඇති වෙලා ඇත්තටම."

මාස්ටර් එහෙම කිව්වහම මාධවටත් ලොකු සැනසීමක් දැනුණා. "ඔව් සුභා මට හිතෙන්නෙත් ඒක හොඳයි. ඔයා අම්මයි පුතයි එක්ක මෙහෙ නතර වෙන්න. සෙනසුරාදා, ඉරිදාට මටත් ඇවිත් යන්න පුළුවන්නේ," මාධව කිව්වා.

සුභානි අම්මයි පුතයි එක්ක ගීතදේව මාස්ටර්ගේ ගෙදර ඇනෙක්සියේ නතරවුණේ ඒ විදිහට. ගීතදේව මාස්ටර් හිටියේ තනිවම. දරුවෝ දෙන්නත් විවාහවෙලා, පිටරටවල පදිංචිවෙලා හිටිය නිසා, බිරිඳ නැතිවුණාට පස්සේ මාස්ටර්ගේ තනි නොතනියට හිටියේ ගේ දොර අස්පස්කරන්න, වත්තේ පිටියේ වැඩකරන්න හිටපු සේවකයෙක් විතරයි. කෑම ටික පිළියෙළකරගන්න උදේ ඇවිත් හවසට යන අත්උදව්කාරියකගේ සහාය ලැබුණා.

සුභානිල ගීතදේව මාස්ටර්ලගේ ගෙදර කොටසක පදිංචිවුණාට පස්සේ, සුභානිගේ අම්මා විශේෂ කෑමක් එහෙම හදපු වෙලාවට ගීතදේවගේ පංගුව වෙන් කළේ දං කඳක් හදනවා වගේ ගෞරවයෙන්.

තරඟයට අදාළ පුහුණුවීම් තිබුණේ ගල්කිස්සේ සෙනිති ශබ්දාගාරයේ. පුහුණුවීම් තිබුණු හැම වෙලාවෙම ඇයට ගීතදේව සර් සමග ඔහුගේ වාහනයෙන් ශබ්දාගාරයට යාමට ඉඩ ලැබුණා. කොළඹ ගමන් බිමන් වලට එතරම් පුරුද්දක් නොතිබුණු සුභානිට බස්වල, තුන්රෝද රථවල ගමන්කරනවට වඩා ඒක ලොකු පහසුවක්වුණා.

ඇය මහන්සි වී ස්වර අභ්‍යාසවල නිරතවුණා. වෙහෙසකර පුහුණුවීම් අවසානයේ ගෙදර ආ පසුවත් ගීතදේව මාස්ටර්ගේ ගුරුහරුකම් යටතේ පුහුණු වී තරඟයේ ඉදිරියට ඒමට මේ නිසා ඇයට හැකියාව ලැබුණා.

අන්තිම දොළොස් දෙනාට එනකොට තමාට තරුවක්වීමට වාසනා ගුණයක් ඇති බව සුභානිට දැනෙමින් තිබුණා.

ක්‍රිෂාණි ජෝර්ජ් කියන්නේ ගීතදේව මාස්ටර් සුභානිට අඳුන්වා දුන් මෝස්තර නිර්මාණ ශිල්පිනියක්. මුල් යුගයේ සත්සරා වීණාවී අඳින පළඳින සියල්ල තීරණය කළේ ඇයයි. සත්සරාගේ දිග කෙස් කළඹ එක දවසකට රැළිකරන්න, තව දවසකට කෙළින්කරන්න, යාන්තමට වෛවාරණ වර්ණ සංකලනයන් එකතුකරන්න ඇය දෙවරක් සිතුවෙ නැහැ. මෝස්තර නිර්මාණ ශිල්පිනියගේ දස්කම් විදහා පාන නානාවිධ ඇඳුම් ආයිත්තම් එදා "දෙනෙත" නාලිකාවේ වේදිකාව එකලු කළා.

ගැයුමට අමතරව ප්‍රේක්ෂකයන් පිනවන ප්‍රසාංගික කලාවත් යම් මට්ටමකට ප්‍රගුණකරන්න සත්සරා වීණාවීට සිද්ධවුණා. තරඟයේ ඉදිරියට යාමට උපන් හැකියාව වගේම මේ පුංචි පුංචි කාරණා වැදගත් වෙන බව ගීතදේව හොඳින් ම දැනගෙන හිටියා. අවසන් තරඟයේ දී සුමාල්ට දෙවැනිවුණේ බදුල්ල පැත්තේ ඈත ගමකින් ආපු සුභානි විහංසා නෙමේ. ගීතදේව මාස්ටර් ප්‍රාණ වායුව පිඹලා අඹවපු සත්සරා වීණාවී.

අවසන් පූර්ව තරඟයේ දී ප්‍රේක්ෂකයන් ඉදිරියේ පොරොන්දු වූ ආකාරයට ම තරඟයෙන් පසු ගීතදේව මාස්ටර් ඇය සමඟ ගීතයක් කළා. ඒ තරඟය නිමාවෙලා සති දෙකකට විතර පස්සේ.

* * *

සඳ වතක් අහසින් බසින්නට
වරම් ඉල්ලයි... අහසකින්

ගීතය පටන් ගන්නේ ගීතදේවගේ ගැඹුරු භාවපූර්ණ හඬින්.

බැස නොයන්නැයි අහස ඉල්ලයි
සඳ නැතිව පාළු ලු ඉතින්

සත්සරා ඊලග පද පෙළ ගයනවා මිහිරට.

එළිය පමණක්... විඳ පුරුදු මුත්
එකම අහසක සැරිසරන්
කොහොම අහසක් දරා ගන්නද
සඳක් බැස ගිය පසු හොරෙන්

ගීතදේව ඒ ටික කියන්නේ සත්සරාගේ ඇස් දෙක දිහාම බලාගෙන.

දරා ගන්නට නොහැකිම නම්
බැහැලා යන විට සඳවතක්
එළිය බලමින් ඉන්න වෙනවා
එකම අහසක සැරිසරන්

සත්සරා ඊලගට එහෙම ගයනවා.

ඊලඟට අන්තිම පද පේළි දෙක දෙන්නම එකතු වෙලා ආයෙත් ගයනවා. සත්සරා ගීතදේව මාස්ටර්ගේ ඇස් දෙක දිහාත්, ඔහු ඇගේ ඇස් දෙක දිහාත් බලාගෙන අන්තිම පේළි දෙක එකට ගයනවා. ගැයුම අතරතුරේ දී එකිනෙකා දිහා බලා මන්දස්මිතයක් පානවා. පුහුණුවීම් අතරතුර ඇයට උපදෙස් ලැබුණේ එලෙස කරන ලෙසටයි.

දෙවැන ස්ථානයට පත්වීමේ ආහ්ලාදයත්, කිරුළක උණුසුමත්, රසික ප්‍රතිචාරයත් සත්සරාගේ සිත සතුටෙන් පුරවනවා.

මේ හැම ජයග්‍රහණයකම පිටුපස හිටි ඇගේ ආචාර්යවරයා ගැන ඇයට තියෙන්නේ ලොකු පැහැදීමක්. ඒ වගේම ගෞරවයක්. ඔහුගේ ප්‍රතිභාව, හසළ අත්දැකීම්, ඇවිදින විශ්ව කෝෂයක් බඳු ඔහුගේ දැනුම් සම්භාරය ඇය මීට පෙර කිසි කෙනෙකුගෙන් දැකලා තිබුණෙ නැහැ.

ගීතය අවසානයේ ගීතදේව සත්සරාට තනි රතු රෝස මලක් දෙනවා. සත්සරාට ඒ අවස්ථාව ඇගේ රංගනයේ ම කොටසක් වූවාට ගීතදේවට එය එසේ වන්නේ නෑ. දිනෙන් දින වැඩි වන, ඔහුටම පාලනයකරගත නොහැකි ආකාරයට සත්සරා පිළිබඳ දැඩි ආකර්ෂණයකින් ඔහු ඇතුලාන්තයෙන් දැවෙනවා. සත්සරාට රෝස මල පිරිනමන්නේ එවන් ප්‍රහර්ෂයක් මැඩ ගැනීමට වෙර දරන අවුරුදු හැට පහක නව යොවුන් තරුණයෙක්. ගීතය එක රැයින් රසිකයන් අතරට යනවා.

ගීතදේවගේ හැම ප්‍රසංගයකටම ඇයටත් ආරාධනා ලැබෙනවා. මේ ගීතය ඒ හැම ප්‍රසංගයකම අනිවාර්ය අංගයක් වෙනවා. ප්‍රසාංග, පටිගතකිරීම් වගේ ඇගේ ජීවිතයට අළුතෙන් එකතු වුන අංග නිසා ගමේ නොයා ටික කලකට කොළඹම ඉන්න එක පහසුවක් කියලා පවුලේ හැමෝටම තේරුම් යනවා. අවුරුද්දක පුංචි දරුවා මේ රාත්‍රී ප්‍රසාංගවලට ගෙනයාමේ අපහසුව නිසා පුතා අම්මා සමග ගෙදර ඉඳිද්දී රටවටා මේ ගමන් වලට සත්සරා යන්නේ ගීතදේව සමඟ. ක්ෂේත්‍රයේ සැවොම ඇය අමතන්නේ සත්සරා කියලා. ඒත් ගීතදේව සත්සරා අමතන්නේ වීණාවි කියලා.

* * *

“වීණාවි ඔයාට පුළුවන් නේද අපේ සංගීත ආශ්‍රමයේ වැඩවලට මට උදව්කරන්න. මට දැන් මේ වැඩ තනිවම කරගන්න අමාරු තරමයි,” ඔහු දවසක් ඇයට කිව්වා.

“පුළුවන් මාස්ටර් ප්‍රසංග නැතිදාට මටත් ලොකු වැඩක් නෑ නේ. අනික මමත් ආසයි පුංචි අයට දන්න දෙයක් කියලා දෙන්න,” ඇය උත්තර දුන්නා.

ගීතදේවගේ සංගීත අසපුව තිබුණේ මොරටුව පැත්තේ බොල්ගොඩ ඔයට මායිම්ව සිත නිවන ලස්සන තැනක. පන්ති පැවැත්වීමට අමතරව පෞද්ගලික ශබ්දාගාරයක් ලෙස ඔහු එය පාවිච්චි කළා.

එහෙම ගිය එක දවසක පන්ති ඉවරවුණාට පස්සේ ගීතදේව සුභානිට කතා කළා.

“වීණාවී මට ඔයාට පෙන්නන්න දෙයක් තියෙනවා. මගේ වන්දනා කුටිය ඔයා දැකලා නෑ නේ මීට කලින්?”

“මටත් ආසයි මාස්ටර් ඒක බලන්න. මාස්ටර් මට ඒ ගැන කලින් කියලා නැහැ නේ,” ඇයටත් වන්දනා කුටිය නැරඹීමට ලොකු ආසාවක් පහළවුණා.

“යමුකෝ එහෙනම්,” උඩු මහලේ කොණක පිහිටි වන්දනා කුටියට ඔහු ඇයව කැඳවාගෙන ගියා.

විශාල සරස්වතී පිළිමය, දේව රූප, ශාන්ත බුදුරුව දැකලා ඇයට හරි පුදුමයි. කුටිය පුරා ම මිහිරි සුගන්ධයක් පැතිරුණා. එතැන හරිම නිවුණු ශාන්ත සුවයක් තිබුණු තැනක්.

“අනේ මාස්ටර් මෙතන හරිම ලස්සනයි! හරිම ලස්සනයි! මම මෙතැනට හරිම ආසයි!” ඇය උද්යෝගයෙන් කියවන්න ගත්තා. “මං දැනන් හිටියෙ නැහැ නේ මෙහෙම ලස්සන තැනක් මේ ගෙදර තියෙනවා කියලා.”

ඇය අර දේව රූප, සංගීත භාණ්ඩවල අනුරූ ඇඟිලි වලින් ස්පර්ශකරමින් මවිතවූවේ ළදැරියක් වගේ.

සුභානි දිහා බලාගෙන ඉන්න ගීතදේවගේ මුවට සිහින් මදහසක් නැගුණා.

“දරුවෙක් ඉන්න අම්මා කෙනෙක් උනාට තවම වෙලාවකට පුංචි කෙල්ලක් වගේ,” ඔහුට හිතුණා.

ඒ හුරතලය, අව්‍යාජ ගැමි බව, ඇගේ අහිංසකකමට ඔහුට ලෝබ හිතුණා. තමන්ගේ හිත කියවන්න ඇයට පුළුවන්කමක් තිබුණා නම් මේ කාරණය කොයි තරම් පහසු වෙන්නට තිබුණාද කියලා ඔහුට මතක්වුණා. නගරයේ තෙම්පරාදු වෙච්ච ගැහැණියකට නම් මේ වෙන විට තම අදහස නිසැකවම ඒත්තු ගොස් ඇති බවට ඔහුට කිසිම සැකයක් නැහැ. ඒත් ඇයට සිත බැඳුණේ ඇය එසේ නොවන නිසා නේ දෝ කියලා ඔහුගේ යටි හිත ඔහුට මතක්කරලා දුන්නා.

“මං වීණාවිට තෑග්ගක් ගෙනාවා. බලන්න කැමතිද කියලා,” ඔහු රතු පැහැති පෙට්ටියක් ඇයට පිරිනැමුවා.

මීට කලින් මේ කාමරයට ඇවිත් තියෙන්නේ සරා විතරයි. ඔහු කිව්වා. සරස්වතී ඔහුගේ මියගිය බිරිඳ.

ඇය සෙමින් පෙට්ටියේ පියන විවෘත කළා.

“වීණාවක්! අනේ මාස්ටර් ඒක හරි ම ලස්සනයි! ගොඩාක් ස්තුතියි,” ඇය පැවසුවේ හරිම සතුටකින්.

“මට එන්න ඉඩ දෙන්න. ඔය හිතේ සත්සර මවන්න,” ඔහු හිමින් මිමිණුවා. කොයි තරම් හිමිහිට කීවත් සුභානිට ඒ වචන ඇහුණා. ඇය ඇගේ විශාල ඇස් දෙක තවත් ටිකක්

විශාලකරගෙන පුදුම වෙලා බලා ඉඳිද්දී ඔහු ඊලඟට පැවසුව දෙයින් ඇය හොඳටෝම බයවුණා.

"මේ පුදසුනේ මලක්වෙන්න. සරා ඇරෙන්න කිසිම කෙනෙක් මේ පුදසුනට ඇවිත් නෑ. මං එහෙම කාටවත් එන්න දුන්නෙ නැහැ. වීණාවි දන්නව නේ?" ඔහු පපුවට අත තියාගෙන, ඇගේ ඇස් දෙක දිහා බලාගෙන කිව්වා. "ළඟක හිටියත්, දුරක හිටියත්, ඇස් වහගෙන හිටියත්, ඇරගෙන හිටියත් ඔයාගේ කටහඬ මගේ හිතේ දෝංකාර දෙනවා වීණාවී. මට තවත් නම් මේ අදහස ඔයාට නොකියා හිතේ හිරකරගෙන ඉන්න බෑ. මට මාව පාලනය කරගන්න බෑ."

සුභානිගේ පපුව ගැහෙන්න ගත්තා. තොල කට වියළුණා. මාධව ඉස්-ඉස්සෙල්ලා ආදරෙයි කියලා කිව්ව දවස ඇයට සිහියට ආවා. හා හාපුරා කියලා මාධව ඇගේ මුව මත තැවරූ කුළුඳුල් හාදුව ඇයට සිහිපත්වුණා. පස්ස නොබලා දුවලා දුවලා ගිහින් ඒ පපුතුරේ ඔළුව තියා ගන්නවා, තමන්ගේ ගායන දිවියයි, "දෙනෙත" නාලිකාවේ අනු කිරුළයි යකාට ගියාවෙ කියලා ඇයට හිතුණා.

කලබගෑනියයි, වික්ෂිප්තයයි එක්ක සුභානිගේ සිත පෙරළිකරද්දී ඇගේ අතින් වීණාව අත හැරුණා. ඇය පඩි පෙළ දිගේ පහළට දුවගෙන, දුවගෙන ගිහින් ඇගේ අත් බෑගයත් අරගෙන එළියටම දිව්වා. ඇය පාරේ යන තුන්-රෝද රියක් නවතා ඊට ගොඩවෙන අයුරු ගීතදේව උඩුමහලේ සිට බලාගෙන සිටියා.

සුසුමක් හෙලා ලය සැහැල්ලුකරගත් ඔහු බිම වැටී ඇති වීණාව අතට ගත්තේ අසීමිත දුකකින්. තත් කොටසේ ගැලවුණු තත දකින විට ඔහුගේ පපුව පැලෙන්න තරම් දුකක් ඇතිවුණා. ඒ දුක ඔහුගේ වියපත් හෘදයට ඔරොත්තු නොදෙන තරම්. ඒ කුඩා වීණාව ඔහුට අවශ්‍ය විදිහටම නිමකරගන්න කොපමණ වෙහෙසක් ගන්නවුණා ද කියා ඔහුට මතක්වුණා.

"දවසක සැබෑ අයිතිකාරයා ළඟට ගිහින් නතරවෙන්න," ඔහු වීණාවට එහෙම කියලා නැවතත් එය ඒ කුඩා පෙට්ටියේ ම හෙමිහිට තැන්පත් කළා .

ඔහු ගෙදර යනවිට ගෙදර වෙනදා නොදුටු මහා මුස්පේන්තු, මුසලකමක් ඔහුට දැනුණා.

"අනේ මාස්ටර්, මේ දරුවා මොනවට හරි හොඳටම බයවෙලා. වචනයක්වත් කතාකරන්නෙ නෑ," සුභානිගේ අම්මා කිව්වෙ ගීතදේව ඉදිරියට දුවගෙන ඇවිත්.

"මේ ළමයා පන්ති ඇරිලා කොහේ හරි ගිහින් තියෙනවා. ගෙදර ආවෙත් ත්‍රී වීලර් එකක. හොඳටෝම බයවෙලා. නුලක්වත් මතුරන්න වේද මන්දා?"

"ඔහොම ටිකක් ඉන්න දෙන්න. හිතේ කලබලේ අඩුවුණාම කතා කරාවි," ගීතදේව සන්සුන්ව කිව්වා.

ඒත් එදා දවසටම සුභානි රෑ කෑමටවත් කාමරෙන් එළියට ආවේ නෑ.

ගීතදේව කලබලවෙන්න පටන් ගත්තේ ඇය උදෑසන ස්වර අභ්‍යාසවලටවත් එළියට ආවේ නැතිවුණා ම යි.

ගීතදේව ඇගේ කාමරය ළඟට ගියා. දොර ඇරලා තිබුණට ඇතුළට යන්න ඔහුට හිත හදා ගන්න බැරිවුණා. කීපවරක් දොරට තට්ටුකර ප්‍රතිචාරයක් නැති තැන ඔහු දොර රෙද්ද මෑත්කර කාමරයට එබිලා බැලුවා.

සුභානි ඇඳ උඩ වාඩිවෙලා හිස් බැල්මකින් බලාගෙන හිටියා.

"මට සමාවෙන්න. අපි ඒක අමතකකරලා දාමු. ලෑස්ති වෙලා පන්තියට එන්න වීණාවි,"ඔහු මෘදු බසින් පැවසුවා.

ඒ හඬත් සමඟම නින්දෙන් ඇහැරුණා සේ හිස ඔසවා බැලූ සුභානි ඒ හඬ නෑසෙන්න දෙසවන් වසා ගත්තා. අනතුරුව ඉකි ගසමින් වැලපෙන්නට පටන් ගත්තා.

ඔහු විසිත්ත කාමරයට ආවෙ අප්‍රමාණ පශ්චාත්තාපයකින්. "මාධවට කතාකරලා එන්න කියලා කියන්න. දොස්තරකෙනෙකුට පෙන්වන්න වෙයි වගේ. මං ඒ ගැන හොයලා බලන්නම්," ඔහු සුභානිගේ මවට කිව්වා.

පුද්ගලික රෝහලක දී සත්සරා වීණාවි පරීක්ෂා කළ දොස්තරවරු කීවේ ඇගේ හැසිරීමට හේතුව හිතාගැනීමට නොහැකි බවයි. ඇගේ මොළයේ කථන මධ්‍යස්ථානය ආශ්‍රිතව හෝ ඇගේ ස්වර තන්ත්‍ර ආශ්‍රිතව හෝ වෛද්‍ය විද්‍යාවට හසුවන කිසිම ගැටළුවක් තිබුණෙ නැහැ. සමහරවිට මේක ලොකු කම්පනයක් නිසා වෙන්න පුළුවන් කියලා වෛද්‍යවරු කීවාට ඒකට ආසන්න හේතුවක් හිතා ගන්න පවුලේ අයටවත් නොහැකිවුණා.

ගීතදේව දකින වාරයක් වාරයක් පාසා අළුත් වෙන හැඬුම් දකින වෛද්‍යවරිය පවුලේ අයට උපදෙස් දුන්නේ ටික දවසකට ඇයට පේන්න නොඑන ලෙස ඔහුට පවසන ලෙසයි.

අම්මා සමග හෝ මාධව සමග හෝ වෛද්‍යවරිය සමග හෝ ඇය වචනයක්වත් කථා කළේ නැහැ.

සත්සරා අතට යාන්තම් බහ තෝරන අරුණෝද් පුතා දෙද්දී ඒ ඇස් මුදු වෙනු වෛද්‍යවරියට දිනක් අහම්බෙන් පෙනුණා. අරුණෝද් සත්සරාගේ බෙල්ල වටා අත යවා, පුංචි දෙපා උස්සා, එස වී ඇගෙ කම්මුල මත මුදු හාදුවක් තිබ්බා. සත්සරාගේ දෑත නිරායාසයෙන්ම අරුණෝද් වටා එතුණා. වෛද්‍යවරිය පුදුමකරවමින් ඇගේ මුවින් එක වචනයක් පිටවුණා.

"මැණික"

මෙතුවක් දවස් වෛද්‍යවරියගේ සිතේ තිබූ අනුමානය නිවැරැදි බව ඇයට ඒත්තු යමින් තිබුණා.

"මාධව ආවහම මාව හමු වෙන්න කියන්න" වෛද්‍යවරිය සත්සරාගේ අම්මාට කිව්වා.

"ඩොක්ටර්, මට ඇත්ත කියන්න. මගෙ සුභා ආයෙ කතාකරන එකක් නැද්ද?" මාධවට ඇඬුම් එනවා.

"එයාට කිසිම ශාරීරික ආබාධයක් නැහැ. ස්වර නංවන්න බැරි මොනම ආබාධයක්වත් නැහැ."

"ඒ කිව්වෙ ඩොක්ටර්?" මාධවට කතාව පැහැදිලි නෑ.

"මේ මට හිතෙන හැටි," වෛද්‍යවරිය හිමින් කටහඬ අවදි කළා. "මට හිතෙනවා සත්සරාට කතාකරන්න විතරක් නෙමෙයි ඔන්නම් ගයන්න වුනත් පුළුවන් කියලා. මට පේන විදිහට මොනවා හරි අපට නොතේරෙන දෙයකට එයා හිතලම කතා නොකර ඉන්නවා.හේතුව මොකක් වුනත් ඒකට ගීතදේව සම්බන්දයි කියලා මට හිතෙනවා."

"මේ පරිසරයෙන් ටික කලකට ඈත් වෙන්න පුළුවන් නම් ඔයාලට ගමේ හරි, නැතිනම් පිටරටකට වගේ යන්න පුළුවන් නම් ප්‍රශ්නය ඉක්මනටම විසඳෙයි කියලා මට හිතෙනවා," වෛද්‍යවරිය වැඩි දුරටත් කීවා.

මාධව විශ්වවිද්‍යාල ඇඳුරිඳු කෙනෙක්. ඔහු තමන්ගේ දැන හැඳුනුකම් පාවිච්චිකරමින් වසර දෙකක කාලයක් සඳහා ඉන්දියානු විශ්වවිද්‍යාලයකට සම්බන්ධ වුණේ සුභානිත්, අරුණෝද් පුතාත් සමග.

මුල් සති කීපයේ ඇති වූ හා-හුවෙන් පසු මාධ්‍යවලටත් සත්සරා වීණාවී අමතකවෙලා ගියා.

* * *

ලංකාවට ඇවිත් අර වීණාව යළිත් දුටුවාට පසු සුභානිට ගීතදේව ආයෙත් මතක් වෙන්න පටන් ගත්තා. අත්දැකීම් නැති යොවුන් වියේ තමා ඕනෑවටත් වඩා බියවූවාදැයි ඇයට හිතුණා. බිය වන්නට තරම් බැරෑරුම් දෙයක් ඔහු නොකී බව ඇයට සහතිකයි. ඇය ඇත්තටම හිතා මතා කතා කිරිල්ල නැවත්වුවේ එදා ඇගේ හිතට ආ ඒ වරදකාරී හැඟීම නිසයි.

ඇයට එදා හිතුණේ තමාගේ කටහඬ තව කෙනෙක් තුළ අනවශ්‍ය ආශාවක්, කාමයක් ඇතිකරනවා නම් ඒ කටහඬට දොරගුළුලන එක තමයි ඊට පිළියම කියලා. හරියට එදා දවස සුභා තෙරණිය කළා වගේ. පිළියම ඇස ඉදිරීමවත්, කටහඬ ගොලු කිරීමවත් නොවන බව දැන් ඇය දන්නවා. තම තමන්ගේ හිත පරිස්සම් කරගැනීම තම තමන්ටම අයිති රාජකාරියක් කියලයි ඇයට දැන් නම් හිතෙන්නේ.

අනෙක් අතට තව කෙනෙක් කෙරෙහි සෙනෙහසක් ඇති වීම අපරාධයක් නෙමෙයි කියලා ඇයට හිතුණා. ඔහු ඉල්ලා සිටියේ ඔහුගේ හද පුදසුනේ මලක් වෙන්න කියලා විතරයි. නිසැකවම අද ඇගේ හද පුදසුනේ පසෙකින් ඔහු සිටිනා බව ඇයට දැනුණා. ඇගේ පියා, මාධව, අරුණෝද් සිටිනා සේ ම. ඒත් ඔහුගේ ස්ථානයට නිර්වචන දෙන්න, නිර්වචන හොයන්න ඇයට අවශ්‍ය වුනේ නැහැ.

සුභානි විහංසා ඉහළගෙදර වේදිකාවට නැග්ගේ කාලෙකට පස්සේ. ගීතදේව මාස්ටර් යෝජනා කළ වේදිකා නම අතහැර දාලා, අම්මා අප්පච්චි තමාට දුන්න නම පාවිච්චිකරලා රසිකයන් අතරට යනවා කියලා ඒ වෙනකොට සුභානි තීරණයකරලා ඉවරයි. අවසන් මහා තරඟය ආශ්‍රිත දිනවල හැඳි දිලිසෙන විසිතුරු ඇඳුම් පැළඳුම් වෙනුවට ඇය වාම් රෝස පැහැති ඔසරියකින් සැරසී සිටියා.

ඉස්සර වෙස්ගැන්වීම් ශිල්පීන්ට කැමති කැමති විදිහට, තැනින් තැන වර්ණ ගැන්වූ, සමහරදාට කෙළින් කළ, තවත් සමහරදාට රැළි කළ වරළස ලී ජාවාරම් කාරයන්ගේ ඇසට හමු නොවුණ වනන්තරේ වගේ අමුවටම තිබුණා. ඇය බෙල්ලට වෙන්න කොණ්ඩය බැඳගෙන උඩරට කාන්තාවන් පළඳින ආකාරයේ කූරක් කොණ්ඩයේ ගසාගෙන සිටියා. ප්‍රසාංග වේදිකාවේ වැජඹෙන්නට ප්‍රගුණ කළ ප්‍රසාංගික කලාව පසෙක ලා, ඇය සන්සුන්ව ඉඳ ගත්තේ සිතාරයත් අතට අරගෙන. මාධව කථීකාචාර්යවරයෙකු ලෙස ඔහුගේ වෘත්තියේ නියැලෙද්දී, සුභානි ඉන්දියාවේ ගතකළ වසර දෙකකට නොඅඩු කාලය යොදා ගත්තේ ශාස්ත්‍රීය සංගීතය ප්‍රගුණ කිරීමට.

සංගීත කණ්ඩායම මියුරු සත්සර නංවද්දී, සුභානි සිතාරය වයමින් ඇගේ ගැයුම ඇරඹුවා. මධුර මනෝහර බිම්පලාසි රාගයට එදා ගීතදේව සමඟ ගැයු යුග ගීය ඇය තනිවම ගැයුවා.

සඳ වතක් අහසින් බසින්නට
වරම් ඉල්ලයි... අහසකින්
බැස නොයන්නැයි අහස ඉල්ලයි
සඳ නැතිව පාළුලු ඉතින්...

සුභානි ගයන විට ඇගේ දෙනෙත්වල පුංචි කඳුළු පටලයක් දිලිහුණා. වේදිකාව උඩදී, ගී ගයන ඇගේ වුවනත විවිධ කැමරා කෝණ වලින් කාචවල සිත්තම් වෙද්දී ඒ භාවය සැඟවීමට පුළුවන්කමක් තිබුණේ නැහැ.

අසුන්වල ඉඳගෙන සිටි රසිකයන් නැගිට අත්පොළසන් දෙද්දී ප්‍රේක්ෂකයන් අතරෙන් හෙමිහිට ඉදිරියට එන ගීතදේවගේ රුව සුභානිගේ බොඳවුණු දෑස්වලට පෙනී, නොපෙනී ගියා.

- ඉන්දිකා තිලකුමාර [ithilakumara@yahoo.com]

පුන් සඳ රෑට ඇවිදින්

පද රචනය: රත්න ශ්‍රී විජේසිංහ
තනුව හා සංගීතය: ඔස්ටින් මුණසිංහ
ගායනය: නිරෝෂා විරාජිණී

පුන්සඳ රෑට ඇවිදින් හේනේ කළුව බිඳ
රන් කෙඳි සේම රන්වන් ඉරිඟු ඉඹිනව ද?
තුන් යම හීන දැක දැක මොටදැයි ගෙදර හිඳ,
රන්කඳ තාම පැල් රකිනවාදෝ නිදි නැති ද?

නිල් තරු රෑන ඉඟිබිඟි පාන අහස යට
පිල්කඩ උඩ ම ඇල වී ඉන්න හිතයි මට
මී අඹ කන්න ගිරවුනි එන්න එපා හෙට
මල් පිපුණාට ගෙඩි නෑ තාම අඹ ගහට

රන්කඳ සේ ම පින්සර මාගෙ ඇතු නිදන
රන්මල් යාන හීනෙන් දකින පින පමණ
තුන්පත් රෑන වේ දෝ කොහොම අප දෙදෙන
රන් කැටි පුතුට ඉඩ මදිවා ද මගේ යහන?

රාත්‍රී කාලයේ නිවසේ හුදකලාව දුකින් පසුවෙන ගම බිරිඳගේ ඇතුළු හද පිරී පවතින විරහ වේදනා සහිත ශෘංගාරාත්මක හැඟීම් කලාත්මක සංයමයෙන් යුතුව, රසවත්ව ඉහත ගී පද යුගලින් ධ්වනිත වේ. “පුන් සඳ රෑට ඇවිදින් ආලෝකමත් කර ඉරිඟු කරල් මත එල්ලෙන රන්වන් කෙඳි හා රන්වන් කරල් ඉඹිනව ද” කියා ඇය මනසින්, සැමියාගෙන් ප්‍රශ්න කරයි. එය, එම පද යුගලේ වාච්‍ය අර්ථයයි, මතුපිට අරුතයි. එහි ලක්ෂ්‍යාර්ථය මුළුමනින්ම වෙනස් වේ. එ තුලින් ධ්වනිත වන්නේ, සයනයෙහි තම සැමියා තුරුලෙහි ඇය හිඳින්නේ නම්, ඔහු සිප වැළඳ ගන්නා ආකාරයේ ශෘංගාරාත්මක හැඟීම් වේ.

රත්න ශ්‍රී විජේසිංහ මේ ගීතය ලිවීම සඳහා යොදා ගෙන ඇත්තේ සිව්පද විරිතියි. “හේනේ කළුව බිඳ”, “රන්වන් ඉරිඟු”, “මොටදැයි ගෙදර හිඳ”, “මී අඹ කන්න ගිරවුනි”, “පිල්කඩ උඩ ම ඇල වී” යන කාව්‍යෝක්ති ධ්වනිතකරන මනෝභාව අනුව මෙය ගොවිතැන ජීවනෝපාය කරගත් පිටිසර ගැමි යුවළකගේ දිවිය වටා ගෙතුණු ගැමි බිරිඳකගේ ඇතුළු හද පිරී පවතින විරහ වේදනා පිළිබඳ සංකීර්ණ රසවත් හැඟීම් සමුදායක් කියාපාන ගීයකි.

“සිසිල” සඟරාවේ 2023 ඔක්තෝබර් කලාපයෙහි පළ වූ පණ්ඩිත් අමරදේවයන් විසින් ගායනා කරන ලද, මේ ගීතයට තරමක් සමාන අන්තර්ගතයකින් යුක්ත වූ “පිලේ පැදුර හේනට අර ගෙන යනවා” යන සුභාවිත ගීත රස විඳීම කියවා, සසඳා බැලීම නිරෝෂා විරාජිණී ගයන මේ “පුන්සඳ රෑට ඇවිදින්” ගීයේ රස වින්දනයට පිටුවහලක් වෙනු ඇත.

නිවහනින් ඈත පිහිටි ඉරිඟු හේන වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම ජීවිකාව සඳහා කළ යුතු අත්‍යාවශ්‍ය කටයුත්තකි. රාත්‍රිය නිදි වරා හේන රැක වෙහෙස වූ ගොවියා තම නිවසට පැමිණ දිවා කාලය නිදා ගැනීම දින චරියාවයි. අඹු සැමියන් ලෙස කළ යුතු ආදර කතා ඇතුළු සියලු ක්‍රියාකාරකම් සඳහා එනිසා අවස්ථාව නැත.

පුන්සඳ රෑට ඇවිදින් හේනේ කළුව බිඳ
රන් කෙඳි සේම රන්වන් ඉරිඟු ඉඹිනවද?

තුන් යම හීන දැක දැක මොටදැයි ගෙදර හිඳ,
රන්කඳ තාම පැල් රකිනවාදෝ නිදි නැති ද?

“තුන් යම හීන දැක දැක” යන රමණීය කාව්‍යෝක්ති තුළින් ධ්වනිත වන්නේ මුළු රාත්‍රී කාලය, සැමියාගේ ආදරයේ සැනසුම අහිමිව මනෝ ලෝකයක දුකෙන් පසු වන ඇගේ හදෙහි සැඟවුණු මහත් වූ අසහනයයි. “රන්කඳ තාම පැල් රකිනවදෝ” යන කාව්‍යමය පදවැල ඇගේ අසහනයෙන් පිරි හදවතේ කැඩපතකි. “රන්කඳ” කියා ඇමතීම, සැමියා කෙරෙහි ඇගේ හද තුළ ඇති, ආදරය පිරි භක්ති ප්‍රේමය කෙතරම් දැයි ධ්වනිත කරයි. “නිදි නැති ද?” යැයි ප්‍රශ්න කරන්නේ, “අනේ මට හේනේ පැලට ගොස් ඔහුට තුරුලුවන්නට ඇත්නම් මොන තරම් සැපතක් ද?” යැයි සිතට නැගෙනා අසහන හැඟීම් නිසා වේ.

නිල් තරු රෑන ඉඟිබිඟි පාන අහස යට
පිල්කඩ උඩ ම ඇල වී ඉන්න හිතයි මට

“පිල් කඩ” යනු කුඩා ගැමි නිවසක ආලින්දයෙහි, එනම් නිවසේ ඉදිරිපස වහලය පමණක් ඇති විවෘත කොටසේ,

හිඳගැනීමට හෝ හාන්සිවීමට සුදුසු ලෙස මැටියෙන් නිමකර ඇති කොටස වේ. නිවසේ ඇතුළට වී සිටීම පාළුව, කාන්සිය තව තවත් වර්ධනය කරන නිසා ඇය පිල් කඩ මත හාන්සි වී අහසට නෙත් යොමා සිටින්නීය. නිවී නිවී නැවත නිල් පාටින් බබළමින් පවතින තරු රාශිය දෙස ඇය නෙත් යොමා සිටින්නීය. “නිල් තරු රැන ඉඟි බිඟි පාන අහස යට” යන සිත්කළු කාව්‍යෝක්තිය ඇගේ මනසෙහි සැඟවී ඇති ශෘංගාරාත්මක හැඟීම් ධ්වනිත කරයි. එහි ලක්ෂ්‍යාර්ථය වන්නේ වෙනත් අඹු සැමියන් විඳිනා කම් සැප පිළිබඳ ව හැඟීම් ඇයගේ හදවත තුළ පහළ වන බවයි. සිය සැමියාගෙන් නොලැබෙන සුවය වෙනත් කෙනෙකුගෙන් ලැබීමේ හැඟීම් සිත තුළ පහළවන බව හැඟෙයි. එහෙත් “රන් කඳ” සේ භක්ති ආදරයකින් ගරු කොට සලකන සැමියාට එරෙහිව යාමට ඇගේ පතිභක්තිය අවසර නොදෙයි.

මී අඹ කන්න ගිරවුනි එන්න එපා හෙට
මල් පිපුණාට ගෙඩි නෑ තාම අඹ ගහට

දරුවෙකු නැතිකමේ අසහනයෙන් පෙළෙන ඇගේ හදවතේ පිරී ඇති දුක් කන්දේ තරම ගීපදමාලා රචකයා ව්‍යංග්‍යාර්ථ තුළින් පවසන්නේ විශ්මිත අලංකාරයක් සමගිනි.

රන්කඳ සේ ම පින්සර මාගෙ ඇතු නිදන
රන්මල් යාන හීනෙන් දකින පින පමණ
තුන්පත් රැන වේ දෝ කොහොම අප දෙදෙන
රන් කැටි පුතුට ඉඩ මදිවා ද මගේ යහන?

“රන් කඳක් සේ ම පින්වන්තකමින් ද ආඪ්‍ය වූ මගේ ස්වාමියා මට ඇත් රජෙකි. මගේ ප්‍රේමවන්ත ඇත් රජු නිදන යහනාව රන් මල් අතුරා අලංකාර කර ඇත. මට අත්වී ඇත්තේ ඒ සැපවත් යහනාව හීනෙන් දැකීමේ පින පමණි. ඔහු සමග එහි නිදියන්නේ කවදා ද?” යැයි ව්‍යංගයෙන් ඇය පවසන්නේ හේනේ පැලේ රාත්‍රියට සැමියා නිදියන සයනයෙහි ඔහු සමඟ එක්ව නිදාගැනීමට නොලැබීමේ දුක් වේදනාවයි. එය සැබෑ අරුත නොවුණ ද, කලාත්මක ඇසින් සිතා, මෙහි තුන්පත් රැන ලෙස සළකා ඇත්තේ ඇතා, ඇතින්න හා අලි පැටියා යන තුන් කට්ටුව බව පෙනේ. එම සංකේතය ධ්වනිත කරන්නේ “දරු පැටියෙකු ලබා තම පවුල තුන්පත් රැන වන්නේ කෙදිනක දෝ?” යැයි ලතවෙමින් ඇය පසුතැවෙන දුක්මුසු ආකාරයයි. “රන් කැටි පුතුට ඉඩ මදිවා ද මගේ යහන?” යන භාවපූර්ණ කාව්‍යෝක්තියෙන් ධ්වනිත වන්නේ ඇගේ කුස දරුවකු පිළිසිඳ ගැනීමට සුදුසු නැද්ද යන දුක්ඛිත හැඟීමයි.

පද රචනය: ගීයේ වස්තුබීජය පිටිසර ගැමි ගොවි පවුලක ප්‍රශ්නයකි. ගීතය ගැමි සිව්පද විරිතින් ලිවීමත්, ගැමි වහරේ එන වදන් මාලාවක් තෝරා ගැනීමත් මෙහි ඇති කැපී පෙනෙන උසස් ලක්ෂණයකි. “හේනේ කළුව බිඳ”, “රන් කෙඳි සේම රන්වන් ඉරිඟු”, “තුන් යම හීන මොටදැයි ගෙදර හිඳ”, “පිල්කඩ උඩ ම ඇල වී”, “පැල් රකිනවා දෝ” යන භාවපූර්ණ යෙදුම් ගැමි වහර ඇසුරින් ගොතා ඇත.

“රන්කඳ සේ ම පින්සර මාගෙ ඇතු නිදන”, “තුන්පත් රැන වේ දෝ”, “නිල් තරු රැන ඉඟි බිඟි පාන අහස යට” යන රමණීය කාව්‍යෝක්ති නිර්මාණයේ දී වචන අර්ථය පමණක් නොව වචන ශබ්ද කිරීමේ දී නැගෙනා හඬ පිළිබඳව ද සිතා වචන එකිනෙකට සම්බන්ධ කර ඇත. ශබ්ද ධ්වනිය, අර්ථය තීව්‍රවීම සඳහා ගැළපෙන සේ නිර්මාණය කර තිබීම පදමාලාවේ උසස් ලක්ෂණයකි.

ගොවි බිරිඳගේ හද තුළ සැඟවී ඇති සංකීර්ණ මනෝභාවයන් ධ්වනිත කිරීමට ගැමි වහර ඇසුරින් ගොඩ නගා ඇති යෙදුම් යොදාගෙන ඇති ආකාරය ඉතා සාර්ථක වී ඇත. සහෘද මනස ගී රසයෙන් චමත්කාරයට පත්කිරීම සඳහා භාෂාව යොදාගෙන ඇති ශූර ආකාරය ගීපද රචකයාගේ අපූරු ප්‍රතිභා ශක්තිය විදහාපායි.

තනුව, සංගීත නිර්මාණය සහ ගායනය: විරහ වේදනාව හා මවක වීමේ ආශාව ඉටු නොවීමේ ප්‍රබල අසහනකාරී චිත්තවේග මේ ගීතයේ පද මාලාවෙන් ධ්වනිත වේ. තනුව හා සංගීත නිර්මාණය, ගායනය යන කලා ශිල්ප තුන එම සංකීර්ණ හැඟීම් තීව්‍ර ලෙසත් වඩා මිහිරි ලෙසත් ප්‍රකාශවීමට දායක විය යුතුය. ගොවි බිරිඳගේ හද තුළ සැඟවී ඇති දුක්බර හැඟීම් වචන රහිතව ප්‍රකාශ විය යුතුය.

ගායනය අතරතුර යොදා ඇති බටනළා වාදනය ඇතුළු සංගීත වාදන කණ්ඩය, ගැමි බිරිඳගේ හද තුළ පිරී පවතින දුක්බර හැඟීම් ධ්වනිත කරයි. ගිටාර් වාදනය සහ රබාන වැයීම තුළින් කුමක් බලාපොරොත්තු වී තිබේ ද? රාත්‍රී කාලයේ පිළ උඩ හාන්සි වී සිටින විට වටපිටාවෙන් ඇසෙන ගුප්ත ශබ්ද නිසා ඇගේ හදට බියක් හැඟෙයි නම්, එම තිගැස්ම ධ්වනිත කිරීමට එම වාදන සුදුසු වේ. එහෙත් බිරිඳගේ හදවත පෙළෙන්නේ බියකින් නොවේ. විරහ දුකේ අසහනකාරී, අනුරාගී හැඟීම් සමුදායකිනි.

යොවුන් හඬකින් යුත් නිරෝෂා විරාජිනී ගායනයේ දී එම දුක්බර හැඟීම් ධ්වනිත කිරීමට උචිත ලෙස ගායන ස්වරය හැසිරවීමට හොඳ උත්සාහයක් ගන්නා බව හැඟෙයි. ගොවි බිරිඳගේ හද තුළ ඇති සරාගී සංකීර්ණ හැඟීම් නිසි පරිදි ධ්වනිත කිරීම සඳහා උත්තර භාරතීය රාගධාරී සංගීත සම්ප්‍රදාය අනුව හික්මවන ලද ගායන හැකියාවක් අත්‍යාවශ්‍ය වේ.

මනෝභාවයන් පිරී ව්‍යංග්‍යාර්ථ වලින් පොහොසත් පද මාලාව ගීතයට අලංකාරයකි. තනුව, සංගීත නිර්මාණය, සහ ගායනය ගීතයේ හැඟීම් තීව්‍ර කරයි. උචිත පද මාලාව, තනුව හා සංගීත නිර්මාණය, ගායනය අංගවලින් පොහොසත් “පුන් සඳ රැට ඇවිදින්” රසවත් සුභාවිත ගීයකි.

- කරුණාසේන කහටපිටිය
[karunasena_k@yahoo.com.au]

පරිවර්තන සාහිත්‍යයෙන්

බිරිඳ

ඇන්ටන් චෙකොෆ් ලියූ Супруга (1895) නම් කෙටිකතාවේ පරිවර්තනය පාලිත ගනේවත්ත

"මම මෙයාට කියල තියෙනව මගේ මේසෙ අස්පස් කරන්ට එපායි කියල," නිකලයි එව්ග්‍රාෆිච් කිවේය. "මෙයා අස්කරාට පස්සෙ කිසිම දෙයක් හොයාගන්ට බෑ. කෝ ටැලිග්‍රෑම් එක? කොහාටද ඒක වීසිකරේ? හොයල බලන්නෙ නැද්ද? ඒක ඊයෙ කසාන් වලින් ආපු එකක්."

ඉතා සිහින් සුදුමැලි සිරුරකින් හා උදාසීන මුහුණකින් යුත් ගෘහ සේවිකාව මේසය යට වූ කුඩයෙන් විදුලිපුවත් කිහිපයක් ගෙන වෛද්‍යවරයාට දුන්නාය. ඒ සියල්ලම නගරයේ රෝගීන්ගෙන් ලැබුණු විදුලි පුවත් ය. ඉන්පසුව ඔව්හු විසිත්ත කාමරයේත්, ඔල්ගා ද්මිත්‍රියෙව්නාගේ කාමරයේත් එම විදුලි පුවත සොයන්නට වූහ.

වේලාව රාත්‍රී එක පමණ විය. තම බිරිඳ දැන් ම ගෙදර නොඑන බවත් ඇය එන විට අඩු වශයෙන් පාන්දර පහ පමණ වන බවත් නිකලයි එව්ග්‍රාෆිච් දැන සිටියේය. ඔහු ඇය විශ්වාස නොකළ අතර ඇය ගෙදර ඒමට බොහෝ ප්‍රමාද වූ විට දැඩි වෙහෙස වුව ද නොනිදා සිටියේය. තම බිරිඳ ද, ඇගේ ඇඳ රෙද්ද හා ඇය හැඩවැඩ වෙන කන්ණාඩිය ද ඇගේ චොක්ලට් පෙට්ටි පමණක් නොව කවුදෝ විසින් දිනපතා එවන මුළු ගෙය පුරා මල් සාප්පුවක මෙන් ඉම්හිරි සුවඳක් විහිද වූ ලැවැන්ඩා හා හයසින්ත් මල් මිටි ද ඔහු පිළිකුල් කළේය. එවැනි රාත්‍රීවල දී ඔහුගේ සිත හිතුවක්කාර විලාසයෙන් ඇගේ වැරදි සොයන්නට විය. ඊයේ තම සොහොයුරාගෙන් ලැබුණු විදුලි පුවතේ උත්සව සුභපැතීමක් හැර වෙන කිසිවක් නොවූ නමුත් එය දැන් ඉතාම අවශ්‍ය දෙයක් ලෙස ඔහුට දැණින.

තම බිරිඳගේ කාමරයේ මේසය මත ලියුම් කරදාසි සහිත පෙට්ටියක් යට තිබූ විදුලිපුවතක් දුටු ඔහු එය රැගෙන කියවා බැලුවේය. ඔහුගේ නැන්දම්මාගේ නමට එවා තිබුණු ඒ විදුලිපුවත ඔල්ගා ද්මිත්‍රියෙව්නාට බාර දෙන ලෙස දන්වා තිබිණ. මොන්ටි-කාලෝ සිට එය එවා තිබුනේ මිෂෙල් නමැත්තෙකි. එහි විදේශීය බසකින්, ඇතැම් විට ඉංග්‍රීසි බසින්, ලියා තිබූ එක වදනක්වත් වෛද්‍යවරයාට නොවැටහිණ.

"කවුද මේ මිෂෙල්? මොකද මොන්ටි-කාලෝ ඉඳන්? ඇයි නැන්දම්මාගේ නමට?"

සිය හත් අවුරුදු විවාහ ජීවිතයේ දී බොහෝ දේ ගැන සැකකරන්ටත්, සාක්කි පසුපස එළවන්ටත් ඔහු පුරුදු පුහුණු වුයේය. ගෘහ ජීවිතයේ ලත් ඒ අත්දැකීම් අනුසාරයෙන් තමනට දක්ෂ රහස් පරීක්ෂකයකු විය හැකි බව ඔහුට සිතුණු වාර බොහෝ ය. තම කාමරයට එමින් කල්පනා කරන්ට වූ ඔහුට මෙයට අවුරුදු එක හමාරකට පමණ පෙර බිරිඳත් කැටුව පීටර්ස්බර්ග් නගරයේ සංචාරය කළ විට හමු වූ තම පාසල් සගයකු වූ මහාමාර්ග ඉංජිනේරුවකු සමග සන්ථාගාරයක දී උදේ ආහාරය ගත් සැටි සිහියට නැගිණ. එම මිතුරා විසින් තමන්ටත් තම බිරිඳටත් අවුරුදු විසිදෙකක, විසිතුනක පමණ තරුණයකු හඳුන්වා දුන් සැටි ඔහුට මතක් විය. මිහයිල් ඉවානවිච් නම් වූ ඔහුට වූයේ තරමක් අමුතු "රීස්" නමැති වාසගමකි. දෙමසකට පසු ඔහුගේ ඡායාරූපයක් බිරිඳගේ ඇල්බමයේ තිබෙනු වෛද්‍යවරයා දුටුවේය. "වර්තමානයේ සිහිවටනයක් හා අනාගතය ගැන බලාපොරොත්තුවක්" යනුවෙන් ඒ ඡායාරූපය යටින් ප්‍රංශ බසින් ලියා තිබිණ. ඉන්පසු එම තරුණයා නැන්දම්මාගේ නිවසේ දී දෙවරක් ම ඔහුට හමුවිය. තම බිරිඳ නිතර නිතර ගෙදරින් බැහැර යන්ටත්, පාන්දර හතරට පමණ ගෙදර ඒමටත්, විදේශ ගමන් බලපත්‍රයක් ලබා දෙන ලෙස ඔහුගෙන් අයැද සිටින්ටත් වූයේ ඒ දිනවල ය. ඔහු එය ප්‍රතික්ෂේප කළේය. ඒ දිනවල

දිනපතාම වාගේ ගෙදර පැවති රණ්ඩු දබර නිසා ගෘහ සේවිකාව ඉදිරියේ ඔහු මහත් ලැජ්ජාවට පත්විය.

හය මාසයකට පෙර ඔහුට ක්ෂය රෝගය වැළඳීමට ඉඩ ඇති බව තීරණය කළ යහළු වෛද්‍යවරු සියළු දේ අතහැර විවේක ගැනීම සඳහා ක්‍රිමියාවට යන ලෙස ඔහුට අවවාද කළහ. ඒ බව දැනගත් ඔල්ගා ද්මිත්‍රියෙව්නා මහත් දයා කරුණාව දක්වමින් ක්‍රිමියාව සීතල බවත් පාලු බවත් කියමින් නීස් නගරය එයට වඩා සුවදායක බව පැවසුවාය. ඇයත් ඔහු සමග එහි යාමට එන බවත් ඔහුට කැමබීම සපයමින් සාත්තු කරමින් ඔහු රැක බලාගන්නා බවත් නිතර නිතර කියන්නට වුවාය.

තම බිරිඳට නීස් නගරයට යාමට එතරම් ඕනෑ වූයේ කුමක් නිසාදැයි දැන් ඔහුට වැටහෙයි. ඇගේ මිෂෙල් වාසය කරන්නේ මොන්ටි-කාලෝවල ය.

ඉංග්‍රීසි රුසියානු ශබ්ද කෝෂයක් ගත් ඔහු විදුලිපුවතේ වදන් එකින් එක රුසියානු බසට පෙරළමින් හා අනුමාන කරමින් හෙමින් සීරුවේ මෙවැනි වැකියක් සැදුවේය.

"මගේ අදරැති පෙම්වතියගේ ශරීර සනීපය වෙනුවෙන් මී විත පුරමි. ඔබේ සිඟිති පාදය දහස් වරක් සිපගනිමි. ඔබ එනතුරු නොඉවසිල්ලෙන් බලා සිටිමි"

තම බිරිඳ සමග නීස් නගරයට යාමට එකඟ වූයේ නම් තමා කොතරම් කවට අසරණ තත්වයකට පත්වනු ඇත්දැයි ඔහු සිතා ගත්තේය. අධික ලජ්ජාවෙන් යාන්තමින් ඇඬීම නවතාගත් ඔහු දැඩි නොසන්සුන් බවකින් හැම කාමරයක ම ඇවිදින්නට වූයේය. ඔහුගේ ආඩම්බරයත්, පිළිකුළත් කෝපයට හැරුණේය. අත මිට මොලවාගත් ඔහු පිළිකුළෙන් නළල රැළි ගන්වමින් ග්‍රාමීය දේවගැතිවරයකුගේ පුතකු වූ තමන් වැනි සෘජු ගති පැවතුම් ඇති දැඩි මිනිසකු හා ශල්‍යවෛද්‍යවරයකු මෙවැනි වහල් බවකට හා නොවටිනා දුබල දීනත්වයකට පත් වූයේ කුමක් නිසාදැයි තමාගෙන් ම ප්‍රශ්න කළේය.

"සිඟිති පාදය," විදුලි පුවත පොඩි කරමින් ඔහු මිමිණුවේ ය, " සිඟිති පාදය!"

ඔහු ඇයට ප්‍රේමකරන්ට පටන් ගෙන, ඇයට විවාහ යෝජනා කොට, අනතුරුව විවාහයෙන් පසු හත් වසරක් ගෙවී ගිය තැන දැන් ඉතිරි වී ඇත්තේ සුවඳ විහිදෙන දිග කෙස්වැටි, සිනිඳු ලේස් හා සිඟිති පාද පිළිබඳ මතක පමණි. නිසැකවම එය ඉතා කදිම ඉතා සිඟිති පාදයකි. පෙර සිප වැළඳ ගැනීම්වලින් දැන් ඉතිරිව ඇත්තේ සේද රෙදි හා රේන්ද දෑතෙහි හා මුවෙහි ගැටීමෙන් නැගුණු මතකය පමණක් යයි ද ඔහුට සිතිණ. සිහිවිකල්වීම්, කෑ මුර ගෑම්, තර්ජන හා වංචාකාරී බොරු හැර වෙන කිසිත් නැත. තම පියාගේ ගම්මානයේ දී, මිදුලේ සිට හිටිගමන් ගෙතුළට පියඹා එන කුරුල්ලකු ඒ මේ අත වේගයෙන් හැපීම නිසා බඩු මුට්ටු විසිවී යන සැටි ඔහුගේ මතකයට නැගිණ. මේ කාන්තාව ද ඒ ලෙසින්ම සහමුලින්ම නොගැලපෙන පරිසරයකින් පැමිණ, තමාගේ ජීවිතය තුළට පිවිස, එය නොසන්සුන් කර ඇත. ඔහුගේ ජීවිතයේ සුන්දරම කාලය අපායේ ගත කළාක් මෙන් ය. ජීවන සතුට පිළිබඳ බලාපොරොත්තු සුනු විසුණු වී ගොස් ය. ඔහු රෝගියකු බවට පත්ව ඇත. ඇගේ කාමරය අනාචාරයේ හැසිරෙන ඉහළ පැලැන්තියේ කාන්තාවකගේ මෙන් දිස්විය. වසරකට ඔහු උපයන රූබල් දස දහසෙන් තම මහළු මවට රූබල් දහයක්වත් යැවීමට ඔහුට නොහැකි විය. ඔහු රූබල් පන්දහසක් ණය වී සිටියේය. ඔහුගේ නිවසේ මැරවරයන් පිරිසක් නැවතී සිටියත් මේ ගැහැණිය සමග ජීවත්වීම තරම් තම ජීවිතයට විනාශයක් නොවනු ඇතැයි ඔහුට සිතිණ.

ඔහු කහින්නට වූ අතර හුස්ම ගැනීමේ අපහසුතාවයක් ද දැණින. ඇඳ ඇතිරිලි අතරට වැද උණුසුම් සුව නින්දක් වුවමනා වුව ද ඔහුට නිදා ගැනීමට නොහැකි විය. වරක් ඔහු කාමරයේ ඒ මේ අත ඇවිදිමින් හෝ බංකුවක හින්ද ගනිමින් කල් ගත කළේය. ඇතැම්විට පන්සලක් ගෙන කඩදාසියක එක්වරම මෙසේ ලීවේය.

"පැන පිරික්සීම... සිඟිති පාදය..."

පාන්දර පහ පමණ වන විට ඔහුට දැඩි අප්‍රාණික බවක් දැණින. මේ සියල්ල සඳහා ඔහු තමන්ටම දොස් පවරා ගත්තේය. ඇයට ආලය කරන අයකු සමග ඔල්ගා ද්මිත්‍රියෙව්නා විවාහ වුවහොත් ඇය කරුණාබර අවංක ගැහැණියක වීමට ඉඩ ඇතැයි එවේලේ ඔහුට සිතිණ. කවුද දන්නෙ? තමන් ගැහැණියකගේ සිත නොහඳුනන දුර්වල මානසික වෛද්‍යවරයකු බව ඔහුට සිතිණ.

"මට තව වැඩි කලක් නෑ ජීවත් වෙන්ට," ඔහු සිතුවේය. "මං මළ කඳක් වගේ. ජීවත් වන අයට බාධා කරන්ට හොඳ නැහැ. තමන්ගේ අයිතිවාසිකම් ගැන කතා කිරීම මෝඩ අනවශ්‍ය දෙයක් වෙන්ට පුළුවන්. එයා ආදරය කරන කෙනෙක් එක්ක ගියාවෙ. එයාට මගෙන් දික්කසාද වෙන් ඉඩ දෙන්නම්, වරද මම බාර ගන්නම්."

අවසානයේදී ඔල්ගා ද්මිත්‍රියෙව්නා පැමිණියාය. ඇඳ සිටි සුදු කබායත්, හිස් වැස්මත්, පාවහන් යුවළත් නොගලවා කාමරයට පැමිණි ඇය සෝපාව මතට වැටුණාය.

"හරි එපා කරපු මහත කොල්ලා," තදින් හුස්ම ගනිමින් පැවසූ ඇය සුසුමක් හෙලුවාය. "හරිම වංකයි, හරිම පිළිකුල්!"

ඇය අඩිය පොළොවේ ගැසුවාය, "මට බෑ මට බෑ මට බෑ මයි."

"මොකද වෙලා තියෙන්නේ," නිකලයි එව්ග්‍රාෆිච් ඇය වෙත එමින් ඇසුවේය.

"දැන් මාව ඇරලන්ට ආපු කොල්ල, අසර්බේකව්, මගේ බෑග් එක නැති කරා. ඒකෙ රූබල් පහළොවක් තිබුණා, මම අම්මගෙන් ඉල්ලා ගත්තු සල්ලි."

ඇය පුංචි දැරියක මෙන් මහ හඬින් වැළපුනාය. ඇයගේ ලේන්සුව පමණක් නොව අත්වැසුම් පවා කඳුලින් තෙත්වී තිබිණ.

“ඉතින් මක් කරන්නද?” වෛද්‍යවරයා සුසුමක් හෙළුවේය. “නැතිවුණා කියන්නෙ නැතිවුණා, දැන් කලබල වෙලා වැඩක් නෑ. මට මෙයා එක්ක කතා කරන්ට ඕනෑ.”

“මං මහා ලොකු සල්ලිකාරයෙක් නොවෙයි ඔය වගේ සල්ලි නාස්ති කරන්ට. ඒ ළමය කියනව එයා මට සල්ලි දෙන්නම් ලු. ඒ උනාට මට විශ්වාස නැහැ. ඌ දුප්පත් කොල්ලෙක්.”

සන්සුන් වී තමාට සවන් දෙන ලෙස සැමියා කොතෙක් කීවත් ඇය අර ළමයා ගැනත්, නැති වූ රූබල් පහළොව ගැනත් කතා කරන්නට වුවාය.

“ආ! හා. මම මෙයාට රූබල් විසිපහක් දෙන්නම්, වඳින්නම් කෑගැහිල්ල නවත්තන්න,” ඔහු දැඩි නොසන්සුන් බවකින් කීවේය.

“මට ඇඳුම් මාරු කරන්න ඕන” යි ඇය හැඬුම අතරින් කීවාය. “මට මේ හිම කබාය ඇඳගෙන ඔය වගේ දේවල් ගැන කතා කරන්ට බැහැ.”

ඔහු ඇගේ හිම කබාය හා පාවහන් ගලවන අතර ඇය කෙරෙන් සුදු වයින් සුවඳක් වහනය විය. ඒ ඇය කාවාටියන් කන අතර බීමට ප්‍රිය කළ වයින් වර්ගයයි. (ඉතා සැහැල්ලු සිරුරකින් හෙබිවුව ද ඇය බොහෝ කොට කෑමටත් වයින් බීමටත් පුරුදුව සිටියාය.) තම නිදන කාමරයට ගිය ඇය මඳ වේලාවකට පසු ඇඳුම් මාරු කරගෙන ආවාය. මුහුණ පුරා වත්සුණු තවරා තිබුණු අතර ඇගේ දෑස ඇඬීම නිසා ඉදිමී තිබිණ. ඇය තමා ඇඳ සිටි රෝස පාට රේන්ද ඇල්លූ ඇඳුමෙහි ගිලී සිටි අතර වෛද්‍යවරයාට හඳුනාගත හැකි වූයේ හැම තැනම විසිරුණු ඇයගේ කෙස් වැටිය හා සහ ඇගේ සිඟිති පාද පමණි.

“මොකක්ද මගෙන් අහන්ට ඕනෙ,” ඇය හිඳ සිටි පුටුව පද්දමින් විමසුවාය.

“මේක මට අහම්බෙන් වගේ හම්බවුණා,” යි කියූ වෛද්‍යවරයා විදුලිපුවත ඇයට දුන්නේය.

“ඉතින් මොකක්ද?” ඇය ඇය පුටුවේ පැද්දීම වැඩි කරමින් තෙපළාය. “අලුත් අවුරුද්දට සුභ පතල එවපු එකක්. වෙන මුකුත් නෑ. කිසිම රහසක් නෑ.”

“මෙයා හිතනවා ඇති මං ඉංග්‍රීසි දන්නේ නැති නිසා මේකෙ තියෙන්නෙ මොකක්ද කියල තේරුම් ගන්ට බැරුව ඇති කියල. ඔව්, මං ඉංග්‍රීසි දන්නෙ නෑ. ඒ උනාට මට ඉංග්‍රීසි-රුසියානු ශබ්ද කෝෂයක් තියෙනවා. මේ ටැලිග්‍රෑම් එක රීස් ගෙන්. තමන්ගේ පෙම්වතියගේ ශරීර සනීපය වෙනුවෙන් ඔහු මී විත පුරනවා. මෙයාව දහස් වරක් සිප ගන්නවා. කමක් නෑ, කමක් නෑ, ඒක එහෙම තිබ්බ්වාවෙ,” ඔහු කලබලයෙන් කියාගෙන ගියේය. “මම මෙයාට දොස් කියනව නොවෙයි. කලකෝලාහල, රණ්ඩු දබර ඕනෙ නෑ. රණ්ඩු දබර කෝලාහල වෙච්ච ඒව හොඳටම ඇති. දැන්වත් මේක කෙළවරක් කරන්ට ඕනෑ. ඔන්න මට මෙච්චරයි කියන්ට තියෙන්නෙ, මෙයා දැන් මගෙන් නිදහස්, ඕන විදියකට ජීවත් වෙන එකයි ඇත්තෙ.”

මඳ වේලාවක් ඔවුහු නිහඬව සිටියහ. ඇය සෙමින් හඬන්නට වුවාය.

“මාව රැවැට්ටීමේ හා බොරු කීමේ අවශ්‍යතාවයෙන් මම මෙයාව නිදහස් කරනවා” යි නිකලයි එව්ග්‍රාෆිච් තව දුරටත් කිවේය. “ඒ ඉලන්දාරියට කැමති නම් එයාට ප්‍රේම කරන එකයි ඇත්තෙ. එයා ළඟට පිටරටට යන්ට ඕන නම් යන එකයි ඇත්තෙ. මෙයා තරුණයි, නිරෝගියි. මම ලෙඩා. මට තව වැඩි කලක් නෑ ජීවත් වෙන්ට. කොටින්ම කියනවනම් මෙයාට මං කියන එක තේරෙනෙවනෙ...,” ඔහු කොතරම් කලබල වී සිටියේ ද කිවහොත් තව දුරටත් කතා කරන්ට නොහැකි විය.

තමා රීස්ට ප්‍රේම කරන බවත්, ඔහු සමග නගරයේ නොයෙක් තැන සැරිසැරූ බවත්, ඔහුගේ නවාතැනට ගිය බවත්, දැන් ඇයට ඔහුව මුණගැසීමට පිටරටට යාමට ඉතාම උවමනා බවත්, ආත්මානුකම්පාව ඇති වූ විට කතා කරන්නාක් වැනි ඇඬුම් හඬින් ඔල්ගා ද්මිත්‍රියෙව්නා පැවසුවාය.

“ජේනවද මම කිසිම දෙයක් හංගන්නේ නෑ?” ඇය සුසුමක් හෙළමින් තෙපළාය. “හිතේ තියෙන ඔක්කොම කියනව. අනේ මං වඳින්නම් මට පාස්පෝට් එකක් අරන් දෙන්න.”

“මං ආයිත් කියන්නෙ. මෙයාට ඕන දෙයක් කරන්න.”

ඔහුගේ මුහුණ හොඳින් බලාගත හැකිවන පරිද්දෙන් ඇය ඔහු ළඟ පුටුවක හිඳ ගත්තාය. ඔහුව විශ්වාස නොකළ ඇයට ඔහුගේ සිත තුළ සැඟවී ඇති අදහස් දැන ගැනීමට උවමනා විය. කවරදාකවත් කිසිවකු විශ්වාස නොකළ ඇය කවර යහපත් අරමුණකින් සිදු කළ දෙයක් දෙස වුව ද සැක සහිතව බැලීමටත්, ඒ තුළින් තම ආත්මාර්ථකාමී අරමුණු ඉටුකරගැනීමටත් මාන බැලුවාය. දැඩි කුතුහලයෙන් ඔහුගේ මුහුණ දෙස බලා සිටින ඇයගේ දෙඇස බැළලියකගේ දෑස් මෙන් කොළ පැහැයෙන් දිලිසෙන්නක් මෙන් පෙණින.

“කවද්ද මට පාස්පෝට් එකක් අරන් දෙන්නෙ?” ඇය පහත් හඬින් ඇසුවාය. “කවදාවත් නෑ” යැයි එක්වරම කියන්ට සිතුනත් ඔහු ඒ අදහස මැඩගෙන මෙසේ කිවේය.

“කැමති දවසක.”

“මම යන්නෙ මාසෙකට විතරයි.”

“මෙයා රීස් ළඟට යන්නෙ හැමදාට ම. මං දික්කසාද වෙනව. රීස්ට කැමති නම් මෙයාව විවාහ කරගන්ට පුළුවන්.”

“දික්කසාද වෙන්ට මට ඕනෙ නෑ,” ඔල්ගා ද්මිත්‍රියෙව්නා විස්මය පළ කළ මුහුණින් යුතුව උස් හඬින් කීවාය. “මාව

දික්කසාද කරන්ට එපා. මට පාස්පෝට් එකක් අරන් දෙන්න, එච්චරයි!"

"මොකද මෙයා දික්කසාද වෙන්ට අකමැති?" වෛද්‍යවරයා නොසන්සුන් වෙමින් පැවසීය.

"මෙයා පුදුම ගැණියෙක්, හරිම පුදුම ගැණියෙක්. මෙයා මුළු හිතෙන්ම එයාට කැමති නම්, එයත් මෙයාට ආදරේ නම් ඒ තත්වෙ යටතේ දෙන්නා විවාහවීම හැර වෙන විකල්පයක් නැහැ. කසාද නොබැඳ අනියම් බිරිඳ වගේ ඉන්ට නම් ලැස්ති වෙනව එහෙම නොවෙයි."

"ඔව් මට තේරෙනවා," ඔහු වෙතින් ඉවත්ව යමින් ඇය තෙපළාය. ඇගේ මුහුණ ක්‍රෝධයෙන් හා පළිගැනීමේ චේතනාවෙන් බරවුණු ස්වරූපයක් ගෙන තිබිණ. "ඔව් මට හොඳට තේරෙනවා, මෙයාට දැන් මාව එපාවෙලා. දැන් ඔය දික්කසාදෙ පිට දාල මගෙන් නිදහස් වෙන්ට හදනව. බොහෝම ස්තුතියි, මෙයා හිතන තරම් මෝඩ තකතීරු ගැණියෙක් නොවෙයි මම. ඔය දික්කසාදෙ මම බාරගන්නෙ නෑ. මං යන්නේ නෑ, යන්නේ නෑ, යන්නේ නෑ ම යි. අනිත් එක මම කැමති නැහැ මගෙ සමාජ තත්වෙ නැති කර ගන්න," තම කතාවට බාධා කරතැයි සිතන්නාක් මෙන් ඇය ඉක්මනින් කියාගෙන ගියාය. "අනෙක දැන් මට අවුරුදු විසි හතයි, රීස්ට අවුරුදු විසි තුනයි. අවුරුද්දක් ගියහම එයාට මාව එපාවෙලා මාව අත්හැරල දාවි, අනිත් එක මම මෙයාට දැනගන්ටයි කියන්නෙ... ඔය සම්බන්දෙ කොච්චර කල් තියාගන්ට පුළුවන්ද කියල මට කියාගන්ට අමාරුයි ඔන්න. තේරුනාද? මම එහෙම නොවෙයි මේ ගෙදරින් පිටට අඩියක්වත් තියන්නේ..."

"බැහැපන් එළියට මේ ගෙදරින්!" නිකලයි එව්ග්‍රාෆිච් පොළොවේ අඩි හප්පමින් ගිගිරුවේය. "පලයන් මගේ දෑහට නොපෙනී වලත්ත නීච අම්මණ්ඩි."

"හොඳයි බලමු මොකද වෙන්නෙ කියල," ඇය කාමරයෙන් පිටවූවාය.

ගෙයින් පිටත එළිය වැටී බොහෝ වෙලාවක් ගතවී තිබිණ. තවමත් මේසය ඉදිරිපිට සිටි වෛද්‍යවරයා කඩදාසියක පැන්සලෙන් ඉක්මනින් මෙසේ ලීවේය.

"ගරු මහත්මයාණනි, සිඟිති පාදය"

ඉන්පසු විසිත්ත කාමරයේ එහාටත් මෙහාටත් ඇවිද්ද ඔහු එහි තිබූ ඡායාරූපයක් අසල නැවතී බොහෝ වේලාවක් එය දෙස බලා සිටියේය. එය මීට හත් වසකට පෙර ඔහු විවාහ වූ අළුතම ගත් පවුලේ ඡායාරූපයකි. තම බිරිඳගේ පියාත්, මවත්, විසි හැවිරිදි ඔහුගේ බිරිඳත්, ප්‍රීතියෙන් ඇලලුණු තරුණයකු වූ ඔහුත් ඒ ඡායාරූපයේ සිටිති. ජ්‍යෙෂ්ඨ සිවිල් නිලධරයකු වූ ඔහුගේ මාමා ඉතා වංචාකර මසුරු මුහුණකින් යුතුව බලා සිටී. තරබාරු සිරුරකින් යුතු ඔහුගේ නැන්දම්මා උගුඩුවෙකුගේ මෙන් සිහින් කපටි මුහුණකින් යුතුය. තම දියණියට හැම අයුරින්ම උදව් කළ ඇය, දියණිය කිසිවකුගේ ගෙල හිර කළත් කිසිදු වචනයක් නොකීවාය. තම බිරිඳ වූ ඔල්ගා ද්මිත්‍රියෙව්නා ද සිහින් කපටි මුහුණකින් යුතු වුව ද, මවට වඩා බෙහෙවින් ඉස්මතු වූ උගුඩුවෙකුට වඩා මෘගයකු මෙන් දැඩි පරපුටු මුහුණකින් යුතුව බලා සිටිනවා යැයි වෛද්‍යවරයාට සිතිණ. නිකලයි එව්ග්‍රාෆිච් නිහතමාන පාසල් ශිෂ්‍යයකුගේ අවංක සිනහවක් මුවට නංවා ගෙන ඒ ඡායාරූපයේ සිටී.

"තරුණ කාලෙ ප්‍රේම කරල මියගියත් සැපයි," යනුවෙන් එකල ඔහු මිමිණූ ගීයක් ඔහුට මතක් විය. තම ඉරණම විසින් අහම්බෙන් ඔහුව තල්ලු කර දැමූ එම පරපෝෂිතයන් අතර ඔහු සිටින්නේ ඔවුන්ගේ සමාගමයෙන් තමාට ගෞරවයක් හා ජීවන සතුටක් ලැබේවිය යන බොළඳ බලාපොරොත්තුවකින් යයි ඡායාරූපය දෙස බලා සිටි ඔහුට සිතිණ.

ග්‍රාමීය දේවගැතිවරයකුගේ පුතකු වී දේවස්ථාන පාසලකින් අධ්‍යාපනය ලැබූ ඍජු සරල මිනිසකු වූ ඔහුට මෙතරම් අමනෝඥ, ප්‍රෝඩාකාරී, ව්‍යාජ, අඳබාල, තමාට සහමුලින්ම නොගැලපෙන කාන්තාවක සමග එක්වීමට සිදුවූයේ කුමක් නිසාදැයි ඔහු යළිත් වරක් මහත් විමතියෙන් යුතුව තමාගෙන්ම විමසුවේය.

පෙරවරු එකොළහට රෝහලට යාම සඳහා ඔහු කබාය ඇඳගත් විට ගෘහ සේවිකාව ඔහුගේ කාමරයට ඇතුළු වූවාය.

"මොකද?" ඔහු විමසීය.

"නෝනමහත්තයා නැගිටලා, ඊයෙ මහත්තය දෙනවා කිව්ව රූබල් විසිපහ ඉල්ලගෙන එන්න කිව්ව!"

- රුසියානු මුල් බසින් අනුවාදය **පාලිත ගනේවත්ත**
[pganewatta@gmail.com]

සිසිල ගැන ඔබේ අදහස් දැනුම්මට
ඔබේ නිර්මාණ එවීමට
sisila.sangarawa@gmail.com
සිසිල පිටපත් ලබා ගැනීමට
අනුග්‍රාහක දැන්වීම් සඳහා

කොට ගවුම් සහ දිග ගවුම්

2012 මාර්තු 15

රීජන්ට් වීදියේ නවාතැන් දොරින් ඇතුළුවත් ම හමුවන ප්‍රවේශ දොරටුව යොමුවූයේ තරුණියන් දෙදෙනාගේ කාමරය වෙතට ය. තරුණියන් සමග එකම නවාතැනක කල්ගෙවීම ලාංකික අපට සමීප අත්දැකීමක් නොවේ. පේරාදෙණියේ සහ කොළඹත්, ශ්‍රීපාලියේත් මා දන්නා සියලු ශිෂ්‍ය නේවාසිකාගාර ගැහැණු හා පිරිමි ලෙස වෙන් වශයෙන් පිහිටුවා ඇත.

රීජන්ට් වීදියේ නවාතැන ශිෂ්‍ය නේවාසිකාගාරයක් නොවූව ද, මෙහි ශිෂ්‍ය නේවාසිකාගාර බොහොමයක්ම කාන්තා හා පිරිමි දෙපක්ෂයට ම විවෘත වූ ඒවා විය. අපේ නවාතැනෙහි ද තරුණියන් දෙදෙනෙකු විසීම මා හැර අනෙත් කිසිවකුට පූර්ව අත්දැකීම් රහිත කාරණාවක් නොවී ය.

තරුණියන් දෙදෙනාගෙන් අයෙකු වූ චීන ජාතික තරුණිය හඳුන්වන ලද්දේ ක්‍රිස්ටල් යන නමිනි. ඇනී මෙන්ම ඕස්ට්‍රේලියානුවන්ට නුහුරු තම චීන නම වෙනුවට ඇය මෙම පටබැඳි නාමය භාවිතා කරන බව පෙනින. තරමක ලජ්ජාශීලී තරුණියක් වූ ක්‍රිස්ටල් චීන වැසියන්ට ආවේණික ලෙස පාද ළඟ ළඟම තබමින් වේගයෙන් නාන කාමරය හෝ කුස්සිය වෙත ඇවිද ගිය අතර සිය කටයුතු අහවර කළ වහාම කාමරයට වැද අතුරුදන් වූවාය. ඉඳහිට මුහුණට හමුවන අපෙන් කෙනෙක් ඇයට සුභ උදෑසනක් ප්‍රාර්ථනා කළහොත් සියුම් මදහසකින් ප්‍රතිඋත්තර දෙන ඇය ඉක්මණින්, තවත් වචනයකට ඉඩ නොතබා පලා යන්නීය. සරලවම කිවහොත් ක්‍රිස්ටල්ගේ කතා හැකියාව හා වචන නිකුත් කිරීමේ බලය ද නිවෙස් හිමි ඇනී වෙත පවරාගෙන ඇති බවට සැකයක් මා වෙත නැඟිනි. නොඑසේනම් අර තරම් කුඩා ශරීරයක් හිමි ඇනී මෙතරම් වේගයකින් වචන විදින්නේ කෙසේ ද?

පවුලින් නැමති ප්‍රංශ තරුණිය සිටියේ ක්‍රිස්ටල්ගේ විරුද්ධ පාර්ශවයේ ය. නිරතුරුව නිවස සෝෂාවකට හරවන ඇය හැකි සෑම නිමේෂයක ම පිරිමි පාර්ශවය සමග ගතකිරීම ප්‍රිය කළ බව දක්නට ලැබිණි. ප්‍රංශ සමාජයේ කාන්තාව පිළිබඳ අප සමාජයේ මුල් බැසගෙන ඇති, සත්‍යයක්ද හෝ මිත්‍යාවක් ද මා නොදන්නා, අදහස තරමක් සනාථ කරමින් පවුලින් හිටි අඩියේම මගේ කරමතින් මෙන් කරණම් ගසා ආලින්ද කාමරයේ සෝපාවට ප්‍රවේශවෙයි. ඉන්දීය පෙනුමැති මා වෙත එතරම් රුචියක් නොදැක්වූ ඇය ප්‍රංශ තරුණයින් දෙදෙනා සමගත්, බ්‍රසීල ජාතිකයා සමගත් දැඩි කුළුපගබවක් පෙන්වූවා ය. ඇය හැඳ සිටින ඇඳුම් අපේ අම්මා දුටුවහොත් කුමක් කියන්නට ඉඩඇතිදැයි මට අදහසක් නැත. කෙසේ නමුත් ඇය නිරතුරුව වැඩිපුර නිරාවරණය කළේ ශරීරයේ පහළ අර්ධය යි.

ශරීරය නිරාවරණයවන ඇඳුම් අඳින තරුණියන් ඕස්ට්‍රේලියාවේ සුලබ දසුනකි. ඉතා කෙටි කලිසම් හෝ සායවලින් සැරසී සිය කලවා සහ දෙපාවල සුන්දරත්වය නගරවාසීන් වෙත දැක්වීමට සිඩ්නි තරුණියෝ පසුබට නොවෙති. ඇතැම් විට දිගු සාය හෝ කලිසම් වලින් සැරසුණු තරුණියන්ගේ ඇඳුම් විනිවිදයමින් ඔවුනගේ යට ඇඳුම් වටපිටාවට හෙළි කෙරෙන අවස්ථා ද වේ.

“නිරුවතින් හිරුරැස් නාන එක එවැනි සංස්කෘතියක් තියෙන රටකට ප්‍රශ්නයක් නොවෙන්න පුළුවන්. ඒත් ඒක අපේ සංස්කෘතියට හුරු නැති නිසා, දුරස්ථ නිසා මෙහෙට ඒක ප්‍රශ්නයක්!”

පෙර දිනක යා-ටීවී වෙත අශෝක හඳගම දැක්වූ අදහසක් මගේ සිහියට එයි. අප රට තුළ අඩ නිරුවත ලෙස වෙන්කර දක්වන ඉහත කී ඇඳුම් ඇඳි තරුණියන් දැන් මට ද සාමාන්‍ය වූ දසුනකි. හිටිවනම දිගු සණ ඇඳුමකින් සැරසුණු ඉන්දීය හෝ අරාබි තරුණියක් මහ මග දකින මට ඇගේ ස්වරූපය පිළිබඳ සතුටක් ඇතිවෙයි. අප සංස්කෘතිය අපට හුරු කර ඇත්තේ අඩ නිරුවත් තරුණියන් දැක සෘජුව තුටුවන්නට නොව දිගුවට ඇඳි ඇඳුමෙන් සැරසුණු යුවතියන්ගේ රුවගුණ මනසින් විඳින්නට ය.

"අයියෝ සර්, සර් එහෙම කොටට අඳින කෙල්ලො දිහා වැඩිය බලන්න එපෝ!"

ෆේස්බුක් සංවාදයක දී මෙම කරුණ අසා නර්මදා දුන්නේ එවන් පිළිතුරකි. දුරුරටක වෙසෙන සිය හිතවත් මිතුරා (ගුරුවරයා) මෙවැනි විප්‍රයෝග හමුවේ විනාශ වී යනු ඇතැයි වැනි අදහසක් ශ්‍රී ලංකාවේ වෙසෙන අය තුළ ඇතිවීම සාමාන්‍ය කරුණකි. නර්මදා යනු මා ශ්‍රීපාලියෙන් පිටවන විට දෙවන වසරට පිවිස සිටි ශිෂ්‍යාවකි. ඇයත්, ඇගේ මිතුරියන් කැළත් ඉඳහිට ෆේස්බුක් අඩවියෙන් හෝ ස්කයිප් හරහා පිවිසෙමින් මගේ සුවදුක් විමසා බලති. මා රටින් පිට වන වග අසා වේදනාබරව කඳුළු සැලූ ඇතැම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැන් පෙනෙන්නට නැත.

"කොහොමත් ළමයි කියන උන් විශ්වාස කරන්න එපා. උන් අවස්ථාවාදියි. වැඩ ටික කෙළවර වුණාම අපි උන්නද මළාද හොයන්නෙ නෑ. ඒ උන්ගෙ හැටි"

ආනන්ද සර් වරෙක ශිෂ්‍ය මිතුදම් පිළිබඳ දුන්නේ එවන් උපදෙසකි. එහෙත් විශ්වවිද්‍යාලයෙන් බැහැරව ගොස් හිතවත්කමින් අප ගැන සොයා බලන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද නැත්තේ නොවේ. අනෙත් අතට උපාධිය ලැබූ පසු ගොරතර සමාජ අරගලයට බසින ඔවුනට අප සිහිකරමින් සිටින්නට කාලයක් නොතිබෙන්නට ද පුළුවන.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් වන අපට එක්වරම හමුවන නැවුම් සිසු කැළක් සමග වසර හතරක සබඳතාවක් ගොඩ නඟා ගැනුමට ලැබෙයි. ඇතැම් සිසු සිසුවියෝ සමාන හදැත්තන් ලෙස අපට ඉතා සමීප වෙති. පේරාදෙණියේදී මට හමුවූ දීපනී, සඳලි, රුවන්, මේනක වැන්නවුන් ද, ශ්‍රීපාලියේ දී හමු වූ චතුරංග, කලාබර, ජයරුවන්, රසාංගි, ප්‍රාර්ථනා වැන්නවුන් ද අයත්වන්නේ මෙම කාණ්ඩයට ය. මෙවැනි සිසු සිසුවියන්ගේ ජීවන අරගල, පෙම් සබඳතා, පෙම් අරගල, මිතුරු ගැටුම් හා අඩ දබර අතරට මැදිවන්නට සමීපත්වය වැඩිවත්ම අපට සිදුවෙයි. පේරාදෙණියේ ගතකළ ජීවිතයේ දී මෙන් නොව නිවසින් දුරස්ථව ගෙවූ ශ්‍රීපාලී ජීවිතයේ දී මගේ සමීපතමයින් වූයේ මෙම ශිෂ්‍ය මිතුරන් ය.

"සර් දන්නෙ නැහැ... මිහිරංග මුල් දවස්වල මාත් එක්ක යාළුවෙලයි හිටියෙ... දැන් එයා මාව මග අරිනව..."

මා හමුවට පැමිණ කඳුළු සලන්නට ගත් සරලා විස්තර කරන්නට වූවාය. හැඬීමෙන් රත් පැහැ වූ දෙනෙතත්, අපේක්ෂා භංගත්වය නිසා වේදනාවෙන් මිරිකුණු ඇගේ මුහුණත් මට අද ද සිහිපත් කර ගැනීම අපහසු නැත. වේදනාව පිට කරනු වස් හඬා වැළපෙන්නට යත්න දරන්නකුට ඊට ඉඩදීම යහපත් බැවින් මම නිහඬව ඇගේ කතාව අසා සිටියෙමි.

"සර් හිතයි මට පිස්සු කියල... එයා මුල ඉඳලම මට ලියපු සේරම කවි, ලියුම් මම පොතක අලවල තියෙන්නෙ..."

ඇය සිය ප්‍රේමය අවිහිංසක සතුටකින් විඳිමින් උන් බවට ඒ මනා සාක්ෂියක් වුව මම කිසිත් නොකීවෙමි.

"මම දන්නව කරන්න ඕන දේ! මම මේ පාර ගෙදරින් එනකොට ගෙනාව පිහියක්!"

එක්වරම ඇසුණු වදනින් මම ත්‍රස්ත වී ගියෙමි. එහෙත් කලබල වූ බවක් පෙන්වීම ඇගේ තත්වය සමනය කිරීමට ඇති නිසි ප්‍රවේශය නොවේ.

"ඒ කියන්නෙ ඔයා දැන් මිහිරංගට පිහියෙන් අනින්නයි යන්නෙ..?"

"නැහැ සර්... මට ඒක කියටවත් කරන්න බැහැ. මම එයාට ආදරෙයි. මම කොහොමද ඒක කරන්නෙ?"

"එහෙනම්?"

"අපි දෙන්න ගැලපෙන්නෙ නැති බව කියපු කෙනා මම දන්නව... මම පිහියෙන් අනින්නෙ ඌට..!"

වේදනාව සමග පුපුරා හැළෙන වෛරයක සේයාවක් දැන් ඇගේ මුහුණින් කියවාගත හැකි ය. මම සෙමින් කතා කරන්නට පටන් ගත්තෙමි.

"සරලා... මට ඔයාගෙ වේදනාව හොඳටම තේරෙනවා... ඒත් ඔයා කාටහරි පිහියෙන් ඇන්නම ආයෙ මිහිරංග ඔයා ළඟට එනව ද? ඒක එහෙම වෙන එක හොඳටම විශ්වාස නම් ඒක කලාට කමක් නැහැ!"

මගේ පළමු තර්කයෙන් මඳක් විශ්මයට පත්වූ සරලා කල්පනා කරන්නට වූවාය.

"ඔයාගෙ ප්‍රේම කතාව මාස කීපෙක එකක්. ඒත් අවුරුදු පහක ලව් ස්ටෝරි එකක් ඉවරකරල තමන්ගෙ ගර්ල් වෙන කෙනෙකු බැඳල රටින් පිටවෙලා යද්දි නිස්සද්දව ඒ දිහා බලා උන්නු කෙනෙක් මම දන්නව. එයාටත් තිබ්බ කාට හරි පිහියෙන් අනින්න. ඒත් මොනවද ලැබෙන්නෙ? ඒක තවත් අම්මෙකුට වේදනාවක් හදල දෙන වැඩක් විතරයි නේද? ඔයා ටිකක් කල්පනා කරන්න තනියම... ළඟ තියාගෙන ඉන්නකොට පාවිච්චි කරන්න හිතෙනව නම් ඔයාගෙ පිහිය මට ගෙනත් දෙන්න."

සරලාගේ කඳුළු සෙමෙන් වියැකෙමින් තිබිණි. ඇය මොහොතක් කල්පනා කරමින් සිට ඒ මොහොතේ අනිවාර්යව තිබුණු ප්‍රශ්නය මා වෙත යොමු කළා ය.

"කවුද සර් අර සර් දන්න කෙනා, අවුරුදු පහකට පස්සෙ ගර්ල් දාල ගිය?"

"මම!"

ජීවිතයේ නියත මොහොතක දී ඔබ කළ යුතු ප්‍රකාශ සත්‍යය ද හෝ මිත්‍යාව ද යන්න වැදගත් නොවේ. ඇතැම් විට ඒ සත්‍යය හා මිත්‍යාව එක්කොට ඔබ ම ගොඩනගන ප්‍රවාදයක් විය හැක. වඩා වැදගත් වන්නේ ඉන් ලබන ප්‍රතිඵලයයි. විරහ දුකින් පීඩිතව, තවකකු මරා දමන්නට වුව සැරසී මා අභියස සිටින සරලා සැබවින්ම දක්ෂ සිසුවියකි. ඇගේ දිවි මග යළිත් පහන් කරදෙන්නට මා කරන ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාව වැදගත් නොවන බව මට වැටහී ගොස් තිබිණි.

දිගු විරාමයකට පසු නිහඬව නැගිට ගිය සරලා යළි මා දකින්නට ආවේ නැත. කිසිදු පිහි ඇණුමක් සිදු නොවූ අතර පැරණි පෙම් කවි හා ලිපි සරලා විසින් මිහිරංගට දුන් බව මට ආරංචි විය.

වසර දෙකකට පසු සරලා ගේ කණ්ඩායමේ අවසන් වසර නාට්‍ය නිෂ්පාදනය නරඹා කණ්ඩායමට සුභ පතන මහ සෙනග මැද මම ද සාමාජිකයෙක් වීමි. නැරඹූ සෑම නෙතකටම කඳුළු කැඳ වූ ඒ විසල් නාටකයේ සරලා මනහර රංගනයක නිරත වූවාය. සියළු සිසු සිසුවියන් අප වෙත පැමිණ අප හා කතාබහ කළ අතර ඔවුනගේ විශිෂ්ටතා අගයන්නට අපට අවකාශ ලැබිණි. අවසාන නාට්‍ය කණ්ඩායම් සාමාජිකයා ද පිටව ගියමුත් සරලා එහි නොවූ බව මට අවබෝධ විය. මම සෙමින් වේදිකාව පිටුපසට ඇවිද ගියෙමි. සිය චරිතය සඳහා ඇඟලාගත් ඇඳුමින් සැරසුණු සරලා තනිව, වේදිකාව කෙළවර බිමට නැඹුරු කරගත් මුහුණින් යුතුව රැඳී සිටියාය.

"සරලා... මොකද ඉස්සරහට ආවෙ නැත්තෙ? ඔයා හොඳට කැරැක්ටර් එක කළා. මයි කන්ග්‍රැජුලේෂන්ස්!"

සෙමින් හිස ඔසවා මා දෙස බැලූ ඇගේ නෙත් කෙවෙනි අග වූ කඳුළු කැට හඳුනාගන්නට මට අපහසු වූයේ නැත. එක්වරම මා පාමුළ වැටී මට ආචාර කළ ඇය හඬන්නට වූවා ය. මම සෙමින් නැඹුරු වී ඇය නැගිටුවාලීමි. කුඩා දැරියක මෙන් ඇය මා ළය මත හිස තබාගෙන දිගු වේලාවක් කඳුළු සැලුවාය.

"මට සමාවෙන්න සර්... හැමෝම එක්ක පේළියට ඇවිත් කතා කරල යන්න මට හිත් දුන්නෙ නැහැ. මේ චරිතෙ රඟපාන්න මං මේ කැම්පස් එකේ මේ විදියට ඉතුරු වුණේ සර් නිසා... එදා සර් මට කිව්ව වචන ටික මාව වෙනස් කළා සර්... මං සර්ට කතාකරන්න එන්න ඕන අනිත් අය එක්ක පෙළ ගැහිල නෙවෙයි කියල මට හිතුන..."

- **ප්‍රියන්ත ෆොන්සේකා** [shanthalalf@gmail.com]

ඔටුණු කුමට ද?



මුතු වගේ කඳුළු කැට සැඟවිලා බර වැඩියි, මිල අධික බවක් නම් නොසිතේ
ඉරි තැලුණු, මිය ඇදුණු දහසකුත් සුසුම් යලි පණ නොදෙන ඔටුනු හිස රැඳවේ
දහසකුත් සුබ සිහින නොදකිනා, නිදි නොමැති දෑස් මුමුණන කතා වැටහේ
අඳත් හාමතේ විත් කරදර ම පොදි බඳින ඔබ නිසා පමණක් ම රජ වේ

සැම හිස ම සරසන්න තරම් රන් සොරාගත් එක ඔටුන්නක ඇතත් පුරවා
බිම තබා බිඳින්නට, නැහැ තවම අවකාශ දසත ඇත මෝහ ගිනි අවුලා
මුලාවෙන්, මුසාවෙන් රඟන උන් තව තවත් ලාබ නාටක රඟති මවලා
උනුන් පරයා නැගෙන කඳු නොවූ විට දි අප, ශක්තියයි නොසෙල්වෙන ඉඳුරා

නැණ නුවන පහදවා සිතන්නට, දිනන්නට කෙටිමගක් නැතත් මල් අතුරා
දිවා රෑ වෙහෙසිලා, සීරුවෙන් බැමි මුදා යුක්තියේ රශ්මියෙන් පුබුදා
ඔබ නොවිඳි, මා නොවිඳි සරල අභිමානවත් ජීවිතය ගත් අපෙන් උදුරා
යලි ඔබට සරසන්න,
ඔබෙ දෑතෙ රඳවන්න
හැකිවේය කියත හැක දිවුරා!

- මහේෂා වජිරකාන්ති විජේසේකර [vajirakanthim@gmail.com]

දීපිකා ශ්‍රියානි සුනේත්‍රා වඩුගේ

සෙනෙහස

සිසිල සඟරාවේ කොටස් වශයෙන් පළවෙන නවකතාව

මෙතෙක් කතාව

දෙමාපියන් අහිමි අංජලී කුඩා අවධියේ සිට ම හැදුණේ තම නැන්දණිය තලතා, මාමණ්ඩිය බුවනෙක සහ ඔවුන්ගේ දරු දෙදෙනා ළඟයි. තම මව අංජලීට විවාහ යෝජනා සොයන බව දැනගත් බාල පුතු වෛද්‍ය ශිෂ්‍ය සුනෙත් වහාම තම ආදරය අංජලීට පවසන්නට සැරසුනත් ඊට පෙර අංජලී දැක පැහැදුණු සහකාර පොලිස් අධිකාරී හරේන් මංගල යෝජනාවකින් පසුව අංජලීව බැලීමට එනවා. ඒ බව දැනගන්නා සුනෙත් තම මව සමග කෝප වී නිවසෙන් පිටව දුර පලාතක වෙසෙන මිතුරෙකුගේ නිවසට යනවා.

මේ අතර, තලතා සහ බුවනෙක දෙපළගේ ආරාධනයෙන් හරේන් නිවසට පැමිණි විට ඔහුට පවුලේ වැඩිමහල් පුත් ගුවන් හමුදා කපිතාන් දේවක මුල්වරට හමු වෙනවා. දේවක ද මේ යෝජිත විවාහය ගැන ප්‍රසාදයක් නොමැති බව ඔහුගේ හැසිරීමෙන් දෙමව්පියන් දැන ගන්නවා.

අංජලීගේ සහ හරේන්ගේ විවාහය නුදුරේ දී ම සිදුවනු ඇති බව දැනගත් සුනෙත් තම මිතුරන් දෙදෙනෙකු සමග නිවසට පැමිණෙන්නේ අංජලී පිළිබඳ තම අරමුණ ඉටුකර ගන්නා අදහසිනුයි. නමුත් ඔහු නොදන්නා කාරණය නම්, අංජලී ඇවැස්ස නෑනා-මස්සිනා විවාහයකින් උපන් දරුවෙකු නිසා, එලෙසින්ම ඇවැස්ස නෑනා-මස්සිනා ඥාති සම්බන්ධයක් ඇති ඔවුන් දෙදෙනා අතර විවාහයක් කිසිදිනෙක සිදුවීමට ඉඩක් නොමැති බවයි.

අද එතැන් සිට

දොරට තට්ටුකරන්නේ සුනෙත් වන්නට ඇතැයි භානුකට සිතිණ. යථාර්ථය සුනෙත්ට තේරුම් කිරීම කළ යුතු දෙයක් බව භානුක තේරුම්ගෙන තිබුණ ද එවැන්නක් සිදුකරන්නේ කෙලෙස ද යන්න පිළිබඳව ඔහුට ඒ වන විටත් කිසිදු අදහසක් නොතිබිණ. ඒ ගැන උපදෙසක් පතමින් භානුක සිය ජංගම දුරකථනයෙන් තාරකීට කෙටි පණිවිඩයක් යවා ඇගෙන් පිලිතුරක් බලාපොරොත්තුව සිටියේය. එවැනි මොහොතක අනපේක්ෂිතව සුනෙත් ඔවුන් සොයාගෙන පැමිණ ඇතැයි යන කුහුල නිසා භානුක දොර විවෘත කිරීමට යාම පසෙක තිබිය දී මොහොතක් වික්ෂිප්තව සිටියේය.

"භානුක අයියා මම තාරකී, පොඩ්ඩක් දොර අරිනව ද?"

ඒ ඇමතීම භානුකට මහත් අස්වැසිල්ලක් විය. ඔහු දොර විවෘත කළ විගස ම සිදු වූ ප්‍රමාදය ගැන තාරකී ගෙන් සමාව ඇයදුවේය. "සොරි තාරා, මං ටිකක් ෂොක් වුණා සුනෙත් ඇවිත් වෙන්න ඇති කියල..."

නාන කාමරයේ සිට පැමිණි ආදිත්‍ය තුවායෙන් හිසෙහි තෙත පිසදමමින් භානුක ගේ සහ තාරකී ගේ කතාවට සවන් දෙමින් සිටියේය.

තාරකී මෙලෙස භානුක සහ ආදිත්‍ය හමුවීමට පැමිණ සිටීම සුනෙත් දුටුවහොත් ඔවුන්ගේ සැලසුම් සියල්ල අවුල්වෙනු ඇති බව අවධාරණය කළ ආදිත්‍ය කාමරය තුළට පැමිණ කතාබහ කරගැනීම යෙහෙකැයි භානුකට සහ තාරකීට යෝජනා කළේය. ඊට අභිනයනයෙන් ප්‍රතිචාර දැක්වූ තාරකී වටපිට සුපරීක්ෂාකාරීව බලා කාමරය තුළට පිවිසෙන අතර පැවසුවේ අංජලීට ද නොදන්වා පැමිණි ගමනක් බැවින් ඉක්මනටම ආපසු යා යුතු බව ය.

"දොර අරින්න පමාවෙන කොට මං හිතුවේ ඔයාලට නින්ද ගිහින් කියලයි. පණිවිඩය අර්ජන්ට් නිසා මම ආයෙත් ටිකක් හයියෙන් දොරට තට්ටු කරලා බැරිම තැන තමා කතා කළේ," තාරකී සිනාසෙමින් පැවසුවාය.

"මං බලාගෙන හිටියෙ ඔයාගෙන් මැසේජ් එකක් එනකම්. කීයටවත් හිතුවෙ නැහැ දොර ළග ඉන්නෙ ඔයා කියල," භානුක ප්‍රතිවදන් දුන්නේය.

"මැසේජ් එකකින් ලියනවට වඩා මට ඇවිත් කියන එක පහසුයි වගේ දැනුණා. ඔයාල කියපු විදියට මං සහන් අයියත් එක්ක සුනෙත් ඉන්න සිටුවේෂන් එක ගැන කතා

කළා. සහන් අයිය ළඟදි දවසක අංජලී-හරේන් දෙන්න ගැනත් තලතා ආන්ටි එක්ක කතා කරලා තියෙනවා. ඒ දේවක අයියගෙ ඉල්ලීමකට. ඒ නිසා, අපි වගේම එයත් මේ ප්‍රශ්නේ බරපතලකම තේරුම් අරන් ඉන්නෙ. තලතා ආන්ටිත් සහන් අයියට සලකන්නේ තමන්ගෙම පුතෙක් වගෙ නිසා ඔය ෆැමිලි හිස්ට්‍රි ගැන කතන්දර එයාටත් කියල තියෙනව ලු. ඉතින් මට අමුතුවෙන් කියන්න ඉතිරිවෙලා තිබුණෙ ඔයාල සුනෙත් ගැන මම එක්ක කතා කරපු ටික විතරයි. සහන් අයිය කියනව හරේන්ල ඇවිත් නැකැත් භාරදීල ඒ චාරිත්‍ර ටික කරන තුරු සුනෙත්ට මේ කිසි දෙයක් කියන්න එපා ලු. ඊට කලින් සුනෙත් ඔය විස්තර දැනගත්තොත් හැම දෙයක් ම අවුල්වෙලා කොහෙන් කෙලවර වේවි ද කියලා හිතාගන්න අමාරුයි කියල තමයි එයා හිතන්නෙ. ඒ නිසා කොහොම හරි ඒ වෙනතුරුවත් සුනෙත් ෂේෆ් කරගෙන ඉන්න ලු. එයාට යථාර්ථය තේරුම් කරල දීල එයාගෙ හිත හදාගන්න උදව් කරන එක පස්සෙ කරගනිමු කියලයි එයා කියන්නෙ. හරේන් අයියලා එක්ක හෙට හවස සහන් අයියත් ඒවි. ඒ ආවට පස්සෙ කතාකර ගනිමු කියලත් කිව්ව. අංජලීටවත් මම මේ කිසි දෙයක් නොකියන්න හිතුවා. එයා මේ වෙලාවෙදි එක්සයිට් වුනොත් තවත් ප්‍රශ්නයක්. දැනට සුනෙත්ට කියන උත්තරය හදාගන්න ඔයාල දෙන්නට බැරි වෙන එකක් නැහැ නේ. දැන් මං යන්න ඕනැ," පැවසූ තාරකී භානුකගෙන් සහ ආදිත්‍යගෙන් සමුගෙන කාමරයෙන් කඩිමුඩියේම පිටව ගියාය.

"එයත් ඉතින් අපිට බෝලෙ පාස් කරල ගියා. දැන් ඉතින් අර අභිංසකය රවටන්න බොරුවක් හදන්න එපා යැ," ආදිත්‍ය දෙස බලමින් භානුක කීවේය.

"අපි සුනෙත් ගෙ කාමරයට නොගියොත් ෂුවර් තව ටිකකින් එයත් මෙතැන," ආදිත්‍ය පැවසුවේ භානුක පැවසූ දෙයටම තව ඌනපූරණයක් එක්කරන අටියෙන් ය.

"හ්ම්ම්ම්, ඒක ඇත්ත මචං. ඒත් මොනවද ඉතිං අපි කියන්නෙ?"

"අපි තාරකී එක්ක ඔක්කොම කතා කරගත්තා. අංජලී කැමති කරගන්න තාරකී ට්‍රයි කරාවි කියල කියමු," ආදිත්‍ය යෝජනා කළේය.

"ඒ කතාව සුනෙත් පිළිගන්නෙ නැහැ ආදි. තාරකී ගැන සුනෙත්ට එහෙම විශ්වාසයක් නැහැ. ඇරත් තාරකී හරේන්ගෙ ෆස්ට් කසින් කියලත් සුනෙත් දැන් දන්නව නේ. එහෙම නෙවෙයි, අපි මෙහෙම කියමු. තාරකීගෙ උදව් අරගෙන අපි අංජලී හමුවෙලා තත්වය තේරුම් කරල දෙනතුරු සුනෙත්ට ඉවසල ඉන්න කියමු. තාරකී එක්ක අවශ්‍ය දේවල් අපි කතාකර ගත්ත කියලත් කියමු. අපි මේ හැම එකක්ම කරන්නෙ සුනෙත් වගේම අංජලීගෙත් යහපතට නේ. සදාචාරයෙන් පිට දෙයක් නොකරන නිසා අපට වොරි වෙන්න දෙයක් නැහැ මචං. අනෙක් එක මේ වෙනකම් සුනෙත් මේ ප්‍රශ්ණෙන් පිස්සෙක් වෙන එක අපි දෙන්නට වලක්වා ගන්න පුළුවන් වුණා වගේම ඉස්සරහටත් එහෙම නොවෙන්න අපට යමක් කරන්න පුළුවන් ද කියල බලමු. හරේන්ල ඇවිත් ගියාට පස්සෙ අපි සුනෙත්ට ඇත්තම තත්වය තේරුම් කරල දෙමු. එයත් ඩොක්ටර් කෙනෙක් නේ. හිතට වහල් වෙන්නෙ නැතිව බුද්ධියට ඉඩදෙන තැනට එයාව පත්කර ගන්න බලමු," භානුක පැවසූ දෙය ආදිත්‍ය ද හිස වනා අනුමත කළේය. අවසානයේ ඔවුහු කිව යුතු දෑ හරියටම කතිකා කර ගැනීමෙන් පසුව සුනෙත් හමුවට ගියහ.

"මම හිතුවෙ උඹල දෙන්නට මහන්සියට නින්ද ගිහින් කියල. මං ඒ නිසා උඹලට ඩිස්ටර්බ් කළේ නැහැ," සුනෙත් පැවසුවේ මිතුරන් දෙදෙනාගේ ආගමනය ගැන ඇති වූ ප්‍රමෝදය ද අභිනයෙන් පෙන්නුම් කරමින්ය.

එයට සිනහවකින් ප්‍රතිචාර දැක්වූ භානුක සහ ආදිත්‍ය සුනෙත්ගේ කාමරයේ වූ සෝපාව මත හිඳගත්හ. ආගිය තොරතුරු විමසීමෙන් අනතුරුව භානුක සහ ආදිත්‍ය අපේක්ෂා කළ අයුරින්ම සුනෙත් සිය ප්‍රශ්නයට විසඳුමක් ලැබුණේ ද යන වග මිතුරන්ගෙන් විමසුවේය.

"මචං අපි වැඩකට බැස්සොත් ආයෙ ඉතිං මොකක්ද? බලපංකො අපි පුළුවන් ට්‍රයි එකක් දෙනව. තාරකීගෙ උදව්වෙන් අංජලී මීට් වෙන්න චාන්ස් එකක් ගන්න පුළුවන්. හැබැයි මචං අංජලී ගෙ උත්තරය පොසිටිව් නූනත් උඹ අවුල් වෙන්නෙ නෑ කියල අපිට පොරොන්දු වෙන්න ඕනැ," යම් මවාගත් ව්‍යාජ උද්දාමයකින් කතාව ආරම්භ කළ භානුකට අවසාන වාක්‍යයෙන් හෝ තම මිතුරාට යතාර්ථය ගැන ඉඟියක් පළකිරීමෙන් වැලකිය නොහැකිවිය. ඊට ප්‍රතිචාර ලෙස ප්‍රශ්නාර්ථයකින් සුනෙත් එකවරම තම මිතුරා දෙස බැලුවේය.

"නෑ, නෑ, මචං සුනෙත්.... භානු එහෙම කිව්වෙ එච්චර ඒ ගැන සීරියස් හිතල නෙවි," ආදිත්‍ය සුනෙත් අස්වසන්නට උත්සාහ කළේය.

"මචං මට ඇත්තම කියනවද? උඹල මට මොකුත් හංගන්නෙ නැහැ නේ. තාරකී ගැන මුල ඉඳලම මං විශ්වාස කළේ නැහැ. ඇරත් එයා මට වඩා හරේන්ට ෆේවර් කරන එක වලක්වන්න බැහැ. හරේන් කියන්නෙ එයාගෙ ෆස්ට් කසින් නේ. ඔය මොනවා කිවුවත් මේ ප්‍රොපොසල් එකටත් එයාගෙ මේන් රෝල් එකක් තියෙනවා," සුනෙත් එලෙස පැවසුවේ කලකිරීම මුසු වූ ස්වරයකිනි.

"එහෙම හිතන්න එපා මචං. අපට තාරකී කියපු විදියට ඒ ප්‍රොපෝසල් එකට හරේන්ල අංජලී බලන්න එනතුරු තාරකී දැනගෙන ඉඳල නැහැ. තාරකී අපට බොරුවක් කිව්ව වෙන්න බැහැ. හැම දෙයක්ම නෙගටිව් හිතන්න එපා මචං," ආදිත්‍ය සුනෙත් අස්වසන්නට උත්සාහ කළේය.

කෙසේ හෝ අවසානයේ සැලසුම් කළ ආකාරයට ම අස්වසන්නට අවැසි දේ පමණක් පවසා සුනෙත්ගේ සිත සන්සුන් කරන්නට භානුකට සහ ආදිත්‍යට හැකිවිය. සුනෙත් සමග කතාබස් කරමින් සිටි ඔවුන් ඒ කාමරයෙන් නික්මුණේ මැදියම් රැය ආසන්නයේ දී ය.

සුනෙත් අබියස සිටින හැම මොහොතකම භානුක ගේ සහ ආදිත්‍ය ගේ සිත් තුළ වෙනදා මෙන් සතුටක් නොතිබුණ අතර බලාපොරොත්තු සුන් වූ හැඟීමකින් ඔවුන්ගේ සිත් ද ඔද්දල් වී තිබිණ. සුනෙත් පිළිබඳව වූ සානුකම්පිත හැඟීම නිසා නිරන්තරයෙන් ම මවාගත් ව්‍යාජ උද්දාමයකින් සිටීම ඔවුන්ට ද ඔරොත්තු නොදෙන තත්වයක් වී තිබිණ. භානුක සහ ආදිත්‍ය දෙදෙනා ඒ ගැන එකිනෙකාට අදහස් හුවමාරු කරගෙන ඔවුනොවුන්ගේ සිත් සකසා ගැනීමට කටයුතු කළහ.

* * *

මේ අතර තාරකී තමාට යමක් නොකියා සඟවාගෙන සිටින බව අංජලීට සවිඥානකව දැනෙමින් තිබිණ. ඇය බැරිම තැන ඒ ගැන තාරකීගෙන් විමසුවාය. එහෙත් තාරකීගෙන් ලැබුණ පිළිතුර වූයේ එසේ අංජලීට නොපවසන යමක් ඇය ළඟ නොමැතිබව ය. එසේ නමුත්, ඒ සැකය අංජලී තුළින් පහසුවෙන් බැහැර කරවීමට තරම් තාරකී ගේ වදන්වල ශක්තිමත් බවක් හෝ සක්‍රිය බවක් නොතිබිණ.

මේ අතර හරේන් වෙත අංජලී කලින් දැක්වූ දුරස්ථ බව කෙමෙන් අඩුවෙමින් ඔහු කෙරෙහි යම් ළබැඳියාවක් ඇය තුළ ගොඩනැගෙමින් තිබිණ. අංජලී ගේ එම වෙනස හරේන්ට මෙන්ම තාරකීට ද දැනෙමින් තිබිණ. හරේන් දිනපතා අංජලීට දෙන දුරකථන ඇමතුම්වල දී වුව දෙදෙනා කතා කරන කාලය පෙර මෙන් නොව සාපේක්ෂව දිගු ය. එම පිළිසඳරට හරේන් මෙන්ම අංජලී ද සක්‍රියව සහභාගී වන බවක් පෙණින. හරේන් අංජලී බැලීමට පැමිණි පසුව වුවද අංජලීගේ හැසිරීම්වල පෙර මෙන් නොව ඔහු කෙරෙහි යම් ලයාර්ද්‍ර බවක් පෙනෙන්නට තිබිණ. බොහෝ කාලයක් දෙලොවක් අතර දෝලනය වෙමින් තිබූ තම මිතුරියගේ සිත එලෙස වෙනස් වීම ගැන තාරකී ගේ යටි සිතෙහි ද යම් සතුටක් ඇතිවෙමින් තිබිණ. යෝජිත විවාහයක් හෙයින් මුළ දී අංජලී හරේන් වෙත දැක්වූ ඇල්මැරුණු බැඳීම දිගටම පවතිනු ඇතැයි තාරකීට යම් බියක් දැනී තිබිණ. කෙසේ හෝ ඒ හරේන් වෙත අංජලී දැක්වූ ඒ ඕනෑවට-එපාවට ආකාරයේ ප්‍රතිචාරවලට සුනෙත් ද යම්තාක් දුරට හේතුවක් වී තිබුණ බව තාරකීට තේරුම් ගැනීමට අපහසු නොවීය. සුනෙත් නිවසින් නික්ම යාම සහ ඔහු පවත්වාගෙන ගිය දිගු නිහැඬියාව මෙන්ම හරේන් ගේ ඒක පාර්ශ්වීය වූ ළබැඳියාව පසු කාලයක් වන විට අංජලී කෙමෙන් හරේන් වෙත ළංවීමට හේතුපාදක වී තිබිණ. ඒ වන විටත් සුනෙත් අංජලී ගැන සිතමින් ඒ ගැන තැවෙමින් පසු වන බව ඇයට දැන ගැනීමට මගක් නොතිබිණ. සුනෙත් යතාර්ථය තේරුම් ගෙන එලෙස ඔහුගේ සිත සන්සුන් කරගෙන ඇතැයි අංජලී සිතා සිටියාය.

හරේන් පැමිණීමට නියමිත දිනයට පෙර දින රාත්‍රියේ දේවක ද නිවසට පැමිණියේය. ඒ වන විට මැදියම් රැය පසු වී තිබූ හෙයින් තලතා, බුවනෙක, සහ සිරිදාස හැරුණු විට නිවසේ සිටි අන් කිසිවෙකුත් දේවක පැමිණි බව දැන නොසිටියහ. දේවක මෙවර දින කිහිපයක් නිවසේ ගත කිරීමට සැලසුම් කරමින් නිවාඩු අනුමත කරගෙන පැමිණීම ගැන ඇසීමෙන් තලතාට මෙන්ම බුවනෙකට ද සතුටක් දැනිණ.

“මල්ලිත් ගෙදර ඇවිත් ඉන්න එකේ ලොකු පුතා ටික දවසක් ගෙදර ඉන්න නිවාඩු අරගෙන ආපු එක කොච්චර ලොකු දෙයක් ද? කාලයකට පස්සෙ අපේ පවුල එකතු වෙනවා,” තලතා පැවසුවේ දේවක වැළඳගන්නා අතරතුර දී ය.

එතැන් සිට ලබන කලාපයෙන් කියවන්න.

- දීපිකා ශ්‍රියානි සුන්ද්‍රා වඩුගේ
[deepikascf@gmail.com]

සැනසුම

සීතල සිරි සිරි
පොද වැස්සේ
මිහිදුම් වළා අතුල
ගිරි ශිඛර මැද්දේ

උදුනේ උණුසුම් පුසුඹ
ගේ සාලේ මැද්දේ
බිම්පලාසී රාගයට
තනුවක්ය වැයෙන්නේ

ගුලි කළ මතක
ඇත කාණු පල්ලේ
කහපාට රෝස පෙති
දස අත ම විසිරේ

ඔබත් සිටියා ඉතින්
හිනැහි හිනැහි
කෝපි බඳුනේ
දුම් වළලු අස්සේ



- **ඉන්දිකා තිලකුමාර** [ithilakumara@yahoo.com]

“ආරේ ගුණ නෑරේ” : ප්‍රවේණි විද්‍යාත්මක පැහැදිලි කිරීමක්

පැරණි ප්‍රස්තාව පිරුළක කොටසක්වන “ආරේ ගුණ නෑරේ” යන්නෙහි අදහස නම්, සම්ප්‍රදායට ම ගැති වී අන්ධානුකරණයෙන් යම් යම් දේ සිදුකිරීමට පෙළඹීම බව සාමාන්‍ය පිළිගැනීමයි. නමුත් මෙයට “සම්ප්‍රදායට” වඩා ගැඹුරු අර්ථයක් ඇති බව ප්‍රවේණි විද්‍යාව ආශ්‍රිතව දැක්විය හැකිය.

“ආරය” සහ ප්‍රවේණිය

“ආරය” යන වචනයට ඉතාමත් සමීප ජීව විද්‍යාත්මක යෙදුම “ප්‍රවේණිය” (Heredity) වේ. පවුලක මව හෝ පියා තුළ දකින්නට ලැබෙන යම්කිසි හැඩහුරුකමක් හෝ වෙනත් ගති ලක්ෂණ හෝ, ඊළඟ පරම්පරාවේ දරුවන්ටත් ඒ ආකාරයෙන්ම පිහිටීමේ ස්වාභාවික සංසිද්ධිය ප්‍රවේණිය ලෙස සරලව දැක්විය හැකිය. සමහර අවස්ථාවල දී මවක් සහ ඇයගේ දියණියක් එකවර දකින කෙනෙකු “ආරෙට ගිහිල්ලා, දුව හරියට අම්ම වගේ ම යි” යනුවෙන් ප්‍රකාශ කෙරේ. මවක් සහ ඇගේ සෑම දියණියක් ම, ඒ කියමනට ගෝචර නොවන අවස්ථා ද එමට ය. එවැනි අවස්ථාවල දී මවගේ සහ දියණියකගේ හැඩරුව මෙසේ දෙආකාරයකට පැවතිය හැක්කේ කෙසේද යන්න ප්‍රවේණි විද්‍යාවේ සංකල්ප මගින් විසඳිය හැක.

ප්‍රවේණිය යන යෙදුමෙන් මෙන් ම “ආරය” යන වචනයෙන් ද, බොහෝ දුරට ජීවියෙකුගේ ජෛව විද්‍යාත්මක උරුමය හැඳින්විය හැක. එයින් පැහැදිලිවෙන්නේ ජීවීන්ගේ විවිධ හැඩරුව සහ ගති ලක්ෂණ පාරම්පරිකව දකින්නට ලැබෙන්නේ කෙසේද යන්නයි. ජීවියෙකු තුළ දකින්නට ලැබෙන ඒ ගති ලක්ෂණවලට පාදකවන මූලික ඒකක, ජාන (genes: ග්‍රීක් භාෂාවේ “genos” යන වචනයෙන් දැක්වෙන “birth” නැතහොත් “උපත”) ලෙස නම්කර තිබේ. ඕනෑම ජීවියෙකුගේ, සෑම සෛලයක ම න්‍යෂ්ටියේ ඇති වර්ණදේහ (chromosomes) තුළ, ජාන ගැබ් වී ඇති අතර ජීවියෙකුගේ ගති ලක්ෂණ පාරම්පරිකව සම්ප්‍රේෂණයවන ක්‍රියාවලිය හසුරවනු ලබන්නේ ජාන මගිනි.

මේ ලක්ෂණ පැහැදිලි කෙරෙන මිනිසාගේ සෛලයක ව්‍යුහය සහ එහි න්‍යෂ්ටියේ අන්තර්ගත වර්ණදේහ යුගලයක ස්වරූපය පහත සටහනෙහි දැක්වේ. ඒ සමගම ජීවීන්ගේ දේහ ලක්ෂණ පාරම්පරිකවීමේ දී ක්‍රියාත්මකවන වර්ණදේහාංශවල හටගන්නා “ඇලීල” (alleles) යුගල ප්‍රභේද තුනක් ද පෙන්වා ඇත.



සත්ත්ව සෛලයක දළ ව්‍යුහය byjus.com



වර්ණදේහ යුගලක්

වර්ණදේහවල ජාන ආශ්‍රිත ඇලීල පිහිටන ආකාරය

ප්‍රවේණිය පිලිබඳ ගවේෂණ ආරම්භ කිරීම

ජීවීන්ගේ ගති ලක්ෂණ පාරම්පරිකව උරුමවීම පිලිබඳ කරන ලද පර්යේෂණ ආශ්‍රිතව ලබාගත් තොරතුරු අනුව, උපකල්පන කිහිපයක් ගොඩනැගූ පළමු විද්‍යාඥයා වූයේ, ඔස්ට්‍රියානු ජාතික පූජකවරයෙකු වූ ග්‍රෙගර් මෙන්ඩල් ය. පියාගේ ගොවිපලේ හැදුනු වැඩුණු ඔහු ගව පට්ටියේ දෙනුන් අභිජනනය කිරීමෙන් වඩාත් හොඳ ගවපැටවුන් ලබාගත හැකි බව දැන සිටියේය. ඒ නිරීක්ෂණ නිසා ඔහුට අභිජනනය පිලිබඳ කරුණු සෙවීම පිණිස උනන්දුවක් ඇතිවිය. පසුව ඔහු පූජකයෙකු ලෙස මීයන්, මීමැස්සන් වැනි සතුන් අභිජනනය සඳහා යෙදවීම ගැන අධ්‍යයනය කිරීමට පටන් ගත් නමුත් වැඩිහිටි පූජකවරු අභිජනන කටයුතු සඳහා සතුන් යොදාගැනීම ආගමට නොගැලපෙන කාර්යයක් බව පවසමින් එයට විරුද්ධ වූහ. එනිසා ඔහු අභිජනන පර්යේෂණ සඳහා සතුන් වෙනුවට ශාක භාවිතා කිරීම ඇරඹීය.

මෙන්ඩල්ගේ ශාක අභිජනන පර්යේෂණවල ප්‍රතිඵල දහනවවන සියවසේ අග දී ප්‍රසිද්ධියට පත්විය. ඔහු තම පර්යේෂණ සඳහා යොදාගත්තේ පහසුවෙන් වගා කළ හැකි, ඉක්මණින් මල් හටගන්නා, මෑ කුලයට අයිති Pisum sativum (“ස්වීට් පී” හෝ ගෙවතු මෑ), නම් බෝංචි වැනි ශාක විශේෂයකි. වසර දහයක් තිස්සේ, ඔහුගේ පර්යේෂණ සඳහා බීජ ලබාගැනීම පිණිස වවන ලද “ස්වීට් පී” ශාකවලින්

අක්කර දහයක් පමණ වූ පූජකාරාම ඉඩම වැසී ගියේය. ඔහුගේ පර්යේෂණ සාර්ථකවීමට එක් හේතුවක් වූයේ, ඔහු උපකල්පනය කළ සංසිද්ධි පරීක්ෂණ මගින් සනාථකරගත හැකිවීම යි. එසේම ඔහු තබාගත් නිරීක්ෂණ සටහන් ඉතාමත් ක්‍රමානුකූලවීම යි.

මෙන්ඩල් විසින් Pisum sativum ශාකවල ප්‍රවේණිගත ගති ලක්ෂණ හතක් හඳුනාගන්නා ලදී.

1. ශාකයේ ස්වභාවය (උස්/මිටි)
2. කරලේ පැහැය
3. කරලේ හැඩය
4. බීජ පැහැය
5. බීජ හැඩය
6. පුෂ්ප පිහිටීම
7. පුෂ්ප පැහැය

මේ ආකාරයට තෝරාගත් ශාක යුගලවල, පුෂ්ප පරාගණය කර, ලබාගත් බීජවලින් ලැබෙන ශාක නැවත නැවතත් වාර කිහිපයක් අභිජනනය කරන විට මෙන්ඩල්ට සුවිශේෂී ලක්ෂණ කිහිපයක් දකින්නට ලැබිණ. උදාහරණයක් වශයෙන්, තෝරාගත් උස සහ මිටි ලක්ෂණ සහිත ශාක අතර අභිජනනය කර පරම්පරා කිහිපයක් යන විට ලැබුණු එම ශාක සමූහයේ උස ලක්ෂණය සහිත ශාක බෙහෙවින් වැඩි ප්‍රතිශතයක් තිබෙන බව පෙනුණි. මෙම ගති ලක්ෂණ අතරින් ශාකයේ උස්බවේ ලක්ෂණය බොහෝවිට මිටිබවේ ලක්ෂණයට වඩා ඉස්මතුවන බව ඔහු දුටුවේය. එසේම කරලේ සිනිඳුබව, රළුබවට වඩාත්, පුෂ්පවල නිල්පැහැය, සුදු පැහැයට වඩාත් ආදී වශයෙන් සමහර ලක්ෂණ වැඩිපුර ඉස්මතුවනබව ද ඔහුට දකින්නට ලැබිණ. සටහන් තබා ගැනීමේ පහසුව සඳහා, මේ ආකාරයට ඉස්මතුවන ලක්ෂණ "ප්‍රමුඛ" (dominant) ලක්ෂණ ලෙසත් වැඩිපුර ඉස්මතු නොවන ලක්ෂණ "නිලීන" (recessive) ලක්ෂණ ලෙසත් නම් කරන ලදී.

මෙම සිදුවීමට මූලිකවනුයේ හඳුනා නොගත් යම්කිසි "අදෘශ්‍යමාන සංසිද්ධියක්" විය හැකි බව ඔහු උපකල්පනය කළේය.

"ස්වීට් පී" ශාකවල මෙම උපකල්පිත ලක්ෂණ සටහන්කර තැබීමේ පහසුව සඳහා මෙන්ඩල් සංකේත ක්‍රමයක් භාවිතා කළේය. උදාහරණයක් වශයෙන් ශාකයක "උස" ලක්ෂණය ගතහොත් ඒ සඳහා ඉංග්‍රීසි වචනය Tall වේ. මේ අනුව නිරීක්ෂණය කරන ලද ප්‍රමුඛ ලක්ෂණය සහිත "උස" ශාකය "T" සංකේතයෙන් ද, "මිටි" හෝ "උස නොවන" ශාකය "t" සංකේතයෙන් ද ඔහු දැක්වීය. එසේම එක් අභිජනනයකින් හටගන්නා ඵලග පරම්පරාව "ප්‍රථම දාරක පරම්පරාව" (First Filial generation) ලෙස හඳුන්වා, එය සඳහා "F_1" සංකේතය ද භාවිතා විය.



ශාකයේ සාමාන්‍ය සෛලවල න්‍යෂ්ටියේ ඇති වර්ණදේහ යුගල වශයෙන් පවතින නිසාත්, එම ශාක පුෂ්පවල ජන්මාණු නිපදවීමේ දී වර්ණදේහ යුගලයේ වර්ණදේහාංශ එකිනෙකෙන් වෙන් වී ජන්මාණු සකස්වන බවත් ඔහු උපකල්පනය කළ අතර ඒ බව සංකේතයේ අක්ෂරය දෙවරක් භාවිතා කිරීමෙන් පෙන්වන් ලදී.



උස සහ මිටි ශාක අභිජනනයෙන් උස ශාක පමණක් ලැබීම

මේ අනුව ප්‍රමුඛ "උස ලක්ෂණය" - "TT" ලෙසටත්, නිලීන "මිටි ලක්ෂණය" - "tt" ලෙසටත් දැක්විණි. මෙන්ඩල් තම පරීක්ෂණ වාර්තාව 1865 වසරේ ඉදිරිපත්කළ ද එම ප්‍රතිපල ජනප්‍රිය වූයේ 1900 වසරට පසුව ය. මේවන විට ශාක අභිජනන පරීක්ෂණවල නියැලුණු වෙනත් විද්‍යාඥයින් විසින් ද නව තොරතුරු සොයාගෙන තිබුණි.

උස ශාකයක් මිටි ශාකයක් සමග අභිජනනය කළ විට උස ශාක, මිටි ශාකවලට වඩා වැඩි ප්‍රතිශතයක් තිබීමට හේතුවක් තිබිය යුතු බව අනුමාන කළ මෙන්ඩල්, එම පරීක්ෂණයේ F_1 පරම්පරාවෙන් ලැබුණු උස ශාක දෙකක් “ස්ව-පරාගණය” මගින් නැවත අභිජනනය කර, එමගින් ලැබුණු F_2 පරම්පරාවේ උස සහ මිටි ලක්ෂණ නිරීක්ෂණය කළේය. මෙහි දී F_1 පරම්පරාවේ දී අහෝසි වියයි සිතූ මිටි ලක්ෂණය සහිත ශාක යම්කිසි සංඛ්‍යාවක් මෙහි දී යළිත් ලැබුණි. ඔහු පුදුමයට පත්කළ, එම අභිජනනයේ ප්‍රතිඵල මේ ආකාරයට සටහන් කළ හැක.



F1 පරම්පරාවේ ශාක දෙකක් ස්ව-පරාගණය කිරීමෙන් F2 පරම්පරාව ලැබෙන ආකාරය

මෙසේ ලැබුණු ප්‍රතිඵල මෙම පරීක්ෂණයේ F_1 පරම්පරාව වුවත්, මෙය ඇත්ත වශයෙන්ම මෙන්ඩල්ගේ පරීක්ෂණ මාලාවේ දෙවැනි අදියර නැතහොත් F_2 පරම්පරාව ලෙස සැලකිය හැකිය. මෙහි දී උස ශාක සහ මිටි ශාක අනුපාතය 3:1 විය. මෙම ප්‍රතිඵලය තවදුරටත් විශ්ලේෂණය කිරීමේදී එය TT : Tt : tt අනුපාතය 1 : 2 : 1 විය යුතු බව හෙළිදරව් විය. මෙහි දී TT සහ Tt ශාක බාහිර පෙනුම අනුව උස ශාක වූ අතර tt ශාක මිටි ශාක විය. මේ නිසා මේ ශාක පොදු බාහිර පෙනුම අනුව, උස:මිටි :: 3:1 අනුපාතය නැතහොත් උස 75% සහ මිටි 25% ලැබී ඇත. ලබාගත් තොරතුරු මෙසේ අධ්‍යයනය කර ශාකවල එම ස්වාභාවික හැසිරීම් රටාව පිළිබඳව මේ ආකාරයට ගණිතමය සංකල්ප ගොඩනැගීමට හැකිවීම මෙන්ඩල් ලබාගත් ජයග්‍රහණයකි.

පසුකාලයේ දී “බාහිර පෙනුම” යන තේරුම පදනම කර ගනිමින් මේවා රූපාණුදර්ශ (Phenotypes) ලෙස නම්කරන ලදී. උස ශාක අතරද 25% ක් “ප්‍රමුඛ” TT උස ලක්ෂණය සහිතව වූ අතර, ඉතිරි 50% උස ලක්ෂණය සහ “නිලීන” මිටි ලක්ෂණයද සහිතව Tt උස ශාක වූ බව පෙනේ. මේ ආකාරයට බාහිරව නොපෙනෙන ජනක ලක්ෂණ අනුව TT, Tt සහ tt ශාක වෙන වෙනම ජන්මාණුදර්ශ (genotypes) ලෙසද නම් කරන ලදී. මේ නිසා මෙම අභිජනන ප්‍රතිඵල අනුව, උස සහ මිටි රූපාණුදර්ශ දෙකක් සහ TT, Tt සහ tt ලෙස ජන්මාණුදර්ශ තුනක් ඇති බව පැහැදිලි විය.

මෙන්ඩල්ගේ ශාක අභිජනනවල ප්‍රතිඵල

ජීවීන්ගේ ජනක සංසිද්ධියට අදාළ ජාන පිහිටනුයේ සෛල න්‍යෂ්ටියේ ඇති වර්ණදේහවල බව ග්‍රෙගර් මෙන්ඩල් මෙන්ම, ජීව පරිණාමය පිළිබඳ අධ්‍යයන කළ, චාල්ස් ඩාවින් ද විශ්වාස කළේය. යුගල වශයෙන් පවතින වර්ණදේහවල එක් එක් වර්ණදේහාංශයේ ජාන පිහිටන බවත් එම ජාන මගින් ජීවියාගේ ගතිලක්ෂණ නිර්ණයවන බවත් ඔව්හු උපකල්පනය කළහ. ජීවීන්ගේ ජන්මාණු සකස්වීමේ දී එකිනෙකින් වෙන්වන වර්ණදේහාංශවලට ජානවල අන්තර්ගත “ඇලීල” (alleles) ලෙස හඳුන්වන කොටස් සමග සමහර ලක්ෂණ වෙන්වන බව ද අනුමාන කරන ලදී.

මේ ආකාරයට ලබාගන්නා ලද තොරතුරු සම්පිණ්ඩනය කිරීමෙන් මෙන්ඩල් විසින් ජීවී ලක්ෂණ ආවේණිය පිළිබඳ නියම තුනක් ප්‍රකාශයට පත්කළේය.

1. ගති ලක්ෂණවල ප්‍රමුඛතාව පිළිබඳ නියමය (The law of dominance)
2. ගති ලක්ෂණ වෙන්වීමේ නියමය (The law of segregation)
3. ගති ලක්ෂණ ස්වාධීනව එකතුවීමේ නියමය (The law of independent assortment)

යම්කිසි ගති ලක්ෂණයක් ආවේණිකවන සෑමවිට ම, එයට අනුරූප තවත් ලක්ෂණයකට වඩා ඉස්මතු වී, දෙවැන්න යටපත් කර ගනියි. ඉහත විස්තරයේ “ස්වීට් පී” ශාකයේ උස භාවය, මිටි භාවයට වඩා ඉස්මතුවන ලක්ෂණයයි.

ගති ලක්ෂණ වෙන්වීමේ දෙවන නියමයට අනුව ජීවීන්ගේ ජන්මාණු නිපදවීමේ දී, ජායා ජන්මාණු (female gamete) නිපදවන ඩිම්බ කෝෂවල අඩංගු දේහ, සෛලවල ඇති මාතෘ සෛල විභාජනය වීමේ දී, ඒවායේ වර්ණදේහාංශ එකිනෙකින් වෙන්වී එමගින් ජායා ජන්මාණු දෙකක් නිපදවයි. එමෙන්ම වෘෂණ කෝෂ හෝ පරාගධානි සෛලවල අඩංගු වර්ණදේහාංශ එකිනෙකින් වෙන් වී එමගින් පුං ජන්මාණු (male gamete) හටගනී. මේ ආකාරයට දේහ සෛලවල වර්ණදේහාංශ යුගල බැගින් පැවතීම “ද්විගුණී” (diploid) ලෙසටත්, ජන්මාණු නිපදවීමේ දී වර්ණදේහාංශ එකිනෙකින් වෙන් වී, එක් වර්ණදේහයක් සහිත නිපදවනු ලබන ජන්මාණු “ඒකගුණී” (haploid) ලෙසටත් හඳුන්වනු ලැබේ.

ගති ලක්ෂණ ස්වාධීනව එකතුවීමේ තුන්වන නියමය මගින් අනුව සංසේචනයේ දී ඒකගුණී වර්ණදේහ සහිත පුං ජන්මාණුවක් සහ ජායා ජන්මාණුවක් එකතු වී ද්විගුණී යුක්තාණුවක් නිර්මාණයවීමේ දී වෙනත් කිසිම සාධකයක බලපෑමෙන් තොරව ස්වාධීනව ක්‍රියාකරන බව පැහැදිලි කෙරේ. මෙහි දී, ශාකවල උස මිටි බව, පුෂ්ප පැහැය, බීජවල සිනිඳු හෝ රළුභාවය වැනි ගති ලක්ෂණ, එකිනෙකට ස්වාධීනව ඉස්මතුවන බව ද නිගමනය කරන ලදී. මේ ක්‍රියාදාමයට මූලිකවන වර්ණදේහවල ඇති සුවිශේෂී ඒකක

"ජාන" (genes) බව වෙනත් පර්යේෂකයින් විසින් පසුව තහවුරු කර තිබේ.

මෙන්ඩල් විසින් ඉදිරිපත් කරන ලද නියමයන්ට අනුව විවිධ ශාක සහ සතුන් ආශ්‍රිතව පසුව කරන ලද අභිජනන මගින් ප්‍රවේණිය පිළිබඳ තොරතුරු රාශියක් අනාවරණය වී තිබේ.

"ආරේ ගුණ නැරේ" යන පැරණි වාක්‍ය ඛණ්ඩය වර්තමාන ආවේණිය හෝ ප්‍රවේණිය යන නම් වලින් හැඳින්වෙන "ආරයට යාම" යන මතය හෝ "උරුමය" සමග බොහෝ දුරට ගැලපෙන බව මෙම කරුණුවලින් සනාථවේ.

මෙන්ඩල් විසින් ශතවර්ෂ දෙකකට ආසන්න කාලයකට ඉහත දී, ලොවට හෙළි කරන ලද "ආරය" පිළිබඳ ජීවවිද්‍යාත්මක කරුණු, නවීන විද්‍යාවේ මහත් පෙරළියක් සිදු කර තිබේ. ඔහු විසින් *Pisum sativum* ශාක භාවිත කර ලබාගත් මූලික තොරතුරු, මිනිසා ඇතුළු ඕනෑම ජීවියෙකුගේ ප්‍රවේණිය සඳහා අදාළවීම ඉතාමත් සුවිශේෂී සංසිද්ධියකි. විශේෂයෙන් ම, මිනිසාගේ වර්ණදේහ, සිතියම් ගත කිරීම මගින් පරම්පරාගත රෝග නිවාරණය සඳහා පිළියම් සෙවීම, ජාන හඳුනා ගැනීම මගින් අධිකරණ වෛද්‍යවිද්‍යාවේ දී දරුවෙකුගේ පිතෘ භාවය තහවුරු කිරීම වැනි අවස්ථා, මෙන්ඩල්ගේ මෙම සරල නිරීක්ෂණ ආශ්‍රිතව ගොඩනැගුණු ඉතා වැදගත් සංකල්ප වේ.

- **දයාරත්න වීරසේකර** [dayawee2@yahoo.com]

(images adapted from byjus.com, www.careerpower.in and www.khanacademy.org)

කලියුගයේ වස් කාලය



මෝසම් වැස්ස තිබි ඒ මුළු කලාපෙ ම
යටවෙයි ගංවතුර ගැලූවම පලාත ම
යනවා නාය, පස්කඳු දියවෙලා ගම
පාරක් තොටක් නොපෙනේ දස දිසාවෙ ම

මග බැස පිඬු සිඟා යාමට බැරි ලෙසට
ගුගුරා අහස මහ වැහි වැටෙනා කලට
අසරණ වී සිටින මහ සඟ හට පිහිට
වෙන්නැයි තිලෝගුරු හිමි දෙසුවා ලොවට

පන්සල් තිබුනෙ නැහැ අද වාගේ ජයට
ගහ කොළ යට තමයි හිටියේ හෙවනකට
කාලය ගත කලේ බණ භාවනාවට
ඇඟ ලා සිටි සිවුර පමණයි ඇඳුමකට

"වැහි කල නිමා වෙනතුරු හෙවනකට වෙලා
ලැබෙනා දනක් වළඳන් රස ගුණ නොබලා"
ඒ බුදු වදන අද දස අත කරකවලා
"වස් පින්කම්" කරති, "කහවනු" මුල්කරලා

අද අපි අවට ඒ වගෙ වැසි වහින කලක්
පිණ්ඩපාතයේ මහ සඟ වඩින ලොවක්
නොතෙමී සුවෙන් ඉන්නට කිසි අපහසුවක්
මේ සියවසේ නැහැ කිසිවෙකු අහපු බවක්

දානය සමග පිරිකර නිති පුද දේ නම්
ආවාසයක් තුල සැප-සුව සැලසේ නම්
වැස්සක් පිඬු සිඟා යාමක් නොම වේ නම්
ඇයි වස් වසන්නේ පවසනු වැටහේ නම්

වැහි නැති නියගෙදිත් ඇයි "වස්" එළඹෙන්නේ
පිඬු සිඟමනක් නැහැ දන් ටික ගෙට එන්නේ
වස් කාලයක් කොහොමද "හොලිඩේ" වෙන්නේ
මෙලෙසද බුද්ධ වචනයෙ අද හැසිරෙන්නේ

සම්බුදු සිරිත රැක ගන්නට පැවිදි වෙලා
ඉන්නා කෙනෙක් තන්හා ගති ඉවත හලා
මුදලට ගිජු වෙලා, බණ පද ඔප දමලා
විකුනා ගනිවි ද බැති සිත් රවටවලා

"චරථ භික්ඛවේ බහු ජන හිතා ය"
ඒ බුදු වදනෙ හැසිරෙන "බණ කතා" ය
පරවැඩ පිණිස හැම වදනම ගොතා ය
ඒ ලෙස නොවන්නේ තිරිසන් සතා ය

මුදලක්, පගාවක් ආදායමක් ගැන
නොසිතා, නොම පතා බුදු බණ අනුව යන
සිල්වත් හිමිවරුන් කවුදැයි හඳුනගෙන
සසරේ ඉම දකින්නට වෙර දරනු මැන

- **ආනන්ද ගුණතිලක** [a.gunatilake@hotmail.com]

පරිවර්තන සාහිත්‍යයෙන්

ගෙදර හැදුණු කොටියා

Ruskin Bond ලියූ “A Tiger in the House” කෙටිකතාවේ සිංහල පරිවර්තනය: හෙල්මලී ගුණතිලක

මගේ සීයාට තිමති නම් කොටි පැටියා හමු වී තිබුණේ දෙහ්රා ප්‍රදේශයට කිට්ටුවෙන් ඇති ටෙරායි කැලෑවට දඩයමේ ගිය අවස්ථාවක දී ය.

සීයා දඩයක්කාරයෙකු නොවුණත් ඒ අවට වනාන්තර සහ කඳු ප්‍රදේශ ගැන ඔහුට මනා අවබෝධයක් තිබුණු බැවින් දිල්ලියේ සිට පැමිණි ප්‍රභූ පිරිසකගේ මේ දඩයම් ගමනට සම්බන්ධවන සේ ඔහුට ද ආරාධනා කර තිබිණි. ඔහුට පැවරුණු රාජකාරි නම් ඒ ප්‍රදේශයේ භූ විෂමතා ගැන ඔවුන්ට උපදෙස් දීමත්, හදිසියේවත් ඔවුන්ට කොටියෙකු හමුවුවහොත් ඌ වෙඩික්කරුවන් වෙතට පැන්නීම සඳහා පත් කර සිටි කණ්ඩායමට මඟ කීමත් ය.

මේ දඩයම්කරුවන්ගේ කඳවුර පවා මහත් සුඛෝපභෝගී මට්ටමින් පැවතිණි. එහි විශාල කුඩාරම් හතක් (එක වෙඩික්කරුවෙකුට එක බැගින්), භෝජන කටයුතු සඳහා කුඩාරමක්, සහ සේවක කුඩාරම් කීපයක් විය. මේ දින කීපයේ දී ඔවුන්ට ලැබුණු රාත්‍රී ආහාර වේල පවා ඉතා හොඳ මට්ටමේ පැවතුණු බව සීයා පසුව කීවේය. මහා වනය මැද කුඩාරමක උණු වතුරෙන් අත සේදීමට කෝප්ප, උණුසුම් කරන ලද පිඟන්, කොටස් හත අටකින් යුතු කෑම වේලක් සහිත භෝජන සංග්‍රහයක් නිතර දක්නට නොලැබෙන බව ඔහුගේ අදහස විය. නමුත් මෙවැනි ප්‍රභූවරුන් බලයේ සිටි කාලයේ දේවල් සිදුවූයේ එලෙසිනි. මීට අමතරව මේ දඩයම් කණ්ඩායමේ අලි ඇතුන් පහළොවක් ද විය. මින් අලි හතර දෙනෙකු මත ප්‍රභූන් වෙනුවෙන් ආසන පනවා තිබුණු අතර සෙසු සතුන් පුහුණු කර තිබුණේ ගොදුර දඩයම් කණ්ඩායම වෙතට පලවා හැරීමටයි.

මේ චාරිකාවේ දී කණ්ඩායමට කොටියෙකු දකින්නටවත්, වෙනත් කිසි සතෙකු දඩයම් කිරීමටවත් අවස්ථාවක් ලැබුණේ නැත. නමුත් ඔවුහු මුව රංචුවක්, මොණරුන් සහ වල් ඌරන් දුටුවහ. ඔවුන් කොටියෙකු දැකීමේ අදහස අත්හැර නරින්ට වෙඩි තබන්නට පටන් ගත් විට මගේ සීයා ඒ කණ්ඩායමෙන් මඳක් ඉවත් ව කැලය මැදින් වැටුණු අඩි පාරක් ඔස්සේ ඉන් තරමක් ඔබ්බට ඇවිද ගොස් ඇත. මෙසේ යද්දී ඔහු නුග ගසක මුල් අතර සැඟවී සිටි අඩි එකහමාරක පමණ කුඩා කොටි පැටවෙකු දුටුවේය. සීයා ඌ තමන් ළඟ තබාගෙන හිඳ ඊට පසුදා දඩයම් කඳවුර අවසන් වූ පසු ගෙදර ගෙන ආවේය. ඒ දඩයම් කණ්ඩායමෙන් කිසිවෙකුට කිසිම සතෙකු මරා ගැනීමට හෝ මෙසේ පණ පිටින් අල්ලා ගැනීමට හෝ නොහැකි වූ අතර මෙවැනි වික්‍රමයක් කර තිබුණේ සීයා පමණි.

ඒ කුඩා කොටි පැටවාට තිමති යන නම දුන්නේ මගේ අත්තම්මා ය. මුල දී ඌ තනිකරම දැඩි වූයේ අපේ කෝකියා, මහමුද් දුන් කිරි වලිනි. නමුත් නොබෝ දිනකින් ඌට ඒ කිරි දිරවන්නට අපහසු බවක් පෙනුණු බැවින් උගේ කෑම වේල අමු එළු මස් සහ මෝර තෙල්වලට මාරු විය. තවත් කල් ගත වෙද්දී ඌට ලැබුණු පරෙවි සහ හා මස් ගැන ඌ වඩාත් කැමැත්තක් පෙන්වීය.

තිමතිට සගයන් දෙදෙනෙකු විය. ටොටෝ නම් වඳුරා කුඩා කොටි පැටවාගේ වලිගය ඇද ඌට සරදම් කිරීමට තරම් නිර්භීත වූ අතර තිමති ඉන් කුපිත වූ විට ටොටෝ ජනේල් රෙදි දිගේ නැග සැඟවිණි. මීට අමතරව සීයා පාරෙන් සොයාගත් කුඩා බලු පැටවෙකු ද මේ සමාගමට අයත් විය.

මුලදී තිමති බලු පැටවාට බෙහෙවින් බිය වූ අතර, ඌ ළඟට එද්දී විසුළු සහගත ලෙස ඌට තම විශාල පා වනා ඈතට දුව ගොස් සැඟවිණි. එහෙත් ටික කලක් යද්දී උන් දෙදෙනා බෙහෙවින් මිතුරු වූ අතර බලු පැටවාට තම පිට උඩ නිදා ගැනීමට ද කොටි පැටවා ඉඩ දුන්නේය.

තමන් සමඟ සෙල්ලම් කිරීමට සූදානම් ඕනෑම කෙනෙකු වෙත කුරුමානම් ඇල්ලීම තිමතිගේ ප්‍රියතම විනෝද ක්‍රීඩාවක් විය. එකල මම සීයාගේ ගෙදර නතර වන්නට ආ විට මේ ක්‍රියාව සඳහා මා කොටියාගේ ප්‍රියතමයෙකු විය.

එවන් අවස්ථාවලදී ඌ තම දිලිසෙන දැසේ කපටි බැල්මකින් යුතුව, පහත් වී බඩගාගෙන මෙන් ක්‍රම ක්‍රමයෙන් මා අසලට විත්, මගේ දෙපා වෙත පැන, උඩුකුරුව වැතිරී මහත් ප්‍රීතියෙන් පා ගසමින් මගේ වළලුකර සපන බවක් පෙන්වයි.

මේ වෙද්දී තිමති හොඳින් වැඩුණු බල්ලෙකුගේ තරම විය. මා ඌ ඇවිදින්නට රැගෙන යද්දී ගමේ මිනිස්සු අපව මඟ හැර යාමට උත්සුක වූහ. මෙවැනි ගමන්වල දී තිමති දම්වැල අදිද්දී මට ඌව පාලනය කර ගැනීම පහසු වූයේ නැත. නිවසේ උගේ ප්‍රියතම තැන විසිත්ත කාමරය වූ අතර, එහි වූ දිග සෝපාවේ මහත් තේජසින් යුතුව වැතිර හිඳිමින්, තමන් එතැනින් එළවීමට තැත් කරන අයට ගොරවමින් කාලය ගෙවන්නට ඌ ප්‍රිය කළේ ය.

තිමතිට ඉතා පිරිසිදු ගති පැවතුම් තිබිණි. ඌ බළලෙකු මෙන් තම ඉදිරි ගාත්වලින් මුහුණ සේදුවේය. රාත්‍රියේ දී කෝකියාගේ කාමරයේ නිදාගත් ඌ හැම උදෑසනකම ඉන් පිටතට යවන මොහොත එනතුරු බලා සිටියේ ප්‍රීතිමත් නොඉවසිල්ලකිනි.

“ඔහොම යද්දී දවසක උදේ බලද්දී තිමති මහමුද් ගේ ඇඳ උඩ ඉඳීවි. මහමුද් ගේ ඇඳුම්, සපත්තු විසිරිලා තියේවි. ඒත් මහමුද් නම් දකින්න නැතිවෙයි!” අත්තම්මා අනාවැකි පවසන ස්වරයෙන් නිතර කීවාය. එහෙත් ඇත්තටම නම් එවැන්නක් සිදු වූයේ නැත. තිමතිට සය මසක් පමණ වයසේ දී ඌ තුළ යම් වෙනසක් දක්නට වූ අතර ඌ එන්න එන්නම මිත්‍රශීලීබවින් අඩුවිය. මා ඌ ඇවිදින්නට ගෙන යද්දී දිවගොස් කාගේ හෝ සුරතල් පෙකිනීස් බල්ලෙකුට හෝ බළලෙකුට කුරුමානම් අල්ලන්නට උත්සාහ කිරීම් වැඩිවෙණු පෙනිණි. ඇතැම් රාත්‍රී කාලවල දී අපට කුකුළු කූඩුව වෙතින් බියපත් කෑගැසීම් ඇසුණු අතර ඊට පසු දිනයේ බරාඳය පුරාවට කුකුල් පිහාටු විසිරී තිබිණි. මේ හැම දෙයක්ම නිසා තිමතිව නිරතුරුව ගැට ගසා තැබීමට සිදුවිය. අන්තිමේදී ඌ මරණීය අදහසකින් යුතුව මහමුද් වෙත කුරුමානම් පාන බවක් පෙනෙන්නට වූ විට තිමති සත්වෝද්‍යානයකට මාරු කිරීමට කාලය එළැඹ ඇති බව සීයා තීරණය කළේය.

කිට්ටුම සත්වෝද්‍යානය තිබුණේ සැතපුම් දෙසීයක් එපිටින් ලක්නව් ප්‍රදේශයේ ය. සීයා තිමතිට සහ තමන්ට දුම්රියේ පළමු පන්තියේ මැදිරියක් වෙන් කරවා ගත්තේ ඔවුන් යන දුම්රිය මැදිරියක යාමට වෙන කිසිවෙකු අකමැති වූ බැවිනි. මෙලෙස තිමති ලක්නව් වෙත රැගෙන ගිය අතර සත්වෝද්‍යාන පාලකයෝ ද හොඳින් කෑම ලබා වැඩුණු, සෑහෙන තරමේ හොඳ හැසිරීමක් ඇති කොටියෙකු තෑගි ලබන්නට සතුටු වූහ.

මීට මාස හයකට පමණ පසු අත්තම්මාත්, සීයාත් ලක්නව් වෙත නෑදෑ ගමනක් ගොස් තිබිණි. මේ අවස්ථාවෙන් ප්‍රයෝජනගෙන සීයා එහි සත්වෝද්‍යානයට ගොස් තිමති ගේ සැප දුක් විමසන්නට තීරණය කළේය. මේ ගමනට මා එක් වූයේ නැතත් ඔවුන් ආපිට දෙහ්රා වෙත පැමිණි පසු මට ඒ ගැන සියලුම විස්තර ආරංචිවිය.

සත්වෝද්‍යානයට ගිය පසු සීයා කෙලින්ම තිමති රැඳවූ කූඩුව වෙත ගොස් ඇත. මේ වෙද්දී වැඩිහිටි තරමට වැඩී, අලංකාර ඉරි සලකුණු සහිතව සිටි තිමති, එදින සිට ඇත්තේ තම කූඩුවේ කෙළවරක ගුලි වී හිඳිමිනි.

“හලෝ තිමති!” කී සීයා, කූඩුව වටා වූ යකඩ වැට පහසුවෙන් තරණය කර කූඩුව වෙත ගොස් එහි කූරු අතරින් දෑත දමා ඇත. කොටියා තමන් වෙත පැමිණි විට සීයා උගේ හිස දෑතින් ම බදාගෙන අතගාන්නට පටන්ගෙන තිබේ. හිස අතගාමින්, දෙකන් කිතිකවමින් ඉන්නාවිට දී කොටියා ගොරවන්නට උත්සාහ කළ විට සීයා උගේ මුවට අතුල් පහරක් දී ඇත්තේ පෙර පුරුදු ලෙසිණි.

නොබෝ වෙලාවකින් තිමති, සීයාගේ දෑත ලෙවකන්නට පටන්ගෙන ඇතත් යාබද කූඩුවේ සිටි ව්‍යාඝ්‍රයා වරින් වර කූඩු දෙක අතර මායිමට පනින්නට වූ බැවින් ඒ හැම වාරයකම ඌ බිය වී සීයා වෙතින් ඉවත් වී තිබේ. සීයා මේ ව්‍යාඝ්‍රයාට තරවටු කර එළවා දැමූ විට තිමති නැවතත් ඔහු වෙත පැමිණයත්, ව්‍යාඝ්‍රයාගේ බාධා කිරීම වරින් වර සිදු වූ බැවින් තිමති වැඩි වෙලාවක් ගත කර ඇත්තේ තම කූඩුවේ කෙළවරක බියෙන් ඇකිලෙමිනි.

මේ වෙද්දී මිනිසෙකුගේ සහ කොටියෙකුගේ මේ සොඳුරු මුණගැසීම දකින්නට නරඹන්නන් කිහිපදෙනෙකු රැස් වී තිබිණි. සෙනඟ අතරින් මතු වූ සත්වෝද්‍යාන සේවකයෙකු සීයා වෙත පැමිණ ඔහු කුමක් කරන්නේදැයි විමසා ඇත.

“මම මේ තිමති එක්ක කතා කරනවා,” සීයා කියා ඇත. “මම මෙයාව මීට මාස හයකට කලින් මෙතැනට භාර දෙද්දී තමුන් හිටියේ නැද්ද?”

“මම මෙහෙ වැඩට ඇවිත් ඒ තරම් කල් නැහැ,” පුදුමයට පත් වූ සේවකයාගේ පිළිතුර විය. “කරුණාකරලා ඔය දෙන්නා දිගට ම කතාකරන්න. මට නම් ඌව කවදාවත් අල්ලන්න බැරි වුණා, ඌ හැමදාම හරි කේන්තියෙන් ඉන්නේ.”

“මෙයාව වෙන තැනකට නොදාන්නේ ඇයි?” සීයා අසා ඇත. “මේ එහා පැත්තෙ ඉන්න ව්‍යාඝ්‍රයා මෙයාව නිතරම බය කරනවා. මම ගිහින් සුපරින්ටෙන්ඩන්ට් හම්බවෙලා කතා කරන්නම්.”

සත්වෝද්‍යානයේ සුපරින්ටෙන්ඩන්ට් සොයා ගිය සීයාට ආරංචි වී ඇත්තේ ඔහු එදා වේලාසනින් පිටව ගොස් ඇති බවයි. එබැවින් සත්වෝද්‍යානය තුළ ටික වෙලාවක් ඇවිදිමින් ගත කළ සීයා නැවතත් තිමති ගේ කූඩුව වෙත ගොස් ඇත්තේ උගෙන් සමුගැනීමට යි. ඒ වෙද්දී ඇඳිරි වැටෙමින් තිබිණ.

නැවත වරක් කූඩුවේ කූරු අතරින් තිමති අත ගාමින්, ඌ ගොරවද්දී අතුල් පහර දෙමින්, විනාඩි පහක් පමණ ගත

කරද්දී තවත් සත්වෝද්‍යාන සේවකයෙකු බියෙන් මෙන් තමන් දෙස බලා සිටින බව සීයා දැක තිබේ. මොහු මීට සය මසකට පෙර තමන් තිමති එහි භාර දීමට පැමිණි විට සිටි සේවකයන්ගෙන් කෙනෙකු බව සීයා හඳුනාගෙන ඇත.

“ඔහෙට නම් මාව මතක ඇති,” සීයා කීවේය. “තිමති ව මේ මෝඩ ව්‍යාඝ්‍රයාගෙන් වෙන් කරලා වෙන කූඩුවකට මාරු කරන්නේ නැත්තේ ඇයි?”

“ඒත්- සර්-” සේවකයා ගොත ගසන්නට විය. “මේ සර්ගේ කොටියා නෙමෙයි.”

“හරි, හරි, මම දන්නවා,” සීයා නොරිස්සුමෙන් කීවේය. “මම දන්නවා දැන් මූ මගේ නෙමෙයි කියලා. ඒත් අඩු ගානේ මගේ යෝජනාවට කන් දෙන්න ඔහෙලාට පුළුවන් නේ.”

“මට සර්ගේ කොටියාව හොඳට මතකයි,” එවිට සේවකයා කීවේය. “ඌ මීට මාස දෙකකට කළින් මැරුණා!”

“මැරුණා!”

“ඔව් සර්, නිවුමෝනියාව හැදිලා මළේ. මේ ඉන්න කොටියා අර කඳුකර පැත්තෙන් අල්ලාගෙන ආවේ ගිය මාසේ, ඌ හරිම භයානක සතෙක් සර්!”

මෙය අසා සීයා නිරුත්තර විය. මේ වෙද්දීත් කූඩුවේ වූ කොටියා වැඩෙන උනන්දුවකින් ඔහුගේ අත ලෙවකමින් පසු වී ඇත. සීයා ඉතාමත් සෙමින් ඌ වෙතින් තම අත මුදාගෙන පිටතට ගෙන ඇත. කූඩුව තුළ වූ කොටියාගේ මුව සමීපයට එහි කූරු වලට මෙපිටින් තම මුහුණ ළං කළ සීයා, “සුබ රාත්‍රියක් තිමති,” යැයි කියා, සේවකයා වෙත රවා බලා, ඉක්මන් ගමණින් සත්වෝද්‍යානයෙන් පිට වී ගොස් තිබේ.

පරිවර්තනය: **හෙල්මලී ගුණතිලක**
[helmalie999@yahoo.com]

දුෂ්මන්ත, කියන්න!

එදා ඇය ඇසුවෙ නැති, අදත් නොඅසා ම බැරි,
එකෝමෙක පැනයකුත් තියෙනවා
දුෂ්මන්ත කියන්නකො උත්තරේ කිම වුණත්
බාරගන්නට වෙනව දන්නවා

කාලිදස් දුටුවෙ නැති, ඔබේ ඒ ආත්මය
ඇයි ද මා සොයන්නේ හිතෙනවා
ඉක්බිතිව සියල්ලෝ සතුටින් ම විසූමුත්
එහෙම බැරි වෙන්නටත් ඉඩ තිබුණි,
ඒක මං දන්නවා

මුදුව විතරක් අතැති පුතෙක් නැති ඇය තනිව
ඔබ සොයා ආවනම් අඳුනගන්නේ නැති ද
අදත් මට අහන්නට හිතෙනවා,
දුශ්මන්ත මම ඔබෙන් අහනවා!

- **රූපිකා ද සිල්වා** [rupikadesilva88@gmail.com]

මගේ සීදේවි

හීන කන්දෙන් හීන බිඳගෙන
යන්න අවසර ගන්න එනවද
ඉන්න ආසයි කතා වැට ළඟ
මෙහෙම ඉන්නම් දැස් අතරෙම

කවුරු කිව්වද යන්න ටිකකට
හිරුත් තරහයි වගේ හොඳට ම
මක්කරන්නද ඉන්න තව අද
නෙත් අරින්කො ළඟ රැඳෙන්නට

අනේ සඳවත සිසිල දෙනවද
පින්න සිසිලස බිඳක් හදවත
දැවටිලා මට ඉන්න දෙනවද
එපා යන්නට හිරුට රැවටී මගේ සීදේවි

- **නලිනි ද සිල්වා** [nalani.desilva006@gmail.com]

සිසිල ප්‍රහේලිකාව

මලී දිසානායක ගේ නිර්මාණයකි



samanmalee7@hotmail.com

හරහට

1. කුඩා බෝතල්
2. කැලේ දී මුණ ගැසිය හැක
5. ප්‍රනීත පානයකි (2, 3)
8. අව පැහැ
9. පැද්දිය හැක
11. පැරණි සිංහල චිත්‍රපටයකි
12. කෘමි අවයවකි
13. ජීවිතයේ සමයකි
15. මාරයෙකි
17. මගීන් අත ඇත (3, 2)
21. තමා සන්තක දෙයහි වටිනාකම
23. කැක්කුම්
24. සීනි ආදේශකයකි
28. ආලෝකය ලබාදෙයි (3, 3)
29. කාටත් පෙනේ (3, 2)
31. රථවාහනවල ඇත
32. පුවත්
33. රෑ කල දනියෙල් වේ ලු

පහළට

1. රැයෙහි පිපේ (3, 3)
2. පිනැති
3. එගොඩවීම
4. අභයභූමියකි
5. ගිවිසුමකි
6. අතීතයේ බහුලව සිදුවිය (3, 4)
7. පැහැයකි
10. නිරතුරු
14. රුසියානු අධිරාජයා
16. හිටපු හමුදාපතිවරයෙකි (3, 4)
18. ආහාරයකි
19. මුක්කුව
20. මහාමාර්ග අසල දැකිය හැක (4, 2)
22. සුභ කටයුත්තකි (3, 2)
25. මොහුගේ කට ගඳයි ලු (3, 2)
26. අමාරු
27. පැලැන්තියකි
30. පොතු

මෙවර ප්‍රහේලිකාවේ විසඳුම ලබන කලාපයේ පළවෙනු ඇත.

අපට ලැබුණු පොත්



සිඩ්නි නුවර වාසය කරන නාට්‍යවේදියෙකු සහ ලේඛකයෙකු වන චම්ප බුද්ධිපාල විසින් රචිත ගී පදමාලා තිස් හයකින් සමන්විත: සුපිපි පියුම් ගීත සංග්‍රහය, සවිසර ප්‍රකාශනයකි.



චම්ප බුද්ධිපාලගේ කාව්‍ය නිර්මාණ එකතුව: කවියාගේ මරණ දැන්වීම, සවිසර ප්‍රකාශනයකි.



එක්දහස් නමසිය හැත්තෑවේ දශකයේ ගුවන්විදුලි යෞවන සමාජයට සහභාගී වූ කවි කිවිඳියන්ගේ මෑත කාලීන නිර්මාණ ඇතුළත් කාව්‍ය සංග්‍රහය: නොනිමි කවි සිත්. සංස්කරණය: ස්වර්ණකාන්ති පෙරේරා සහ සුනිල් ජයන්ත නවරත්න. කතෘ ප්‍රකාශනයකි.

ඕස්ට්‍රේලියානුවාසී, මෛත්‍රී පනාගොඩ, සුනිල් ගෝවින්නගේ සහ විජායි ලක්ෂ්මී මොහොට්ටි ඇතුළු කවීන් දාහතර දෙනෙකුගේ නිර්මාණ මෙහි ඇතුළත් ය.

ඔක්තෝබර් 2024
සිසිල ප්‍රහේලිකා විසඳුම

1 අ	ච්	2 ච		3 ය	දි	4 යා		5 ග	ල්	6 පා	ල	7 ම
න		ධ		න්		ව		න්		ට		ළ
8 ල	ං	කා	පු	ත්‍ර			9 වි	නෝ	ද	ස	ම	ය
ස්		ගා		ය		10 ඊ		රු		රු		කා
11 බ	ඹ	ර	ය		12 බා	ල		13 ච	ල	ං	ගු	
ච				14 දී		ය				ග		
	15 ත	16 ම	ප	ම	ණ		17 හ	18 ස	ථ	ල්	ල	
		යු				19 කෝ		ච්				20 සු
	21 ච	රා	න	22 සි		23 ල	තා		24 සු	25 වි	ස	ල්
26 ස		ච		රි		ය		27 කා		ළි		තා
28 මු	හ	න්	දි	ර	ම්			29 ර	න්	රු	ව	න්
දු		න		හ		30 අ		ණ		දා		ව
31 ර	ජ	ම	ගු	ල්		32 බා	රි	ය		33 ච	ගු	රු

පිනි කිනිත්තක් හැඩවෙලා

සීතලම සුන්දරම දවසක පිනි කිනිත්තක් හැඩවෙලා
පොරෝගෙන එන හීතලෙන් ගුලිවෙලා යලි ගුලිවෙලා
තුරුළුවුණු ආදර හැඟුමකින් මතක ඇත යලි පිබිදිලා

ගැලවිලා කොල ගැලවිලා, කැලැන්ඩර් පිටු ඉගිලිලා
ආයෙමත් ඒවි ද ඇවිදගෙන තුරුණු විය යළි පියඹලා
යන්න ඒ සොඳුරු ම අතීතෙට යමු ද අපි අත් අල්ලලා

සුසුදු සුසිනිදු මුව පුරා විසිරි විසිරුණු මල් හිනා
හෙටත් උදයෙම පුබුදුවන්නට සළනු මැන ඒ මල් හිනා
ජීවිතේ පිණි මල් වහින්නට පැතුම් ගෙන එයි වාසනා

- අනුරුද්ධ වැලිගමගේ
[anuruddhawe@yahoo.com]

රසික සූරියආරච්චි

“ලෝකෙන් උතුම් රට ලංකාවයි” හෙවත් “අපි තමයි හොඳට ම කළේ”

මීට වසර තිහකට පමණ පෙර මට තායිවාන චීන ජාතිකයෙකු හමුවිය. මා ලාංකිකයෙකු බව දැනගත් විගසම ඔහු ඉතා සතුටින් මා සමඟ පැවසුවේ ශ්‍රී ලංකාවේ මිනිසුන් විසින් පරිත්‍යාග කරන ලද අක්ෂි කුණිත ඔහුගේ රටට ලැබෙන බවත්, ඒවා බද්ධ කරගෙන ඇස් පෙනීම නැවත ලබා ගත් සෑහෙන පිරිසක් එරට වෙසෙන බවත් ය.

ශ්‍රී ලාංකිකයින් බොහෝ දෙනෙකු මෙලෙස මියගිය පසු ඇස් කුණිත දන් දීමට කැමැත්ත පළ කරන බව අප දනිමු. එය එක් අතකින් බෞද්ධයෙකු ලෙස දාන පාරමිතාවක් පිරීම ලෙස ද අර්ථ දැක්විය හැකිය.

නමුත් සත්‍යය නම් ඕස්ට්‍රේලියාව වැනි රටවල ද මිනිසුන් මියගිය පසු තම සිරුරේ කොටස් වෙනත් අයට දීම සඳහා කැමැත්ත පළ කරන බවයි. විශේෂයෙන්ම හදිසි අනතුරකින් මිය ගිය පසුව ඇස් පමණක් නොව තමන්ගේ සිරුරේ වෙනත් කොටස් ද වෙනත් අයගේ ප්‍රයෝජනය පිණිස භාවිතා කිරීමට කැමැත්ත පළකිරීම රියදුරු බලපත්‍රයක් ගන්නා අවස්ථාවේදීම කළ හැක. මම ද ඕස්ට්‍රේලියානු වාහන බලපත්‍රය ලබාගැනීමේ දී එසේ කළෙමි.

යමෙකු එසේ කරන්නේ අන් අයගේ යහපත ගැන සිතා ය. එසේ නොමැතිව තමන්ගේ ලොකු කමකට නොවේ.

ලංකාවේ ඇස් කුණිත තායිවානයට යවන්නේ ඇස් නොපෙනෙන තායිවාන් ජාතිකයින් ගේ ප්‍රයෝජනය පිණිස මිස ලංකාවේ ලොකුකමක් පෙන්වීමට නොවේ.

ලෝකයේ විවිධ රටවල ගංවතුර භූමිකම්පා වැනි ව්‍යසන ඇති වී ජනතාවට උන්හිටි තැන් නැති වූ සමහර අවස්ථාවල ඔවුනට ආධාර පිණිස ශ්‍රී ලංකාවේ තේ කොළ පරිත්‍යාග කරන බව මම ලංකාවේ සිටිය දී පුවත්පත්වලින් දැක ඇත්තෙමි. ලංකාණ්ඩුව එසේ කරන්නේ තමන්ගේ ලොකුකමක් පෙන්වීමට නොව වෙනත් අයෙකු අසරණ තත්ත්වයට පත් වූ විට පිහිටවීම සඳහා ය.

ලංකාව 2022 වසරේ දී මුහුණ පා සිටි අසරණ තත්ත්වයට යම් කිසි ආකාරයකින් උදව්වීම පිණිස, ෆෙඩරල් රජයට අමතරව, දකුණු ඉන්දියානු තමිල්නාඩු රජයෙන් ද ආධාර ලැබුණි. ඒ සඳහා එකතු කළ අරමුදලට කුඩා ඉන්දියානු දැරියක් තම කැටයේ එකතු කර මුදල් ද, හිඟන්නෙකු විසින් අනුන්ගෙන් තම අසරණකම පෙන්වා ලබාගත් මුදල් ද ප්‍රදානය කර තිබෙන බව ප්‍රවෘත්ති සටහන් මගින් දැනගත්තෙමි.

තමිල්නාඩු ප්‍රාන්ත රජයෙන් එසේ කරන්නේ ඔවුන්ගේ ලොකුකම පෙන්වීමට බවත්, ලංකාවට සමච්චල් කිරීමට බවත්, ලංකාවේ අසරණ බව මුළු ලෝකයටම පෙන්නවා ලංකාව පහත් තත්ත්වයකට ඇද දැමීමට බවත්, ඔවුන්ගේ අභ්‍යන්තර දේශපාලන වාසි සඳහා බවත් ඒ සමයේ අපේ සමහර අයියලා පවසා තිබෙනු සමාජමාධ්‍ය ජාලා හරහා දුටුවෙමි.

එසේ නොව, ඔවුන් එලෙස ආධාර උපකාර කරන්නේ ලාංකිකයින් වැටී ඇති අසරණ තත්වය ගැන ඔවුන්ගේ සිතේ ඉපදුනු අනුකම්පාව නිසා සහ ඔවුන්ගේ දානමය සිතුවිලි නිසා බව පිළිගැනීමට ඒ අය පැකිළෙති.

එවැනි අදහස් පිළිබඳව මට ඇති වන්නේ පිළිකුලකි.

මේ අර “ලෝකෙන් උතුම් රට ලංකාවයි” හෙවත් “අපි තමයි හොඳටම කළේ” යන අමන මානසිකත්වය ම බව අමුතුවෙන් කිව යුතු නැත.

තමන් ගැන සතුටු වීම අවැඩක් නොවේ, නමුත් ඒ සමගම අනුන් පහත් කොට තැකීම නම් වසල ගතියකි.

න ජච්චා වසලෝ හෝති.
කම්මනා වසලෝ හෝති.

- රසික සූරියආරච්චි
[rasika.suriyaarachchi@gmail.com]

සංජීවයට දෙගමනක්

සරත් සමරසේකර

ජීවන්ත වීරසේකර සමග කුඩා කාලයේ සිට ආදර සම්බන්ධයක් පවත්වා ගෙන ගිය මේනකා ලියනගෙදර සිව් වසරකට පසු ඔහු හැර දමා වසන්ත කරලියැද්ද සමග විවාහ වීමට කැමැත්ත පළ කළා.

තමාගේ ඒ හදිසි තීරණය ගැන මේනකා තුලම ඇත්තේ පුදුමයක්. ඇය වසන්තට ආකර්ෂණය වෙන්නට එකම හේතුව ඔහු කඩවසම් දේහධාරී පොහොසත් පෞරුෂයකින් හෙබි පුද්ගලයෙක් වීම බවට නම් විවාදයක් නැහැ.

ජීවන්තට එවැනි පෙනුමක් හෝ පෞරුෂයක් නොමැතිවුවත් ඔහුට ඒ පුද්ගලයා කෙරෙහි වෛරයක් හෝ ඊර්ෂාවක් ඇත්තේ නැහැ. ඇත්තෙන්ම ඔහුට ඇත්තේ තමා කෙරෙහි උපන් ආත්මානුකම්පාවක් පමණයි.

මේනකා විවාහ වීමට යනබව කණ වැකුණු විට ජීවන්තට ඇතිවුණ වේදනාව වචනයෙන් කිව නොහැකි තරම්. තියුණු තුඩක් ඇති හීයක් අකාරුණික ලෙස හදවත පසාරු කරගෙන යනවිට දැනෙන වේදනාවට නොදෙවෙනි වේදනාවක් ඒ මොහොතේ ජීවන්තගේ හදවතේ ගැඹුරුම තැනින් පටන් ගෙන මුළු සර්වාංගය පුරා පැතිරී ගියා. ඉදිරි දිනක දී මේනකා වෙනත් පිරිමියෙකු සමග යහන් ගත වෙන බව සිහිවන වාරයක් පාසා ඒ වේදනාව ගින්නක් වී ඔහුගේ මුළු ශරීරයම දවා අළු කරනු ලැබුවා.

එදා මුහුදු වෙරළේ දී ජීවන්තගේ පෙම්වතිය ලෙස ඇය අවසන්වරට ඔහු මුණ ගැසුණු අයුරු - ඇයට නිතැතින්ම සිහිවුණා.

එදින හිරු බැස යන සැන්දෑ අහස රත් පැහැ ගැන්වෙමින් තිබුණු බව මේනකාට මතකයි. රතු බෝලයක් සේ දිස්වුනු හිරු ක්ෂිතිජයට එපිටින් නොපෙනී යන අයුරු ඈ බලා සිටින විට ඔහු තමාගේ මුහුණ දෙස අහිංසක ලෙස බලා සිටි අයුරු ඇයට සිහිවුණා. ඒ සිතිවිල්ලත් සමග ඇගේ පපුව මොහොතකට දැවී ගියා.

"තමුන් මේ කරන්න හදන්නෙ තිරිසන් සතෙක්වත් කරන්නෙ නැති වැඩක්. හැබෑටම තමුන්ට කලක් තිස්සෙ මෙච්චර ආදරය කරපු ජීවන්ත වගේ ප්‍රේමවන්තයෙක් ප්‍රතික්ෂේප කරල ඔහුව අමතක කරන්න හිත හදාගන්නෙ කොහොමද?" මේනකාගේ ඇතුලාන්තය ඇගෙන් ප්‍රශ්න කළා.

වසන්ත ඇය සමග කිව් ආකාරයට ළඟදී ම දවසක ඔහු ඇගේ වැඩිහිටියන් මුණ ගැහිල ඇය ගැන යෝජනාවක් ඉදිරිපත් කරාවි. එසේ කලවිට ඉදිරියට වෙන්න යන දේ ගැන හිතන්න මේනකා උත්සාහ කළා.

"නෑදෑකමක් තිබුනට අප්පච්චිට ජීවන්ත පේන්න බැහැ. අම්මගෙත් ඉතිං ඉහේ මලක් පිපුන වගේ වේවි. ජීවන්තල වගේ ද, ඒ අය? වංසක්කාර උදවියනේ." එහෙමයි මේනකාට හිතුණෙ. මේනකා දන්නව අප්පච්චි උඩින්ම කැමති වෙන බව.

* * *

විදුලි සෝපානය නොනැවතී පහලට ගමන් කරමින් තිබුණා. මේ වෙනකොට මේනකා ඒකට ගොඩවෙලා බොහෝ වෙලාවක් ගතවෙලා.

"ඇයි මේක නවතින්නෙ නැත්තෙ? මේක මොන නරකාදියට යනවද මන්ද?" මේනකා හිතුව. "හැබෑටම ඇයි මං මේකට ගොඩ උනේ?" දැන් දැන් ඇය තුල තැති ගැන්මක් ලියලන්නට පටන් අරගෙන.

"මේනකා උඹ හරිම නරක ගැහැණියක්. කුළුඳුල් අවංක ආදරයකට පයින් ගහල උඹ කර කරගත්තෙ ආනන්තරීය පාපකර්මයක්. මනුෂ්‍ය ඝාතනයක් කළත් එච්චර පවක් සිද්ධ වෙන එකක් නැහැ. උඹට මේ ආත්මෙ ම මේක පල දෙනව මේනකා," හෘර්දසාක්ෂිය ඇයට චෝදනා කළා.

ඇගේ කෙසඟ ශරීරය බරවී යන බවක් ඇයට දැනෙන්නට වුණා. ඒ මේ වෙලාවේ විදුලි සෝපානය නවතින්නට ආසන්නවී මන්දනය වෙමින් පැවති නිසා විය යුතුයි.

“ලිෆ්ට් එක නැවතුනා වගේ.”

“ඔන්න දොර ඇරුන.”

අනතුරුව ඇයට, කෙස්, මස් සහ ලොම් පිළිස්සෙන විට නැගෙන දුර්ගන්ධයට සමාන දුර්ගන්ධයක් දැනෙන්නට වුණා. එය ඉවසා සිටිය නොහැකි තරම්. එතැන ගිනි අඟුරු පිරුණු නරා වලකින් නැගෙන ගිනි දැල්වලින් නිකුත් වෙන තාපය නිසා රත්වුන වාතය ආඝ්‍රාණය කිරීමට බල කෙරෙන පරිසරයක් ඇති වෙලා තිබුණා. මේනකාට ඇතිවුණේ අප්‍රසන්න හා බියකරු හැඟීමක්. ඒ වාතාවරණය ඈ බියපත් කළා.

“සුභ සන්ධ්‍යාවක්!” කාලවර්ණ කොට මිනිහෙක් දොර ළඟ දී මේනකා පිළිගත්තා. “අපි ඉතින් කාටත් සුභ පතල තමයි වැඩ පටන් ගන්නෙ,” මිනිහ කිව්වා.

“ මම තමයි නිරය පාලක. මං වගේ අය තව ඉන්නව. මං යුෂ්මතියගෙ නම අහන්නෙ නෑ. මොකද, යුෂ්මතියගෙ ඔක්කොම දත්ත අපි ළඟ තියෙනව. ඒකයි”

“දැන් යුෂ්මතියට දැන ගන්න ඕනද මෙහේ එන්න කරුණු කාරණා යෙදුනෙ කොහොමද කියල?” නිරය පාලක අනතුරුව ඇසුවා.

“මොනවද මන්ද මේ මිනිහ දොඩවන්නෙ? කොහාටද මං මේ ඇවිත් ඉන්නෙ?” මේනකා තමාගෙන්ම ප්‍රශ්න කළා.

“මට තේරෙනව, යුෂ්මතිය ඉන්නෙ අවුලෙන්ය කියන එක. මෙතෙන්ට එන හැමෝටම තියෙන ප්‍රශ්නයක්නෙ ඕක. මේක අහල කලබල වෙන්න එපා. මේක තමයි අපාය. තමුන් ඇවිත් ඉන්නෙ අපායට. මනුස්ස ලෝකෙ ඉඳගෙන කියන විදියට කිව්වොත් යුෂ්මතිය අපායෙ ගිහින්!” නිරය පාලක පැහැදිළි කර දුන්නා.

“ඔය නිරිසතා දැන් හිතනව ඇති මං මොකටද අපායෙ යන්නෙ කියල. ඕන කමකට යන එකක් යැ? කරපු පව් පලදෙන්න අපාගත වෙනව මිසක්.” නිරය පාලක කිව්වේ මේනකා දෑස් අයාගෙන බය බිරාන්ත වෙලා සිටිද්දී.

“අපොයි දෙය්යනේ. මං අපායෙ යන්න තරං ලොකු පවක් කරල තියෙනවද? නෑ, එහෙම වෙන්න බෑ. ඇයි මට එහෙම වෙන්නෙ? මේක කාගෙ හරි කුමන්ත්‍රණයක්,” ඈ කෑකෝ ගසමින් කලබල කරන්නට වුණා.

“බයවෙන්න, කලබලවෙන්න හේතුවක් නැහැ. දැන් තියෙන්නෙ ඒ කාලෙ වගේ සාම්ප්‍රදායික අපායක් නෙවෙයි. කාලයත් එක්ක ඔක්කොම නවීකරණය වෙලා. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක ඉඳගෙන මානව හිමිකම් රැකෙන විදියට තමයි අපාය වුනත් දැන් මෙහේ කටයුතු සිද්ධ වෙන්නෙ,” නිරය පාලක සමග දිගට සිදුවුන සංවාදය අනුව මේනකාට ඔහු පිළිබඳව පැහැදීමක් ඇතිවුණා. ඇයට සිතුණේ මොහු යමපල්ලෙක් වුනත් නිරයට, නිලයට දෙකට ම ගැලපෙන හොඳ නිලධාරියෙකු කියායි.

“බුදු අම්මෝ!” ඈතින් ඇසුනු විලාප හඬ දිහාවට මේනකා හැරී බැලුවා.

“අපේ අලුත් කටු-ඉඹුලෙ ප්‍රශ්නයක් තියෙනව,” නිරය පාලක කරුණු පැහැදිළි කළා. “ප්‍රශ්නයක්මත් නෙවෙයි. අර ගිරා හොටේ වගේ වක් වෙච්ච උල් කටු අළුතෙන් උල්කරල, අලුත්වැඩියා කරල තියෙන හින්ද දැන් ගහෙන් බහින කොට ටිකක් වැඩිපුර අමාරුයි වගේ. ඒකයි අවුල.” එසේ කී නිරය පාලක හඬ ගා හිනාවෙන්න පටන් ගත්තා.

මේනකාට බියක් දැනෙන්නට වුණා. පව් කළ මිනිස්සු අපාගත වී ලබන සම්ප්‍රදායික දඬුවම් ගැන තමා කුඩා අවධියේ අසා ඇති විස්තර ඇගේ සිතේ මැවෙන්නට පටන් ගත්තා.

“සියුම් ආයුධවලින් යමපල්ලෝ නිරිසතාගේ ඇඟ මස් ලියති. ගිනිගෙන දිලිසෙන යපොළොවෙහි හොවා ඇඟ මස් සසිති. ඉරති. කර්මවේගය තිබෙනතාක් නොමැරී දුක් විඳිමින් ජීවත්වන නිරිසතා මහ දුකින් හඬ හඬා ඇත මැත දුව පැන ඇවිදී.”

“මෙකී නරකය ගිනිගෙන දිලිසෙන, කැකෑරෙන ලෝදියෙන් පිරී ඇත. නිරිසත්වයෝ මේ ලෝදියට වැටී තැම්බී තැම්බී දුක් විඳවති. ලෝදියෙන් ගොඩට එන විට යමපල්ලෝ ඔවුනට උල්වලින් ඇන නැවතත් ලෝදියට ම දමති.”

තමා එවැනි දඬුවම් ලැබීමට තරම් පව්කාරයෙක් දැයි මේනකා සිතුවා.

අර විලාප හඬ නැවතත් ඇසෙන්නට වුණා. ඒ අර පොතේ ඇති ආකාරයට රත් වූ තෙල් ඇඟට ඉසින නිසා ද, පණ පිටින් දිවස් හුල හිඳුවන නිසා ද විය හැකියි.

* * *

නිරිසතුන්ට දඬුවම් නියම කරන්නේ යම රජු වන අසුරයා. රතු පැහැති වස්ත්‍රයකින් සැරසී එක් අතකින් මුගුරක් දරා සිටින යම රජුගේ බියකරු මුහුණ දුටු මේනකා තැති ගත්තා.

“මම අපා ගතවෙන්න තරම් වරදක් කරලා නැහැ ස්වාමීනි. මම හිතන්නෙ මෙතන වැරදීමක් වෙලා තියෙනවා කියල,” ඈ පැවසුවා.

අනතුරුව යම රජු විසින් සංඥා කරන ලදුව චිත්‍රගුප්ත විසින් අග්‍රසන්ධානි පුස්තකය උන්වහන්සේ ඉදිරියට පමුණුවනු ලැබුවා.

චිත්‍රගුප්ත කියන්නේ යම රජ්ජුරුවන්ගේ ලේකම්වරයා බවත් අග්‍රසන්ධානි පුස්තකය යනු අපායේ පිං පව් ලියා තබන පොත බවත් මේනකා අසා තිබුණා.

අනතුරුව චිත්‍රගුප්ත පෙරලා දුන් පිටුව යම රජු කියවන්නට පටන් ගත්තා.

“තමාට පණ මෙන් ආදරය කළ සත්පුරුෂයෙකු කාලයක් ඇසුරු කිරීමෙන් පසු, ද්වේශ සහගත ලෙස හැර දමා, ගිරා

හොටයක් හා සමාන වූ නාසයක් හා පළල කාමුක දෙතොල් ඇති, උස මහතින් ද යුක්ත වූ නළුවෙකු වැනි නරයෙක් සමග හාදවීම, එසේ කිරීම තුලින් අර සත්පුරුෂයා හැරයාම, ප්‍රතික්ෂේපකිරීම, වේදනාවට පත්කිරීම සහ ඊටත් වඩා ඔහු අපහාසයට ලක්කිරීම සහ ඉන් නොනැවතී ඔහු ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කිරීම."

"මොන පිස්සුද යම රජතුමනි. ඒකනං වැඩි කැල්ලක්. මං කවදාවත් ඒ වගේ කුමන්ත්‍රණයක් කරල නැහැ."

"කට... කට... කොහොම උනත් යුෂ්මතියට උවමනා උනේ අර ගිරා හොටයත් එක්ක යහන් ගත වෙන්න. උගේ පෞරුෂයට ආශක්ත වීම නිසා උගේ පහස ලබන්න. කොටින්ම කිව්වොත් ඌත් එක්ක නිදි වදින්න. එහෙම නේද?"

ඊට ඇයගෙන් ප්‍රතිචාරයක් ලැබුණේ නැහැ.

"සත්පුරුෂයෙකු පීඩාවට පත් කිරීමේ පාපකර්මය අනෙකකු විසින් කළ දෙයක් නොවන නිසා එහි විපාකය තී විසින්ම විඳිය යුතුයි."

විනිශ්චය ලබා දීමෙන් පසු යම රජු යමපල්ලෙකු කැඳවා යමක් පැවසුවා.

"මට පව් කියලත් හිතෙනව මේකි ගැන. ඒ වුනාට දඬුවමේ පළමු අදියර ඔය වගේ සුන්දර එකක් වෙච්ච එක කොච්චර හොඳද?"

"අනික ඉතිං මූණ පොඩ්ඩක් අප්සෙට් උනාට උන්නාන්සෙගෙ පුෂ්ටිමත් කොළපාට ශරීරය සහ අංගෝපාංග ඇහැ ගැහුණම මේකිට ආස හිතෙයි," යමපල්ලා එසේ සිතුවේ චූදිත නිරිසතා යම රජුගේ නිදන කුටිය වෙත කැන්දා ගෙන යද්දීයි.

* * *

එදින රාත්‍රියේ සංජීව නරකයේ සිට ඇසුණු විලාපය යොදුන් පාළොස්දාහක් ගෙවා මනුෂ්‍ය ලෝකයට පැමිණ මේනකාගේ නිවසේ පැළදොරින් ආලින්දයට පිවිසියා.

සාලයේ රූපවාහිනිය නරඹමින් සිටි සුජාතා හඬ ඇසුණු දිශාවට දිව ගොස් සිය වැඩිමහල් සහෝදරිය නිදා සිටි කාමරයේ දොර විවෘත කළේ තරහෙන් පිපිරෙමින්.

මේනකා අඩ නින්දෙන් පිබිදී සිටියා. පෙර දින රාත්‍රියේ මැදියම් රැය පසු වී අඩසිහියෙන් මෙන් ගෙට ගොඩවුණු ඇය බීමත්ව සිටි අයුරු සිහිකළ සුජාතා ඇයට දෝෂාරෝපණය කරන්නට වුණා. වසන්ත ඇය ගෙනවිත් ඇරලුවේ හොඳ සිහියෙන් සිටිය දී නම් නෙවෙයි.

"තමුසෙට මොකද්ද මේ හැදිල තියෙන පිස්සුව. හැබැටම මොකද්ද තමුසෙ ඔය නටන නාඩගම?"

"ලැජ්ජයි ඕයි ගෑණියෙක් වෙලා තමුසෙ හැසිරෙන විදිය. එක පිරිමියෙක් එක්ක ඉන්න බැරි තමුසෙ මොන වගේ ගෑණියෙක් ද? තමුසෙ ජීවන්ත අතෑරලා ඔය ළංකර ගෙන ඉන්නෙ මොකෙද්ද? පොත්ත සුදු උනාට හැම එකාම නළුවො වෙන්නෙ නැහැ. තමුසෙ දන්නෙ නැහැ තමුසෙට අන්තිමේදි වෙන්නෙ මොකද්ද කියල," සුජාතා කෑගැසුවේ ජීවන්ත කෙරෙහි උපන් අනුකම්පාව හිතේ දරාගෙනයි.

"අනේ සුජාත, තමුසෙ යනවද යන්න මගේ වැඩ වලට අත පොවන්නෙ නැතුව?" මේනකාද පිළිතුරු දුන්නේ කෝපය ආරූඪ කරගෙනයි.

මේනකා එසේ කීවද තමා අතින් විශාල වරදක් වී ඇති බව ඇයට ඒත්තු යමින් තිබුණා. මොහොතකට පෙර දුටු සිහිනය ඊට තරමක් දුරට බලපාන්නට ඇතැයි සිතන්නට පුළුවන්.

"මේනකා, ඔය පිස්සු අදහස අතහැරල අපි කලින් හිටිය විදියට ඉන්න ඔයා කැමති නැද්ද?" එදා ජීවන්ත ඇගෙන් ඇසූ බව ඇයට සිහිවුණා.

මේනකා දැඩි තීරණයකට පැමිණියා. ඈ ජීවන්ත කමා කරවාගෙන නැවත ඔහු සමග ආදරණීය ජීවිතයක් ආරම්භ කරන්නට සිත හදා ගත්තා.

* * *

ජීවන්ත මේනකාට මුළු හදවතින්ම ආදරය කළා. ඇය ඔහුට අත්වැලක් වී ඔහුගේ ජීවිතය ආලෝකමත් කරනු ඇතැයි ඔහු අපේක්ෂා කළා. එය ඉටු නොවුණු තැන දැඩිසේ කලකිරීමට පත්වුණු ජීවන්ත අමාරුවෙන් ඒ වේදනාව දරා ගත්තා.

දැඩි ආවේගය නිසා එදා ඔහු ඇසූ අර ප්‍රශ්ණයට ඇයගෙන් ලැබුණු පිළිතුර කුමක් වුවද මේනකා වැනි චපල චරිතයක් තමාගේ ජීවන සහකාරිය කරගන්න ඔහු කොහෙත්ම කැමැති නොවන බව ඇය නොදැන සිටින්නට ඇති. එදා මේනකාට සුභ පැතූ ජීවන්ත විදේශ රටක පදිංචියට ගියා.

මේනකා ලියනගෙදර සහ වසන්ත කරලියද්ද අතර විවාහය සිදුවුණා. විවාහයෙන් තුන් මසකට පසු වසන්ත විදේශ ගත වුණා. කීමට කිව්වෙ ඔහුට ලැබුණු ශිෂ්‍යත්වයක් නිසා විදේශ ගත වෙන්න සිදුවුණා කියලයි. එහෙත් ශිෂ්‍යත්වය නිමාවී ඔහු නැවත පැමිණි බව අහන්න ලැබුණේ නැහැ.

* * *

එදා මෙදා තුර පනස් වසරකට වැඩි කාලයක් ගත වෙලා ය.

විදුලි සෝපානය මන්දනය වෙමින් පවතී. එනම් එය නැවතීමට ආසන්නය. එහෙත් එදා මෙන් ශරීරය බරවී යන බවක් මේනකාට නොදැනේ. අද ඇගේ ස්කන්ධය ශූන්‍ය වී ඇති බැවිණි.

සෝපානය නතර වෙයි.

දොර ඇරේ.

"සුභ සන්ධ්‍යාවක්!" කාලවර්ණ කොට මිනිසා ඇය පිළිගනී.

- **සරත් සමරසේකර** [sarath.nz@gmail.com]

සංජීවයට දෙගමනක් කෙටිකතාව පිළිබඳ සංස්කාරක සටහන:
බෞද්ධ ලියවිළිවලට අනුව අසුර, ප්‍රේත, තිරිසන්, සහ නිරය යන සතර අපායෙන් නිරය නම් අපායේ සංජීවය, කාලසූත්‍රය, සංඝාතය, රෞරවය, මහා රෞරවය, තාපය, ප්‍රතාපය, සහ අවීචිය යනුවෙන් කොටස් අටකි. එයින් සාපේක්ෂව භයංකාරත්වයෙන් සහ වදහිංසාවෙන් අඩු සංජීවය නම් අපායට යන්නේ සත්ව ඝාතනය තම ජීවිකාව ලෙස කරන පුද්ගලයන්, අධික කෝපය හෝ මානය නිසා දුබලයන් තලා පෙලා කටයුතු කරන රජවරු, පාලකයන්, සහ නිලධාරීන්, දුප්පතුන් පෙළූ පොහොසතුන්, සහ අසරණ මිනිසුන්ට හිරිහැර කොට වස්තු සම්පත් උදුරාගත් සොරුන්, මැරයන් යනාදීන් බව කියවේ. යම පල්ලෝ සංජීවයේ උපදනා නිරිසතුන් ගිනියම් වූ පොළවේ ගසා කැලි කැලි කොට කපති. එසේ කපද්දී ද නිරි සතුන් මැරි මැරී යලි යලිත් මේ අපායේ ම උපදිනා බැවින් සංජීවය (නැවත උපදින) යන නම මෙයට ලැබී ඇත.

අවසාන සුසුමේ
:: ලෞකික version

නිදහසේ...
නොදුටු රුව සොයමින්
පොළෝ තලයේ හැංගෙමින්
නිහඬ නිසසල
අවසාන සුසුමේ
ස්නේහයෙන් වෙන්වී
දියෙහි මුසුවී
මිහිකතම සරු සාර කරමින්
ගලා යාදෙන්...

මුසුවෙමින්
සොඳුරු මහපොළොවේ
නිදා නොනිදා
මවගේ මිහිමඩලේ
කිරි රසය ඉල්ලා
හඬන බිළිඳුන් සේ
ගුලිවෙමින් හැංගී
නුඹගේ මිහි රසයේ
ගලා යාදෙන්...

තාවතිංසේ
රටා මවමින්
ගලායාදෙන්...
කෙම්බිමක් හමු වී
දිනෙක පැලවෙන
තුරු සුසුම් අපගේ
සැනසීම ලබමින්
මුදාලන්නම්
නොදුටු නිදහස
අවසාන සුසුමේ...

- අසංක ලක්නාත [laknatha@laknatha.com]

තුටු සඳ විල

සඳ දුරයි නොහැක මට ළංවන්න
සඳ දිලෙයි හැකියි මට දැක ගන්න
පුන් පෝය දින රෑට දුටුවාම
වෙර අරන් ඉගිලෙනව ඔබ ළඟට
ඔන්න මං ඉගිලෙනව තිර ලෙසම

නිල් පාට අහස් කුස දුර ඈත
මල් පිපෙන පුන් පෝය දා රෑට
කිමද ඔබ පිපෙන්නේ ඔය ලෙසට
කියන්නකො අළුයමින් ඇවිත් මට
නොනිදාම මං හිඳිමි
හිරු වුනත් වසාගෙන

දිලෙන ඔබෙ කිරණ විත් මං ළඟට
කියන දේ තේරෙන්නෙ නෑ ම'හට
කඳුළු එනවා එවිට
මුව තෙමාගෙන දිගට
සුළඟ එතකොට ඇවිත් මං ළඟට
කඳුළු පිසලා යනව
පේන්නේ නෑ ඔබට

මගේ පැල දැක්ක නේ
ඔබත් සඳ
මගෙ පැටව් අඬනවත් දැක්කාද
ඇත්තමයි පුන් පෝයදා රෑට
මගෙ පැටව් බඩගින්නෙ හිනැහෙනව
බලාගෙන ඔබේ දෙස උඩ අහසෙ
ගයනවා ලස්සනට රස ගීත
ඒකමයි මං බලන් ඉන්නවා
එන්න පුන් සඳ රෑට

- ඩී. අමරසිරි ගුණවර්ධන
[amarasiridg@gmail.com]

චක්‍රය

අනුෂ්ක තිලකරත්න

අසේල බසයෙන් බැස්සේ ම මදක් චකිතයෙනි. මිතුරු ප්‍රණීත් ගේ නිවසට යාමට තවත් බසයක යා යුතුය. “බස් එකක් නැත්තං ත්‍රී-වීල් එකක හරි යනවා,” යැයි සිතූ අසේල ගමන් මල්ල ද ඔසවාගෙන මාවත දිගේ ඉදිරියට ඇවිද ආවේය. “ෂික්, ප්ලේන්ටියක්වත් බොන්න තැනක් තිබ්බ නං. මේ වෙලාවට මේ පැතිවල කඩ ඇරල නෑ වගේ!”



ඉදිරියෙන් තිබූ වංගුවෙන් හැරෙනවාත් සමග ම අසේලට මද සතුටක් ඇති කරමින් කුඩා හෝටලයක් දිස්විය. “වහන්නද කොහෙද හදන්නෙ, ප්ලේන්ටියක් බී ගත්තනම් ඇති,” යැයි සිතමින් ඔහු හෝටලයට ඇතුල්විය. හෝටලය තුළ දල්වා තිබූ විදිලි බුබුළුවලින් නිකුත් වූ මද ආලෝකයෙන් එහි කිසිවෙකු නොමැති බව අසේලට පෙනුණි.

“කඩේ කවුද? අපිට ප්ලේන්ටියක් බොන්න පුලුවන් වෙයි ද?” අසේල මදක් උස් හඬකින් ඇසුවේය. හෝටලයේ පසුපස බිත්තියක තිබුණු කුඩා දොරෙන් මතුවූයේ කාලවර්ණ සමක් ඇති මදක් මිටි මහත ශරීරයක් තිබූ පුද්ගලයෙකි. පුදුමයෙන් මෙන් මද වේලාවක් අසේල දෙස බලා සිටි මිනිසා “කොල්ලෝ මේ මහත්තයට ප්ලේන්ටී එකක් දාල දියං,” යැයි කීවේය.

කතා කළ ඌරුවෙන් ඔහු ද්‍රවිඩ ජාතිකයෙකැයි අසේල අනුමාන කළේය. “මාත්තය මේ පලාතෙ කෙනෙක් නෙවෙයි වගේ? දැන් හොඳටම රෑ බෝ වෙලා නේ, කොයිද මේ එන්නේ?” කරුණාවන්ත ලෙස ඔහු අසේල ඇමතීය.

“යාළුවෙකුගෙ ගෙදර යනව මුදලාලි. ටිකක් රෑ උනා”.

“ආ, ෂරි ෂරි. කොල්ලො ඉක්මනට ගෙනෙන්, මාත්තය පරක්කු නොකර,” මුදලාලි තරමක් උස් හඬින් කුස්සියේ සිටි කවුරුන් හෝ ඇමතීය.

මද වේලවකින් තරමක් කෙසඟ, බයාදු පෙනුමක් ඇති අවුරුදු පහළොවක පමණ පිරිමි ළමයෙකු ප්ලේන්ටියක් ද ගෙන පැමිණ, එය අසේලට පිළිගන්වා බයාදුලෙස සිනා සී නැවත කුස්සියට රිංගා ගත්තේය.

පැරණි ගීතයක් ප්‍රචාරය වෙමින් තිබූ රේඩියෝව දෙස බැලූ අසේලට සිතුණේ එය දශක කීපයක් පැරණි එකක් බවයි. “පුහ් ඇන්ටික් බඩුවක් නෙ. ඒකටම හරියන පරණ සිංදු,” සිතූ අසේල බිත්තියේ වූ කැලැන්ඩරය දෙස ඕනෑකමින් බැලූයේ එහි වූ නිළිය කවුදැයි අඳුනා ගත නොහැකි නිසාය. කැලැන්ඩරයේ සටහන් වර්ෂය දුටු අසේලට සිනහ පහළ විය. “1983! මේක කටුගෙට හොඳයි මුන් දෙන්නත් එක්කම.”

අසේල ප්ලේන්ටිය බී ඉක්මන් ගමනින් මුදලාලි සිටි කැෂියර් මේසය වෙතට ආවේ ඉක්මනින් මුදල් ගෙවා දමා ගමනේ ඉතිරිය යාමට අවශ්‍ය නිසා ය. තේ හදන කොල්ලා ද එවේලේ මුදලාලි අසලට වී සිටියේය. කුස්සියේ සිටි ඔහු කෙසේ මෙතනට ආවාදැයි කල්පනා කරමින් අසේල මුදල් පසුම්බිය විවෘත කළේය.

“මුදලාලි! අද නේද දවස? දැන් නේද වෙලාව?” ඇඬුම්බර හඬකින් කොල්ලා මුදලාලි ඇමතුවේය.

“ඔව් කොල්ලො අද තමයි,” එවැනිම හැඬුම්බර හඬකින් මුදලාලි පවසා සිටියේය.

“මුන් දෙන්නටම පිස්සු ද?” යැයි සිතමින් අසේල මුදල් නෝට්ටුවක් මුදලාලි වෙතට දිගු කලද ඔහු එය ගන්නා පාටක් නැත.

“මුදලාලි මේ සල්ලි?” ඉක්මනින් මුදල් ගෙවා මෙතනින් ඉවත්ව යැමට අසේල උත්සහ කළේය. ඈතින් බල්ලෙකුගේ උඩු බිරුමක් ද ඇහෙන්නට විය. මුදලාලි ද, කොලුවා ද හිස් බැල්මෙන් ඇසිපිය නොහෙලා අසේල දෙස බලා සිටියෝය.

හදිසියේම හෝටලය තුලින් දුමාරයක් මතුව එනු දුටු අසේල කලබල වී වටපිට බැලුවේය. හෝටලයේ වහලෙන් මහා

ගින්නක් මතුව එයි. මොහොතකින් ගින්න හෝටලයේ බිත්තිවලට ද පැතිරිණි.

“මුදලාලි මේ ගින්නක් නේද? ඒයි මේ කඩේ ගිණි ගන්නව නේද?” තමා දෙස හිස් බැල්මකින් බලාසිටි මිනිසුන් දෙදෙනාට කෑ ගසමින්ම අසේල හෝටලයෙන් ඉවතට දිව්වේය.

මුලු හෝටලයම මහා ගින්නකින් වෙළී යද්දිත් පැනයාමට කිසිම උත්සාහයක් නොගන්නා මුදලාලි ද, කොලුවා ද දෙස භීතියෙන් බලා සිටි අසේල පාර දිගේ පිස්සෙකු මෙන් දිව ගියේ උදව්වට කවුරුන් හෝ සොයා ගැනීමටය.

උදව්වට කිසිවෙකුත් නැත. අහල පහල ගෙයක් දොරක්, මිනිස් පුළුටක් ඇති සේයාවක් ද නොපෙනේ. හදිසි සේවා අංකයකට ඇමතීමට අසේල තම ජංගම දුරකථනය අතට ගත්ත ද අවාසනාවකට එහි බැටරි බැස ඇත.

“මේ මොන කරුමයක්ද? අර මිනිස්සු දෙන්න එළියට පැන්නෙ නැත්තෙ ඇයි?” සිය හිස තුළ කැකෑරෙන ප්‍රශ්න මැද අසේල මාවත දිගේ ඉදිරියට දුව ගියේය. ඈතින් මලානික එළියක් මතුව එනු දුටු අසේලට මද සහනයක් දැනුණි. ඒ පැමිණෙන්නේ ත්‍රී-වීලරයක් බව දුටු අසේල පාරටම පැන එය නවතා ගත්තේය. ත්‍රී වීලරය පදවාගෙන ආවේ තරමක් වැඩිහිටි අයෙකි.

“මහත්තය කොහාටද?” ඔහු ඇසුයේ දහදියෙන් තෙත් වූ අසේල ගේ මුහුණත්, ඔහුගේ ගමන් බෑගයත් දෙස බලමිනි.

“අය්යෙ මාර වැඩක් නෙ! අර අතන වංගුවට එහා තේ කඩයක් ගිනි ගන්නව. මිනිස්සු දෙන්නෙකුත් ඉන්නව ඇතුලෙ. කවුරුවත් නෑ උදව්වට! ඉක්මනට යංකො. මගෙ ෆෝන් එකේ බැටරි නෑ. අය්යෙ පොලීසියට කෝල් එකක් ගමු ද ඔයාගෙ ෆෝන් එකෙන්?” හුස්මක්වත් නොගෙන අසේල එක දිගට කියාගෙන ගියේය.

“වංගුවෙ! ඉස්සරහ!” ඉතා සෙමින් තමාට ම කියා ගත් ත්‍රී-වීල් රියදුරා කුමක් දෝ දෙයක් කල්පනාකරන බව අසේල දුටුවේය.

“මොනාද අය්යෙ තවත් හිතන්නෙ? ඉක්මන් කරල මොනා හරි කරමු!”

“මහත්තය කලබල නැතුව නගින්නකො වීල් එකට. අපි යමුකො ඉස්සරහට,” අසේලව නංවාගත් රියදුරා මදක් හෙමින් ත්‍රී-වීලරය ධාවනය කරන්නට විය. පැත්තෙන් වූ හිඩසින් ඔලුව එළියට දමාගෙන අසේල පාර අයින දෙස බලාගෙන ආවේ ගිනිගන්නා කුඩා හෝටලය දකින්න බලාපොරොත්තුවෙනි. තමන් දිව ආ දුර ආපසු ත්‍රී-වීලරයේ පැමිණිය ද ගිනි ගනිමින් තිබුණු ගන්නා හෝටලය තවම නොපෙනේ.

“මහත්තය මේ හරියෙ ද ඒ හෝටලේ?” රියදුරා ඇසුවේය.

“තව ටිකක් ඉස්සරහ වෙන්න ඕනෙනෙ අය්යෙ. මහ අලි ගින්නක් නෙ! දුරට පේන්න එපැයි!” තවමත් ත්‍රී වීලරයෙන් ඔළුව එළියට දමාගෙන සිටි අසේල පැවසීය.

අසේලව පුදුමයට පත් කරමින් රියදුරා ත්‍රී වීලරය මාවත අයිනේ නතර කළේය.

“මොනාද කරන්නෙ? යන්නැද්ද? අරෙහෙ වෙන්න ඕනෙ දේ වෙලා ඇති. ඉක්මන් කරනවකො,” පුදුමයෙන් ද, කේන්තියෙන් ද යුතුව අසේල කෑ ගැසීය.

“මහත්තය හිමීට බහින්නකො,” ඉතාම සංසුන් නිවුණු හඬකින් පැවසූ ත්‍රී-වීල් රියදුරා ඇන්ජිම ද නිවාදැමුවේය. පුදුමයෙන් වික්ෂිප්තව අසේල ත්‍රීවීලරයෙන් බැස්සේ ය.

“මහත්තය මේක තමයි ඒ හෝටලේ තිබ්බ තැන!” රියදුරා ස්ථිර හඬකින් පැවසුවේය. පුදුමයෙන් වටපිට බැලූ අසේලට තමන් දුව ආ මාවත දෙපස බලද්දී රියදුරා පවසන්නේ ඇත්තක් බව වැටහුණි.

“ඉතිං කෝ හලෝ ඒක? හෙන ගින්නක් නෙ තිබ්බෙ. තාම ගිණි ගන්න එපැයි! මේ මොන විකාරයක් ද?” අසේල වටපිට බලමින් ම කෝපයෙන් කීවේය.

“කලබල වෙන්න එපා මහත්තය. පොඩ්ඩක් සංසුන් වෙන්නකො. ඒ හෝටලේ තිබ්බෙ මෙතන මහත්තය. දෙමළ මුදලාලි කෙනෙකුයි, නුවරඑළිය පැත්තෙ පොඩි කොල්ලෙකුයි තමයි කඩේ කරං හිටියෙ. හරි හිත හොඳ මිනිස්සු මහත්තය! අද ජූලි විසි පහනෙ. අසූතුනේ ජූලි කලබල කාලෙ කාලෙ විසිපස්වෙනි දා ඔය කඩේට ගිණි තිබ්බ. නිකන් නෙමෙයි, මුදලාලියි, කොලුවයි දෙන්නමත් එක්ක. හෙණ ගහන අපරාධ මහත්තය. මගෙ ඇස්දෙකට දැක්ක ගින්න. එදා ඉඳන් එක එක කාලෙට ඔය වගේ දේවල් මෙතන වෙනව. ඊට පස්සෙ තවත් අය මෙතන කඩ කරන්න හැදුව. ඒත් හරි ගියේ නෑ. එක එක කරදර වෙලා ඒ සේරම නැති වෙනව. අන්තිම කඩේ හදපු මුදලාලි ඒ කඩේ කඩල දාල ගියා. ඇත්තට ම දැන් මෙතන කිසිම බිල්ඩිමක් නෑ. ඔය හොඳට බලන්නකො. මෙතන කඩයක් නෑ මහත්තය. මහත්තයට මුකුත් කරදරයක් වුනේ නෑ නෙ. ඒ හොඳටෝම ඇති. දැන් මහත්තය යන්න ආපු ගමන් යමු. මං මේ හයර් ඉවර කරල ගෙදර යනව. කමක් නෑ. මට යන්ඩ ඕනෙ තැන කියන්ඩකො . මං මහත්තයව ගෙනිහින් දාන්නං.”

අසේලට රියදුරාගේ කතාව අදහාගත නොහැකිව බොහෝ වේලාවක් එතැන බිම පරීක්ෂා කරමින් සිටියේය. මෙය විය හැකි දෙයක් ද? ඔහු පවසන්නේ බොරුවක් නොවේ. මෙහි කිසිම ගොඩනැගිල්ලක් නොමැත.

ත්‍රී-වීලරයේ සංසුන්ව වාඩි වී සිදු වූ සියල්ල තේරුම් ගැනීමට වෑයම් කරමින් තෝංතු ස්වාභවයකින් යුක්තව අසේල ගමනේ ඉතිරි දුර නිහඬවම ගමන් කළේය.

“මහත්තයෝ... මේ හැම දේම චක්‍රයක් වගේ. ආයෙ ආයෙත් සිදුවෙනවා. අනාගත පරම්පරාවල්වත් මොළේ ඇතුව

ජීවත්වෙන්න ඕනෙ! බොරු ද මං කියන්නෙ?" රියදුරා සන්සුන් කරුණාවන්ත හඬකින් පැවසීය.

වෙහෙස නිසා ම නිදිකිරා වැටෙන අසේලට සිය පිය වූ දෑස තුළ මැවී පෙනෙන ගිනිගන්නා හෝටලයත්, එතුළ සිට නොසෙල්වී තමා දෙස බලා සිටිනා මිනිස් රූප දෙකත් යළි කිසි දිනෙක නොමැකෙනා මතකයක් වන බව අවබෝධ විය.

- අනුෂ්ක තිලකරත්න [toanushka@gmail.com]

මාත් එක්ක මා විතරක්ම...

කිසිවෙක් නොදැන රහසේම පිටවෙන්න
නාඳුනන මුහුණු මැද අතරමං වෙන්න
පිළිතුරු නොබැඳ බිඳක් තනිවෙන්න
මගෙත් එක්ක මම විතරක්ම ඉන්න

ඉඳ හිට දවසක රෑ අහසේ තරු බලන්න
හුලං පොදක් ඔහේ ඇඟ දැවටෙන්න
පොද වැස්සක ලාවට ටිකක් තෙමෙන්න
මගෙත් එක්ක මම විතරක්ම ඉන්න

නොපෙනෙන ඉසව්වක නොපෙනී ඉන්න
හුදෙකලාවේ රස මාත් එක්ක විඳින්න
ජීවත්වෙන බව මොහොතකට දැනෙන්න
මගෙත් එක්ක මම විතරක්ම ඉන්න

- තිමාලි ද සිල්වා

තාත්තේ!

ඔබේ දහඩිය, කඳුළු පොහොරවැ
වැඩුනු ගස් දැන් පල දරා ඇත
තාත්තේ ඔබ නැතත් දැන් මෙහි
ඔබේ දහඩිය සුවඳ තව ඇත!

ඔබෙන් ලද සිප් කිරෙන්
පොහොණිවැ
ඔබේ දරුවන් ලොව දිනා අද
කියා නිමකළ නොහැක අපහට
තාත්තේ ඔබෙ මහරු ගුණකඳ!

- ජයන්ත මිහිඳුකුලසූරිය
[jayanthamihindu@gmail.com]

මිහිරියේ දනිමි නුඹ එන බව

මිහිරියේ නුඹ කොයිබ ද
තරු වියන පීරමි
සොයා නුඹෙ සඳවත
දෑස කුමට ද මට
සැඟවෙනා විට සියපත

නෑසෙනා නුඹෙ කිකිණි හඬ
කුමට මේ දෙසවන මට

නුඹේ ඩා බිඳු වැළඳ
සුවඳ විලවුන් කිති කවයි හද
නොයන් මා හැර ඈතට
කෙලෙස උසුලමි ඒ දුක

හිඳගනිමි භාවනාවට
දමමි සිත දොරගුළු
දමා අරමුණු එළියට

දොරගුළු බිඳ ඇසිල්ලකට
හෙමිහිට ඇතුළුවෙයි
හද ගැබට
නුඹ පෙනේ, නුඹ ඇසේ
මිහිරියේ නුඹ දැනේ මට

නුඹ එනවිට ම
දනිමි නුඹ එන බව
දනිමි මම දැන් මිහිරියේ

තවත් නෑ මගෙ හිත බර
සිත පාව යයි නවාතැනකට
නිසසල
අපරිමිත ප්‍රීතිය පමණි
නොමැත සැප දුක එකට

- චන්ද්‍රවංශ ඥානසේකර සහ නිර්නාමික
[cguoc.gnana@yahoo.co.uk]

සංනිවේදන ඉතිහාසය කවියෙන්

බුදු බණකින් තමයි ලොව මුල් පොත සැදුනේ

ලොව මුද්‍රණය වූ පළවෙනි පොත සොයන
මෙහෙයුම ඇරඹුණා සිසිලට කවි ලියන
ඔබ අප පැමිණි මග සටහන් රස විඳින
මොහොතේ උතුම් බව සිහිවෙයි කවි ලියන

ලොව ඇති බොහෝ දේ මුල ලෙස ලොව සිටින
"චීනුන් හපන්නු ය" යනුවෙන් අප කියන
අටසිය හැටඅටක් වසරින් කිතු උපත
චීනෙන් බිහි වුණා පළවෙනි පොත දකින

සිරියේ ඩයිනෙස්ටි "යිස්ඔන්" මහරජු ය
චීනය පුරා පැවතුණ දම බුදුදම ය
"සුත දියමන්ති" ලොව බිහිවුණු මුල් පොත ය
ලී අච්චුවේ කළ අකුරින් සැකසුනි ය

පිටුවෙන් පිටුව පෙරලන්නට නොව තිබුණේ
රෝලට එතුන පොඩි පිටු ඒ පොත තිබුණේ
අපටත් දකින්නට ඒ පොත ලොව තිබුණේ
බුදුබණකින් තමයි ලොව මුල් පොත සැදුනේ

- **නිමල් සේදර** [nimalsedera@yahoo.com] (image: wikipedia)

මහජන නියෝජිත ගුණවත්

නියෝජිත මහජන
පෙර මග පත් කිරීමට
යුතුයි හඳුනාගන්නට
නැණ ගුණ පමණ ඔහු සතු

සෘජුබව සත්‍යවාදීබව
අතිමානයෙන් තොරබව
ගුණමකු නොවනබව

නුවණැසින් යුතු බව
නායකත්වයෙන් යුතුබව
මේවා ය ගුණයන් ඔහු සතු

දැනගන්නට වටහාගන්නට එවන්
විය යුතුයි නුවණක් අප වෙතින්
ලබා දෙන්නට පෙර ඡන්දයක් අප වෙතින්

- **කළණ දිසානායක** [kalanadsl@gmail.com]

දැන්වත් නිවන්න

පිනි බිඳකිය කියා
තණපත් අග
ජීවිතය

දුගී බත් පතෙන්
කහට උගුරෙන්
රැස් කරත් ඉසුරු

ගොඩනගත් මෙබිම
තව්තිසාවක්
ඔවුන්ටම වෙන්වූ

හත්මුතු පරපුරම
එතෙර කර
එ'සුරපුරට

සාදයෙහි ඉපිලෙන
මිනිසුනි අසන්න
විදු ලොවෙහි තතු

දියවෙලු ග්ලැසියර
නැතිගෙන සයුර
හැකිද වළකන්න

නිරුදක කාන්තාර
පොරවයි ලු හරිත සළු
මියයාවි ලු වන උයන්

වේද ගැලවුමක්
නුඹලාගෙ පුරවරට
නැතිද ඉසිඹුවක් දිවියට?

- රුවන්මලී දීපිකා කොඩිකාර
[ruwanmalekodikara@gmail.com]

හිරු සැඳෑ සක්මන

රත් පැහැය තවරා
අවරදිග අහස් ගැබ
හෙන්දිරික්කා මල් යාය
පුබුදුවා වැට අයිනේ
හිරු සැඳෑ සක්මනේ

කැඳලි වෙත පියඹාන
විහග ගී නාද මැද
සිසිල් සුළඟේ දැවටී
ගිලිහෙනා පත් මතින්
හිරු සැඳෑ සක්මනේ

නිමාකර මෙහෙවර
ඉසිඹුවක් සොයාගෙන
තිමිරයේ සළු අරන්
හිරු සැඳෑ සක්මනේ

- අමිතා පද්මකුමාරි
[amithapadamakumari@gmail.com]

සිත සහ ගත

ගත: සිත නුඹ සුළඟ වැනිය
එකදු මොහොතක් නොරැඳේ එකතැන
නුඹ අතින් නොකැඩී සුරකුනු
එකදු එක දුසිරුතක් නැත

සිත: ගත නුඹ රකින් ඒ සැම
දුෂ්‍යමානව උපන් පාපෙන්
මා දෙස නොවේ ලෝකයා
නුඹ දෙසයි බලා ඉන්නේ

- රංජිත් කිරිඇල්ල [ran.kiri60@gmail.com]

කිඹුලාවල: දියවන්නාව පේන මායිමේ



කිඹුලාවල ලස්සන ඇවිදින මංතීරුවේ, බරිස් පලෙවොයි ගේ පියාඹන වීරයා පාට අඳින්න බැරි නාදළුවලට වෙනස්, ලස්සනට රතුවෙච්ච කුඹුක් කොළේට, එයාගේ පුංචි කාලේ ගැන කියල දෙනවා. කාලෙකින් වැලිකැට පෙරලා පෙරලා හෝ-හූ ගාලා සද්දේ දාගෙන දියවන්නා ඔයට කුඹුර අයිනෙන් යන වතුර පාරත් එක්ක ඔච්චම් කර කර මං අලුත් කකුල් දෙකෙන් ඔපීසියට යන්න ගත්තම තමයි ඉතින් දැක්කේ, තාමත් කොක්කු හිටගෙන ඉන්නේ තනි කකුලෙන් ය කියලා. කොක්කුත් අපි වගේම තමයි. මහා දවල් අච්චර සැරදාගෙන ඉර බලාගෙන හිටියත් දියවන්නා ඔයේ මාළු හොරකං කරන එක නම් නවත්තන්නේ නෑ.

කොහොමත් ඔය එක එක කොළ ජාති ඉදීගෙන ඇවිල්ලා රතුපාට, කහපාට, කොළපාට, දුඹුරුපාට කලවම් කරලා මයිකල් ආන්ජලෝ පරද්දන චිත්‍ර අඳින්නේ කොහොමද කියල බලන්න වෙලීගෙන යන මගේ පුංචි හිත තාමත් කැමතියි.

ඇටමැස්සෝ වගේ මිනිස්සු හනි හනිකට ආඩම්බරෙන් අලුතෙන් ම ගත්තු කකුල් දෙකෙන් වැඩට යන හැටි හරිම ලස්සනයි. මාත් ඉතින් වෙසක් මාසේ අලුත්ම කකුල් දෙකක් හම්බුවෙච්ච හින්ද ආඩම්බරෙන් එක පැත්තක රුසියානු ස්ටෙප්ස් තනබිමක් අයිනෙන් දාංගලේ යන මාළු ලගින ඇලත්, අනිත් පැත්තේ මැයි ගස් වැටියත් මැද්දෙන් දිව්‍යලෝකේ යන නන්දකුමාරය වගේ ඔහේ පාවෙවී යනවා.

පුංචි ඇනා කැරනිනා කොණ්ඩ කරල් දෙකත් හොල්ල හොල්ල කොක්කුන්ට කියන්නේ, එයාගේ තාත්තා හැරී පෝටර්ගේ ආච්චිගේ කොස්සේ නැගලා මොන්ටිසෝරි ගිය නිසා අම්මට ගේ අතුගාන්න බැරිවෙලා ඊයේ ගෙදර වෙච්ච සංගෙඩිය. ඉතිං මටත් ඕවා අහගෙන ඔපීසියට යන්න පරක්කු උනත්, පෙරේදා රෑ හම්බුවෙච්ච තිත්ත පැටව් රංචුව හෙව්වේ, අපේ පුංචි කුමාරයා ඊයේ රෑත් අලුත් කකුල් දෙකෙන් ගිහින් තනි කකුලෙන් ඉන්න කොක්කු ටික බලන්න කියලා කරපු යුද්දේ ගැන කියන්න. ඒත් උන් රිදීපාට ගාපු සයිකල් ලේන් එක ගාවින් ජෙෆ්රි බාවා සීයාගේ මාලිගාව පැත්තට ගිහින් ප්ලේන්ටියක් බොනවා ඇති.

රෝස පාට ඕලු මල්වලට රිදෙන්න ලොකු බර වතුර බිංදු කිලෝමීටර් ගානක් උඩ ඉඳන් වැටෙනකොට ඕස්ට්‍රේලියාව, එංගලන්තය වගේ රටරටවල් බලාගෙන එනවා ඇති. ඉස්සර දුඹුරු පාට කියල හිතන් හිටපු, දැන් අළු කොළපාට, තැඹිලි රෝසපාට, සුදු දුඹුරුපාට, රතු කොළපාට පාට ගොන්නක් හංගාගෙන ඉන්න ආඩම්බරකාර කුඹුක් ගස්ගොන්නට උනත් ඒබ්‍රහම් සීයාගේ රැවුළ ඇඳපු කොළ ටිකක් අරන් එන්න කියල ඇමෙරිකාව පැත්තෙන් එන වැහි වලාකුළුවලට ඉමොජි එකක් යවන්න යුතුකමක් තියනවා නේද කියල ම යි මට නම් හිතෙන්නේ.

පැස්ටල් කූරුවලින් ගස්වල කොළ, කොළපාටට පාට කරන්න කියලා, රතුපාට බස් එකේ ගිහින්, කලුපාට ලොකු පාර හරහා ඇඳපු කහපාට ඉරි දිගේ පනින චිත්‍ර සර් කිව්වේ ඇයි කියල මං තාමත් කල්පනා කරනවා.

- **අසංක ලක්නාථ** [laknatha@laknatha.com]

සිසිල සඟරාවේ පළ වී ඇති ලිපිවල බුද්ධිමය අයිතිය මෙන්ම සහ ඒවායේ අන්තර්ගතතය පිළිබඳ වගකීම ද ඒ ඒ ලේඛකයා සතුවේ. මෙහි පළ වී ඇති ලිපිවලින් සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදයේ අදහස් නිරූපණය නොවෙන බව කරුණාවෙන් සලකන්න.

The intellectual property of the articles published in Sisila magazine remains with the respective writers. Writers are also responsible for the content of the articles published under their names. Please also note that articles published in Sisila do not represent the views of the Writers Guild of Sinhalese Cultural Forum of NSW Inc.

පේස්තරයගෙ කතන්දර

-විදූෂක

ගැණුන්ගේ තන සහ සාහිත්‍යය





ඔය මාතෘකාවේ තියෙන “තන” යන වචනය දැකපු ගමන් චකිතයක් ඇතිවුණා ද? සමහරු හිතන්නේ “තන” කියන්නේ කුණුහරුපයක් ය කියලා නේ. තන තියා, මං කලින් දවසක මේ කොළමේ ලිව්වා වගේ “පුක” කියන වචනයවත් කුණුහරුපයක් නෙමේ.

නේකඩ් ඒප් (නිරුවත් වානරයා) පොතේ ඩෙස්මන් මොරිස් කියලා තියෙනවා ගැණුන්ගේ තන් සහ තට්ටම අතර නම් සමානත්වයක් තියෙනවා කියලා. ඒ එක්කම තොල් සහ හගමණිය අතරත් සමානත්වයක් තියෙනවා ලු. මොරිස් කියනවා, කාන්තා පක්ෂයේ හොඳින් කැපී පේන ලෙස පරිනාමයෙන් නිර්මාණය වෙලා තියෙන තොල් සහ තන් වලින් කෙරෙන්නේ නිරුවත් වානරයින්ට තට්ටමට සහ හගමණියට කෙරෙන ආරාධනාවක් ලු.

තොල් රතු කරන්න, තන් ඉලිප්පෙන්න කෝර්සට්, බොස්තරුක්ක වගේ ඇඳුම් අඳින්න ගැණු පෙළඹෙන්නේ ඒ නිසා වෙන්නැති!

දැන් අර “තන” යන වචනය නරක එකක් ය කියන අය හිතනවා ඇති ඒ වෙනුවට “පියයුරු” කියන්නේ නැත්තේ ඇයි කියලා.

නමුත් මේ කවිය බලන්න.

සිසිවන උවන ඉඟ සුඟ ගත හැකි මිටින
නිසි පුළුලුකුල රිය සකයුරු තිසර තන
දිසි රණ ලියෙව් රූ සිරි යුත් මෙපුරඟන
ඇසි පිය හෙලන පමණින් නොවෙති දෙවඟන

ගැණුන් ගේ සිරුරේ කොටස් හොඳ හොඳ උපමා යොදමින් විස්තර කරලා තියෙන්නේ තොටගමුවේ ශ්‍රී රාහුල කියන හාමුදුරුවෝයි.

ඔය කවිය එන "සැළලිහිණි සංදේශය" කියන්නේ කවි සීයක විතර පොඩි පොතක් වුණාට සිංහල සාහිත්‍යයේ එන උසස්ම කෘතියක් විදියට සැලකෙන එකක්. කොච්චර උසස් පොතක් ද කියනවා නම්, ඒ පුංචි කවි පොත ගැන තව පොත් සීයක් විතර ලියවිලා ඇති මේ වෙනකොට. ඔය කියන තිසර තන කවියත් දස දහස් වාරයක් උපුටා දැක්විලා ඇති විවිධ ලේඛනවල එදා සිට අද දක්වා.

හාමුදුරුවෙකුට හොඳ නං තන කියලා ලියන්න මං වගේ පෘතග්ජනයෙක් ඒක ලිව්වා කියලා මං පාරාජිකා වෙන්න විදියක් නැනේ!

මං මේ කෙටි ලිපිය ලිව්වේ සැප්තැම්බර් මාසයට යෙදෙන ලංකාවේ සාහිත්‍ය මාසය වෙනුවෙනුයි.

ගැණුන්ගේ තනයි, තොලුයි, උකුලයි, හගමණියයි සාහිත්‍ය මාසෙට සම්බන්ධ වෙන්නේ මං සඳහන් කරල තියෙන ඩෙස්මන් මොරිස් ගේ නිරුවත් වානරයා (පරිවර්තනය එස් එම් බන්දුසීල) සහ තොටගමුවේ ශ්‍රී රාහුල ගේ සැළලිහිණි සංදේශය (විවරණ සහිත පොතක් ගන්න) කියන ග්‍රන්ථ දෙක හරහායි.

මේ වෙනකොටත් කියවලා නැතිනම් ඔය පොත් දෙක අපි අනිවාර්යෙන් ම කියවිය යුතු පොත්.

- විදූෂක

ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් ප්‍රාන්තයේ සංස්ථාපිත සිංහල සංස්කෘතික ගමුවේ ලේඛක සංසදය වෙනුවෙන් ග්ලෙන්මෝ පාර්ක්හි පදිංචි රසික හරිශ්චන්ද්‍ර සූරියආරච්චි විසින් සංස්කරණය කර 2024 නොවැම්බර් මස පළමුවෙනි දින ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඔස්සේ බෙදා හරින ලදී.

Edited and distributed by Rasika Harischandra Suriyaarachchi of Glenmore Park, New South Wales, Australia, on behalf of the Writers Guild of the Sinhalese Cultural Forum of NSW Inc on 1 November 2024.